# ආර්ථික සංගණනය 2013/ 14 - ශ්‍රී ලංකාව

## කෘෂිකාර්මික කටයුතු පිළිබඳ ගණන් ගැනීම

# කුඩා ගොවි කාණ්ඩ පිළිබඳ
# ගාල්ල දිස්ත්‍රික්කයේ මූලික වාර්තාව

(භූමියේ ප්‍රමාණය පර්චස් 40ට වැඩි හෝ
නිෂ්පාදනයේ වැඩි ප්‍රමාණයක් අලෙවි කරන ගොවි කාණ්ඩ)




**ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව**

ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය

# කුඩා ගොවි කාණ්ඩ අංශය පිළිබඳ මූලික වාර්තාව

## ගාල්ල දිස්ත්‍රික්කය

ආර්ථික සංගණනය 2013/14

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය

# පෙරවදන

ශ්‍රී ලංකාවේ ආර්ථිකයෙහි ඇතිවී ඇති ප්‍රවණතා සැලකිල්ලට ගනිමින් සංගණන ඉතිහාසයේ ප්‍රථම වරට 2013/14 වර්ෂවලදී ආර්ථික සංගණනයක් පැවැත්වීමට කටයුතු සම්පාදනය කරන ලදී. මෙම සංගණනය ආර්ථිකයේ ප්‍රධාන අංශයන් වන කෘෂිකාර්මික, කර්මාන්ත, වෙළෙඳ හා සේවා යන සියළුම අංශ ආවරණය කෙරෙන පරිදි පැවැත්විණ. මෙම සංගණනය අදියර හතරකින් සිදු කරන ලද අතර, ප්‍රථම අදියර යටතේ සියළු වතු (අක්කර 20ට වැඩි) ලැයිස්තු ගත කරන ලදී. එය 2013 ජූලි මාසයේදී සිදු කළ අතර, දෙවන අදියර යටතේ කර්මාන්ත, වෙළෙඳ හා සේවා කටයුතුවල නියුතු සියලුම ආර්ථික ඒකකයන් 2013 සැප්තැම්බර්-ඔක්තෝබර් මාසවලදී ලැයිස්තු ගත කරන ලදී. තෙවන අදියර යටතේ කුඩා ගොවි කාණ්ඩ (අක්කර 20ට අඩු) හා වතු පිළිබඳ විස්තරාත්මක තොරතුරු රැස් කරන ලද අතර, එය 2014 ජුනි-අගෝස්තු මාසවලදී සිදු කරනු ලැබිණි. සිවුවන අදියර යටතේ ලැයිස්තුගත කර්මාන්ත, වෙළෙඳ හා සේවා ආයතනවලින් තෝරාගත් නියැදි ආයතනවලින් විස්තරාත්මක තොරතුරු රැස් කරන ලද අතර, එය 2014 නොවැම්බර්-දෙසැම්බර් මාසවලදී සිදු කරනු ලැබිණි.

මෙහි ඇතුළත් වන්නේ ගාල්ල දිස්ත්‍රික්කයේ කුඩා ගොවි කාණ්ඩ අංශයේ පර්චස් 40 ට වැඩි බිම් ප්‍රමාණයක් සහිත කුඩා ගොවි කාණ්ඩ හෝ නිෂ්පාදනයෙන් වැඩි කොටසක් විකිණීම සඳහා වූ ආර්ථික ක්‍රියාකාරකම්වල නිරත කුඩා ගොවි කාණ්ඩවල තොරතුරු විශ්ලේෂණයෙන් පිළියෙල කරන ලද වාර්තාවකි. කුඩා ගොවි කාණ්ඩ පිළිබඳ විස්තරාත්මක තොරතුරු රැස් කිරීමේ අදියර සාර්ථක කර ගැනීම සඳහා දෙපාර්තමේන්තුවේ මෙන්ම දෙපාර්තුමේන්තුවෙන් පරිබාහිර වෙනත් රජයේ නිලධාරීන් ද සහභාගි කර ගන්නා ලදී.

ආර්ථික සංගණනය යටතේ කෘෂිකාර්මික කටයුතු ගණන් ගැනීමේ ක්‍රියාවලිය සම්බන්ධව කටයුතු කිරීම සඳහා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ප්‍රධානත්වයෙන් වූ මෙහෙයුම් කමිටුවක් පිහිටුවන ලදී. මෙම කමිටුවේ දායකත්වය කුඩා ගොවිකාණ්ඩ පිළිබඳ විස්තරාත්මක තොරතුරු රැස් කිරීමේ ක්‍රියාවලිය සාර්ථක කර ගැනීමට ඉවහල් විය.

කුඩා ගොවි කාණ්ඩ පිළිබඳ තොරතුරු රැස් කිරීමේදී, අධීක්ෂණ නිලධාරීන් ලෙස කටයුතු කළ ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය සංවර්ධන නිලධාරීන්, කෘෂිකර්ම උපදේශකවරු, කජු සංවර්ධන නිලධාරීන්, පොල් සංවර්ධන නිලධාරීන්, අපනයන කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරීන්, සත්ත්ව නිෂ්පාදන පරීක්ෂකවරු ඇතුළු අනෙකුත් නිලධාරීන්ට ද ගණන් ගන්නා නිලධාරීන් ලෙස කටයුතු කළ කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරීන්, ග්‍රාම නිලධාරීන්, සංවර්ධන නිලධාරීන් ඇතුළු අනෙකුත් රජයේ නිලධාරීන්ට ද තොරතුරු ලබා දුන් කුඩා ගොවි කාණ්ඩවල ගොවි කාරකවරුන්ට ද ලබා දුන් සහයෝගය වෙනුවෙන් ස්තුතිවන්ත වෙමි.

සංගණනය සඳහා දිස්ත්‍රික් මට්ටමින් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් පත් කළ සංගණන කොමසාරිස්, නියෝජ්‍ය සංගණන කොමසාරිස්, සහකාර සංගණන කොමසාරිස්වරුන් සහ දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන කාර්ය මණ්ඩලයෙන් ලබා දුන් අඛණ්ඩ සහායද මෙම අදියර සාර්ථකව අවසන් කිරීමට ඉවහල් විය.

පරිලෝකන කටයුතු සඳහා දායකත්වය ලබාදුන් කෘෂිකර්ම හා පාරිසරික සංඛ්‍යාලේඛන අංශයේ කාර්යය මණ්ඩලය ප්‍රධාන කොට දිස්ත්‍රික්කවල සංඛ්‍යාලේඛන කාර්ය මණ්ඩලයේ නිලධාරීන්ටද ස්තුතිවන්ත වන අතර, පරිලෝකනය කරන ලද දත්ත සංස්කරණය හා නිවැරදි කිරීමේ කටයුතු සිදු කරන ලද කෘෂිකර්ම හා පාරිසරික සංඛ්‍යාලේඛන අංශයේ ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥවරුන්,

සංඛ්‍යාලේඛනඥවරුන්, සංඛ්‍යාලේඛන නිලධාරීන්, සංඛ්‍යාලේඛන සහකාර නිලධාරීන්, සංවර්ධන නිලධාරීන් සහ තොරතුරු තාක්ෂණ හා සන්නිවේදන සහකාර නිලධාරීන් ද තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශයේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් අයි.ඒ.එම්.ප්‍රනාන්දු මහත්මියගේ මඟපෙන්වීම යටතේ සහාය ලබාදුන් අධ්‍යක්ෂ පී. එම්. ආර්. ප්‍රනාන්දු මහතා ඇතුළු කාර්යය මණ්ඩලයට ද ස්තුතිවන්ත වෙමි.

කුඩා ගොවි කාණ්ඩ අංශය පිළිබඳ තොරතුරු රැස් කිරීමේ අදියරේදී එක් රැස් කළ තොරතුරු ඇසුරෙන් මෙම වාර්තාව සකස් කිරීමේ කටයුතු අතිරේක අධ්‍යක්ෂ ජනරාල් පී. එම්. පී. අනුර කුමාර මහතාගේ අධීක්ෂණය යටතේ කෘෂිකර්ම හා පාරිසරික සංඛ්‍යාලේඛන අංශයේ අධ්‍යක්ෂ ඒ.එම්.යූ.අලහකෝන් මහතාගේ සහ නියෝජ්‍ය අධ්‍යක්ෂ කේ. පී. කේ. දිසානායක මහතාගේ මග පෙන්වීම යටතේ කෘෂිකර්ම හා පාරිසරික සංඛ්‍යාලේඛන අංශයේ නිලධාරීන් විසින් සිදු කරන ලදී.

එමෙන්ම මෙම වාර්තාව සාර්ථකව නිම කිරීම සඳහා මුල් කවරය නිර්මාණය කර ලබාදුන් සංඛ්‍යාලේඛනඥ ලක්මාලි ජයරත්න මහත්මියට මාගේ කෘතඥතාව පලකරනු කැමැත්තෙමි.

මෙම වාර්තාවේ ඇතුළත් කරුණු කුඩා ගොවි කාණ්ඩ පිළිබඳව තොරතුරු භාවිතා කරන්නන්ට ප්‍රයෝජනවත් වනු ඇතැයි විශ්වාස කරමි.

ආචාර්ය ඒ.ජේ. සතරසිංහ
ජනලේඛන හා සංඛ්‍යාලේඛන අධ්‍යක්ෂ ජනරාල්

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
නො. 306/71, පොල්දූව පාර,
බත්තරමුල්ල.
2017.11.09

# පටුන

පිටු අංකය

පළමු පරිච්ඡේදය - හැඳින්වීම 01

1.1 පසුබිම 01

1.2 සංගණන ඉතිහාසය 01

1.3 අරමුණ 02

1.4 තොරතුරු රැස්කිරීමේ ක්‍රියා පිළිවෙල 02

1.5 කෘෂිකාර්මික තොරතුරුවල ප්‍රයෝජන 02

1.6 ගණන් ගැනීමේ අදියර 03

1.7 මෙහි අඩංගු සංඛ්‍යාතීන් 03

1.8 ආවරණය 03

දෙවැනි පරිච්ඡේදය - සංකල්ප හා අර්ථ දැක්වීම 04

2.1 ආර්ථික සංගණනය 04

2.2 ආර්ථික සංගණනයේ කෘෂිකාර්මික කටයුතු පිළිබඳ ගණන් ගැනීම 04

2.3 සංගණන කාණ්ඩය 04

2.4 නිවාස ඒකකය,සමූහ වාසස්ථානය,වාසය සඳහා නොවන ස්ථානය 04

2.5 ගෘහ කාණ්ඩය 05

2.6 ගොවිකාරකයා,උප ගොවිකාරකයා 05

2.7 කාරක තත්ත්වය 07

2.8 ගොවි කාණ්ඩය 08

2.9 භුක්තිය 08

2.10 බිම් කැබැල්ල 09

2.11 ගොවි කාණ්ඩයේ මුළු බිම් ප්‍රමාණය 10

2.12 ශුද්ධ බිම් ප්‍රමාණය, දළ බිම් ප්‍රමාණය 10

2.13 ගෙවත්ත 11

2.14 කෘෂිකාර්මික වැඩ කටයුතු 11

2.15 කුඩා ගොවි කාණ්ඩය 12

2.16 යොමු කාලය 12

2.17 "වත්ත " අර්ථ දැක්වීම 12

2.18 "උප කොටස" අර්ථ දැක්වීම 13

**තෙවන පරිච්ඡේදය - කුඩා ගොවි කාණ්ඩ අංශය** 14

3.1 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ස්ත්‍රී/පුරුෂ භාවය අනුව ගොවිකාරකයින් සංඛ්‍යාව - 2014 14

3.2 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් අධ්‍යාපන සුදුසුකම් හා ස්ත්‍රී / පුරුෂ භාවය අනුව ගොවිකාරකයින් සංඛ්‍යාව- 2014 16

3.3 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් වයස් කාණ්ඩය හා ස්ත්‍රී / පුරුෂ භාවය අනුව ගොවිකාරකයින් සංඛ්‍යාව- 2014 19

3.4 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් බිම් කැබලි ගණන සහ ස්ත්‍රී / පුරුෂ භාවය අනුව ගොවිකාරකයින් සංඛ්‍යාව- 2014 21

3.5 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් වගකීම් දරණ බිම් ප්‍රමාණය හා ස්ත්‍රී / පුරුෂ භාවය අනුව ගොවිකාරකයින් සංඛ්‍යාව- 2014 23

3.6 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ගොවිකාරකයින් සංඛ්‍යාව සහ වගකීම් දරණ බිම් ප්‍රමාණය (අක්කර) - 2014 25

3.7 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් කාරක තත්ත්වය අනුව ගොවිකාරකයින් සංඛ්‍යාව හා ගොවි කාණ්ඩ වල බිම් ප්‍රමාණය (අක්කර) - 2014 27

3.8 ගොවි කාණ්ඩයේ විශාලත්වය සහ කාරක තත්ත්වය අනුව ගොවිකාරකයින් සංඛ්‍යාව හා ගොවි කාණ්ඩ වල බිම් ප්‍රමාණය (අක්කර) - 2014 29

3.9 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ස්ත්‍රී / පුරුෂ භාවය අනුව කෘෂිකාර්මික කටයුතුවල නිරත ගොවිකාරකයින් සංඛ්‍යාව- 2014 30

3.10 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ස්ත්‍රී / පුරුෂ භාවය අනුව කෘෂිකාර්මික කටයුතුවල නිරතව සිටි ගොවිකාරකයින් සංඛ්‍යාවෙහි ප්‍රතිශතය - 2014 34

3.11 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් කෘෂිකර්මාන්තය හැර වෙනත් ආර්ථික කටයුත්තක නිරත ගොවිකාරකයින් සංඛ්‍යාව- 2014 36

3.12 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් වෙනත් රැකියාවන් සහ ආදායම් මාර්ග හා ස්ත්‍රී / පුරුෂ භාවය අනුව ගොවිකාරකයින් සංඛ්‍යාව- 2014 38

3.13 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් වෙනත් ආර්ථික කටයුත්තක/කටයුතුවල නිරත වන කාලය අනුව ගොවිකාරකයින් සංඛ්‍යාව- 2014 43

3.14 ගාල්ල දිස්ත්‍රික්කයේ ගොවිකාරකයින් සතු වෙනත් දිස්ත්‍රික්කවල පිහිටි බිම් කැබලි සංඛ්‍යාව සහ බිම් ප්‍රමාණය (අක්කර) - 2014 45

3.15 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් බිම් කැබලි ගණන අනුව ගොවිකාරකයින් සංඛ්‍යාව- 2014 47

3.16 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ගොවි කාණ්ඩ වලට අයත් බිම් ප්‍රමාණයෙහි විශාලත්වය අනුව ගොවි කාණඩ සංඛ්‍යාව හා බිම් ප්‍රමාණය (අක්කර) - 2014 48

# පළමු පරිච්ඡේදය

## 1. හැඳින්වීම

### 1.1 පසුබිම

සංවර්ධන දර්ශකයන් පුළුල් පරාසයක් ඔස්සේ පැතිර ඇති මෙම කාල වකවානුව තුළ 2013/14 වර්ෂයන් කේන්ද්‍ර කර ගනිමින්, ජාතික වැදගත්කමකින් යුතු ආර්ථික සංගණනයක් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් පළමුවරට,මේ වන විට පවත්වා අවසන් කොට ඇත.

මෙම ආර්ථික සංගණනය, සාමාන්‍යයෙන් ජන හා නිවාස සංගණනයට අනතුරුව පැවැත්වෙන කෘෂිකර්ම සංගණනයත් කර්මාන්ත සංගණනයත් යන සංගණන දෙකෙහි එකතුවකි. ආර්ථිකයේ ප්‍රධාන අංශයන් වන කෘෂිකර්ම, කර්මාන්ත,වෙළෙඳ හා සේවා යන අංශ ආවරණය කරමින් පවත්වන ගණන් ගැනීමේ කටයුතුවලදී කෘෂිකර්ම අංශයේ තොරතුරු ලබා ගැනීම සඳහා ප්‍රශ්නාවලි කිහිපයක් භාවිත කරමින් එය වෙනම කොටසක් වශයෙන් සිදු කෙරිණි. ඒ අනුව, ආර්ථික සංගණනය 2013/14,“කෘෂිකාර්මික කටයුතු පිළිබඳ ගණන් ගැනීම” සහ “කර්මාන්ත, වෙළෙඳ හා සේවා පිළිබඳ ගණන් ගැනීම” ලෙස කොටස් දෙකකින් යුක්තය.

### 1.2 සංගණන ඉතිහාසය

මෙතෙක් ශ්‍රී ලංකාවේ කෘෂිකර්ම තොරතුරු රැස්කර ගැනීම සඳහා සංගණන විවිධ ස්වරූපයෙන් සිදු කර ඇත. 1921 දී පවත්වා ඇති නිෂ්පාදන සංගණනය කෘෂිකර්ම සංගණන ඉතිහාසයේ හමුවන පළමුවන ගණන් ගැනීමයි. අනතුරුව 1924 හා 1929 වර්ෂවලදී තවත් අර්ධ සංගණන දෙකක් පවත්වා ඇත. එකී සංගණනයන්හි විශේෂ ලක්ෂණයක් වූයේ වගා කළ ඉඩම් ප්‍රමාණය, සත්ත්ව සංඛ්‍යාති, නිෂ්පාදන ප්‍රමාණය ගම් මට්ටමින් එක් රැස් කිරීමයි. එමෙන් ම 1946, 1952, 1962, 1973, 1982 සහ 2002 යන වර්ෂවලදී පූර්ණ කෘෂිකර්ම සංගණන පවත්වා ඇත. රටේ ඇතැම් ප්‍රදේශවල පැවති අයහපත් වාතාවරණය නිසා 1992 වර්ෂයේදී කෘෂිකර්ම සංගණනයක් පැවැත්වීමට නොහැකි විය.

ජන සංගණනයක් පැවැත්වීමෙන් අනතුරුව එළඹෙන වර්ෂ දෙකේදී කෘෂිකර්ම සංගණනයත් කර්මාන්ත සංගණනයත් පැවැත්වීම සාමාන්‍ය සම්ප්‍රදාය විය. ජන හා නිවාස සංගණනයේදී යොදාගන්නා සංගණන රාමුවම භාවිත කළ හැකි වීම නිසා වියදම අවම කර ගැනීමට ඇති හැකියාව ද සැලකිල්ලට ගෙන වසර 10කට වරක් මෙම සංගණන රටාව අනුගමනය කෙරුණි. කෙසේ වෙතත් මෑත කාලීන ආර්ථික ප්‍රවණතාවයන් ද සැලකිල්ලට ගනිමින්, 2012 වසරේ පැවති ජන හා නිවාස සංගණනයෙන් අනතුරුව, 2013/14 වර්ෂවලදී ආර්ථික සංගණනයේ එක් කොටසක් ලෙස කෘෂිකාර්මික කටයුතු පිළිබඳ ගණන් ගැනීම සිදු කරන ලදී. 2002 වර්ෂයේ පැවති අවසන් කෘෂිකර්ම සංගණනයෙන් පසුව, වසර 12ක පමණ කාලයක් තුළ ශ්‍රී ලංකාවේ ආර්ථිකයට කෘෂිකර්ම ක්ෂේත්‍රයෙන් ලැබී ඇති දායකත්වය ඇගයීම සඳහා මෙම සංගණනය බෙහෙවින් ඉවහල් වනු ඇත.

## 1.3 අරමුණ

කෘෂිකාර්මික කටයුතු පිළිබඳ ගණන් ගැනීම ප්‍රධාන වශයෙන් පහත සඳහන් විෂයයන්ට අදාල ප්‍රමාණාත්මක තොරතුරු රැස් කිරීම මූලික අරමුණු කොට ගනිමින් පවත්වනු ලැබීය.

I. ගොවි කාණ්ඩ
II. ගොවිකාරකයින්
III. ඉඩම් භාවිතය හා භුක්තිය
IV. බෝග වගාව
V. සත්ත්ව පාලනය
VI. ජලජීවී වගාව
VII. පොහොර සහ පළිබෝධනාශක භාවිතය
VIII. කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ භාවිතය හා අයිතිය

## 1.4 තොරතුරු රැස්කිරීමේ ක්‍රියා පිළිවෙල

කුඩා ගොවිකාණ්ඩ අංශය පිළිබඳ තොරතුරු ඒ සඳහා පිළියෙල කරන ලද ප්‍රශ්න මාලාවක් (SH 2) ඇසුරින් රැස්කරන ලදි. ජන හා නිවාස සංගණනයේදී සකස් කරන ලද නිවාස, සමූහ වාසස්ථාන, ආයතන, වාසය සඳහා නොවන ස්ථාන යන ඒකක කරා ගොස් ගණන් ගන්නා නිලධාරීන් ලෙස පත් කරන ලද කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර නිලධාරීන්, ග්‍රාම නිලධාරීන්, සංවර්ධන නිලධාරීන් සහ වෙනත් රජයේ නිලධාරීන් විසින් කුඩා ගොවිකාණ්ඩ අංශය පිළිබඳ තොරතුරු රැස්කිරීම සාර්ථකව සිදු කරන ලදී.

## 1.5 කෘෂිකාර්මික තොරතුරුවල ප්‍රයෝජන

ආර්ථික සංගණනයේ කෘෂිකාර්මික කටයුතු පිළිබඳ ගණන් ගැනීමෙන් ලබාගන්නා වූ තොරතුරු ප්‍රධාන වශයෙන් පහත අවශ්‍යතා සඳහා ප්‍රයෝජනයට ගනී.

I. කෘෂිකර්ම ක්ෂේත්‍රයේ ඇති වී තිබෙන ව්‍යුහාත්මක වෙනස්කම් පදනම් කරගෙන අනාගත කෘෂිකර්ම සැලසුම් හා ප්‍රතිපත්ති සකස් කිරීම
II. දේශීය නිෂ්පාදන ඉහළ නැංවීමෙහිලා කෘෂිකාර්මික ව්‍යාප්ති වැඩසටහන් පිළියෙළ කිරීම
III. ආයාත නිර්යාත ප්‍රතිපත්තිවලට අදාළ තීරණ ගැනීම
IV. ජාතික ගිණුම් සකස් කිරීමට අවශ්‍ය තොරතුරු ලබා ගැනීම
V. ඉදිරි කාලයේ පැවැත්වීමට අරමුණු කර ඇති කෘෂිකර්ම සමීක්ෂණ සඳහා නියැදි රාමුව සකසා ගැනීම

## 1.6 ගණන් ගැනීමේ අදියරයන්

කෘෂිකාර්මික කටයුතු පිළිබඳ ගණන් ගැනීම, අදියර හතරකින් අවස්ථා තුනක දී සිදු වේ.

I. අක්කර 20 ක් හෝ ඊට වැඩි ගොවි කාණ්ඩ එනම් "වතු"ලැයිස්තුගත කිරීම

අක්කර 20 ක් හෝ ඊට වැඩි ගොවි කාණ්ඩ "වතු" ලෙස හඳුනා ගන්නා අතර එම ගොවි කාණ්ඩ E1 උපලේඛනයෙහි ලැයිස්තුගත කරගනී.

II. අක්කර 20 ක් හෝ ඊට වැඩි ගොවි කාණ්ඩ තුළින් විස්තරාත්මක තොරතුරු ලබාගැනීම

සකස් කරගත් E1 උපලේඛනය අනුව සියලුම "වතු" වලින් E2 උපලේඛනය භාවිතයෙන් තොරතුරු රැස්කර ගනී.

III. අක්කර 20ට අඩු කුඩා ගොවි කාණ්ඩ අංශය ලැයිස්තුගත කිරීම

අක්කර 20ට අඩු සහ ඉදිරියේ දී විස්තර කෙරෙන පරිදි කෘෂිකාර්මික ක්‍රියාකාරකම් සිදු කරන ස්ථාන "කුඩා ගොවි කාණ්ඩ" ලෙස හඳුනාගෙන SH1 උපලේඛනයෙහි ලැයිස්තුගත කරගනී.

IV. කුඩා ගොවිකාණ්ඩ අංශයෙන් තොරතුරු ලබාගැනීම

සකස් කරගත් SH1උපලේඛනයෙන් සහ SH2උපලේඛනයෙන් "කුඩා ගොවිකාණ්ඩ" අංශයෙන් තොරතුරු රැස්කර ගනී.

## 1.7 මෙහි අඩංගු සංඛ්‍යාතීන්

මේ යටතේ 2014 වසරේ ගාල්ල දිස්ත්‍රික්කයේ, පර්චස් 40 ට වැඩි බිම් ප්‍රමාණයක් සහිත කුඩා ගොවිකාණ්ඩ හෝ නිෂ්පාදනයෙන් වැඩි කොටසක් විකිණීම සඳහා වූ ආර්ථික කටයුත්තක නියැලෙන ලද කුඩා ගොවිකාණ්ඩ පිළිබඳ රැස් කරන ලද තොරතුරු වල සංඛ්‍යාතීන් අඩංගු වේ.

## 1.8 ආවරණය

මෙවර ආර්ථික සංගණනය යටතේ කුඩා ගොවි කාණ්ඩ අංශය පිළිබඳ තොරතුරු රැස් කිරීම දිස්ත්‍රික්ක 25 ත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 331 ත් ඇතුළත්ව, සමස්ත දිවයිනම ආවරණය වන පරිදි සිදු කරන ලදි.

**සැළකිය යුතුයි :**

**මෙම ප්‍රකාශනය පරිශීලනය කිරීමේදී ප්‍රධාන වශයෙන් මතක තබාගතයුතු කරුණ වන්නේ මෙහි අඩංගු සංඛ්‍යාතීන් ගොවිකාරකයා පදිංචි ස්ථාන පදනම්ව මිස එම ඉඩම් හෝ ගොවිකාණ්ඩවල පිහිටීම මත විග්‍රහ කරන ලද ඒවා නොවන බවයි.**

# දෙවැනි පරිච්ඡේදය

## 2. සංකල්ප හා අර්ථ දැක්වීම

### 2.1 ආර්ථික සංගණනය

ශ්‍රී ලංකාවේ දේශ සීමාව තුළ ක්‍රියාත්මක වන සියලුම ආර්ථික කටයුතුවල නියුතු ඒකකයන් ආවරණය වන පරිදි නියම කරනු ලබන කාලසීමාවක් තුළ කෘෂිකර්ම, කර්මාන්ත, වෙළෙඳ හා සේවා කටයුතුවල තොරතුරු රැස් කිරීම, ගොනු කිරීම, ඇගයීම, විශ්ලේෂණය කිරීම හා ප්‍රකාශයට පත් කිරීමේ හෝ බෙදා හැරීමේ සම්පූර්ණ ක්‍රියාවලිය "ආර්ථික සංගණනය" ලෙස හැඳින් වේ.

### 2.2 ආර්ථික සංගණනයේ කෘෂිකාර්මික කටයුතු පිළිබඳ ගණන් ගැනීම

තොරතුරු එක්රැස් කිරීමේ ඒකකය ලෙස ගොවිකාණ්ඩය පදනම්ව, කෘෂිකාර්මික ව්‍යුහයට අදාළ ප්‍රමාණාත්මක තොරතුරු, එක් වගා වර්ෂයක් තුළදී රාජ්‍ය අනුග්‍රහය සහිතව, දීපව්‍යාප්තව එක්රැස් කිරීමේ ක්‍රියාවලිය "කෘෂිකාර්මික කටයුතු පිළිබඳ ගණන් ගැනීම" ලෙස හැඳින්වේ.

### 2.3 සංගණන කාණ්ඩය

2012 වර්ෂයේ පවත්වන ලද ජන හා නිවාස සංගණනයේදී ග්‍රාමීය ප්‍රදේශවල නිවාස හා ගොඩනැගිලි ඒකක 150ක පමණ ප්‍රමාණයකින් සමන්විත වන පරිදි හා නාගරික ප්‍රදේශවල ඒකක 200ක පමණ ප්‍රමාණයකින් සමන්විත වන පරිදි ස්වාභාවික හෝ මිනිසා විසින් නිර්මාණය කරන ලද මායිම්වලින් වෙන් කොට දැක්වූ භූමි ප්‍රදේශයක් " සංගණන කාණ්ඩය"ලෙස හැඳින්වේ.

### 2.4 නිවාස ඒකකය,සමූහ වාසස්ථානය හා වාසය සඳහා නොවන ස්ථානය

මිනිසුන්ගේ වාසය සඳහා වූ ද වෙනත් වාසස්ථානවලින් වෙන් වූ ද ඇතුළුවීම/ පිටවීම සඳහා වෙනම භාවිතා කළහැකි දොරටුවක් තිබෙන්නා වූ ද ගොඩනැගිල්ලක්, "නිවාස ඒකකය" ලෙස හැඳින්වේ.

නිවාස ඒකකයක් වීමට,

1. මිනිසුන්ගේ වාසය සඳහා වූ ස්ථානයක් වීම
2. වෙනත් ස්ථානවලින් වෙන් වී තිබීම
3. ඇතුළුවීම/ පිටවීම සඳහා වෙනම දොරටුවක් තිබීම යන

ඉහත ලක්ෂණ සියල්ලම සම්පූර්ණ විය යුතුය.

පොදු අරමුණක් වෙනුවෙන් සාමාන්‍යයෙන් එකිනෙකට නෑකමක් නැති පුද්ගලයින් දෙදෙනෙකු හෝ ඊට වැඩි ගණනක් පදිංචිව සිටින ස්ථානයක් ''සමූහ වාසස්ථානය''ලෙස හැඳින්වේ.

නිවාස ඒකකයක් හෝ සමූහ වාසස්ථානයක් හෝ නොවන ගොඩනැගිල්ලක් හෝ ගොඩනැගිල්ලක කොටසක් හෝ ඇතැම්විට ගොඩනැගිලි සමූහයක් ''වාසය සඳහා නොවන ස්ථානය''ලෙස හැඳින්වේ.

## 2.5 ගෘහ කාණ්ඩය

එක් පුද්ගලයෙකු තනිව වෙසෙමින් තමාගේ ආහාර පාන ඔහුම පිළියෙල කර ගන්නේ නම් හෝ පුද්ගලයින් සමූහයක් එකට වාසය කරමින් තමන්ගේ ආහාර පාන එක්ව පිළියෙල කර ගන්නේ නම්, ඔහු හෝ එම පුද්ගලයින් සමූහය ''ගෘහ කාණ්ඩය''ලෙස හැඳින්වේ.

* ගෘහ කාණ්ඩ ඇත්තේ නිවාස ඒකකවල පමණි. සමූහ වාසස්ථානවල සහ වාසය සඳහා නොවන ස්ථානවල ගෘහ කාණ්ඩ නොමැත.

* ගෘහ කාණ්ඩයක සාමාජිකයන් බොහෝ විට එකිනෙකාට නෑකම් ඇති අය වේ. සමහරවිට නෑකම් නැති අය ද සිටිය හැකි ය.

* ගෘහ කාණ්ඩයක සාමාජිකයන් පවුලක් ම විය යුතු නැත. මව්පියන් හා දරුවන් පමණක් නොව පවුලෙන් බාහිර අය ද සිටිය හැකි ය. එනම් නෑදෑයින්, මෙහෙකරුවන් ආදිය යි. ඔවුන් පවුලේ සාමාජිකයින් හා පොදුවේ ආහාරපාන ගැනීම සඳහා කටයුතු සලසා ගෙන ඇත්නම් ඒ සියලු දෙනාම එකම ගෘහ කාණ්ඩයට අයත් වේ.

* කෙසේ නමුත් මෙහි ස්ථිර පදිංචි නැති (පවුලෙන් බාහිර) පුද්ගලයින් ගෘහ කාණ්ඩයේ ස්ථිර පදිංචි පුද්ගල ගණනින් බැහැර කර ඇත.

* සෑමවිට ම නිවාස ඒකකවල පදිංචි පුද්ගලයින් ගණන් ගැනීමේ දී ගෘහ කාණ්ඩ වශයෙන් ගණන් ගත යුතුවන අතර, එක් නිවාස ඒකකයක ගෘහ කාණ්ඩ එකකට වඩා තිබෙන අවස්ථා ද ඇත.

## 2.6 ගොවිකාරකයා, උප ගොවිකාරකයා

- කෘෂිකාර්මික බෝග වගා කිරීම
- මස්, කිරි හෝ බිත්තර නිෂ්පාදනය සඳහා සතුන් ඇති කිරීම
- මිරිදිය/ කිවුල්දිය (කලපු) / කරදිය ජලජීවීන් වගා කිරීම

පිළිබඳ වගකීම් දරමින් එකී කටයුතු එකක් හෝ කිහිපයක් සම්බන්ධව ගෘහ කාණ්ඩය/ ආයතනය (මතු විස්තර කෙරෙන ගොවි කාණ්ඩය) තුළ ප්‍රධාන තීරණ ගන්නා තැනැත්තා ''ගොවිකාරකයා''ලෙස හැඳින්වේ.

මෙහිදී ඔහු / ඇය ඉහත කටයුත්තක් හෝ කටයුතු,

* තමා විසින් කරන්නකු හෝ
* අන් අයගේ සහාය ඇතිව කරන්නකු හෝ

* එම කටයුතුවලට අදාලව කායික වැඩක් නොකර ඒවා මෙහෙයවමින් තීරණ ගන්නා තැනැත්තෙකු හෝ විය හැකි ය.

ඒ අනුව,

* ගොවිකාරකයෙක් ස්වකීය වගා කටයුතු/ සත්ත්ව පාලනය/ ජලජීවී වගාව වෙන් වෙන් වශයෙන් හෝ සියල්ලම හෝ තමාම කරන්නකු විය හැකි ය.
* එසේත් නැතිව කෘෂිකර්මයට අදාළ කායිකව වැඩ නොකර එම කටයුතු මෙහෙයවන්නෙකු පමණක් ද විය හැකි ය.
* ඔහු ඉඩම් හෝ කෘෂිකාර්මික සතුන් හෝ ජලජීවී වගාවන් අයිතිකරුවකු හෝ නොවිය හැකි ය. එනම් හිමිකම කාරකත්වය සඳහා සුදුසුකමක් නොවන අවස්ථාවකි.
* ගොවිකාරකයකු වීමට ඔහු තම ශ්‍රමය යොදා ඉඩම් වගා කිරීම, කෘෂිකාර්මික සතුන්ගේ (කිරි දෙවීම, තණ කැවීම වැනි) එදිනෙදා කටයුතු, ජලජීවී වගාව ආශ්‍රිත එදිනෙදා කටයුතුවල නියැලී සිටීම අවශ්‍ය නොවිය. ඉඩම් වගා කිරීම,සතුන් ඇති කිරීම, ජල ජීවී වගා කටයුතු යන අංශ එකක හෝ කිහිපයක එදිනෙදා තීරණ ගැනීම ප්‍රමාණවත් විය.

- "ගොවිකාරකයා" ගොවි කාණ්ඩයක ප්‍රධානියා ය.
- කෘෂිකාර්මික කටයුතු මෙහෙයවීම පිළිබඳ ප්‍රධාන ආර්ථික හා තාක්ෂණික වගකීම ඔහු සතු ය.

ඒ අනුව,

i. සංගණන ඒකකයක ගොවිකාරකයින් කිහිපදෙනෙක් සිටිය හැකි ය.
ii. එක් ගොවි කාණ්ඩයක සිටිය හැක්කේ එක් ගොවිකාරකයෙකු පමණි.

"උප ගොවිකාරකයා" යනුවෙන් හැඳින්වෙන්නේ තමාගේ ම වැඩ කරන කාරක තත්ත්වයක් සහිත (මතු විස්තර කෙරේ) ගොවි කාණ්ඩයක් තුළ ගොවිකාරකයාට අමතරව එම ගොවි කාණ්ඩය වෙනුවෙන් ම කෘෂිකාර්මික කටයුතු මෙහෙයවීම සඳහා එදිනෙදා තීරණ ගන්නා වෙනත් සාමාජිකයින්ය.

- උප ගොවිකාරකයා ද ගොවි කාණ්ඩයේ කිසියම් කටයුත්තක් හෝ කටයුතු කිහිපයක් සම්බන්ධව සක්‍රීයව තීරණ ගන්නෙකු වේ.
- එහෙත් ඔහු ගොවි කාණ්ඩය පිළිබඳව ප්‍රධාන ආර්ථික හෝ තාක්ෂණික තීරණ ගන්නා නොවේ.
- උප ගොවිකාරකයා ඇතැම් විට ඉඩම් කැබැල්ලක කොටසක්, එක් ඉඩම් කැබැල්ලක්, ඉඩම් කැබලි සියල්ලම හෝ සත්ත්ව පාලන කටයුතු, ජලජීවී වගා කටයුතු මෙහෙය වන්නා විය හැකිය.

ඒ අනුව,

i. උප ගොවිකාරකයින් සිටිය හැක්කේ තමාගේම වැඩකරන කාරක තත්ත්වයක් සහිත ගොවි කාණ්ඩයක පමණි.
ii. තමාගේම වැඩකරන කාරක තත්ත්වයක් සහිත ගොවි කාණ්ඩයක උප ගොවි කාරකයින් කිහිපදෙනෙකු සිටිය හැකි ය.
iii. පවුලේ සාමාජිකයන් කෘෂිකාර්මික කටයුතුවලට උදව් වූ පමණින් ඔවුන්ව උප ගොවිකාරකයින් ලෙස හැඳින්විය නොහැකි ය.
iv. කෘෂිකාර්මික කටයුතු වෙනුවෙන් වැටුප් ලබන සේවකයින් (කම්කරුවන්) උප ගොවිකාරකයින් ලෙස සැළකිය නොහැකිය.

කුඩා ගොවි කාණ්ඩයක ගොවිකාරකයෙකු වීමට කෘෂිකාර්මික නිෂ්පාදනයක් සම්බන්ධ තීරණ ගන්නෙක් විය යුතුම ය. එබැවින් පහත කාර්යයන්හි නිරත වීම ගොවිකාරකයෙකු වීමට සුදුසු කමක් නොවේ.

I. ජංගම පැළ තවාන් කරුවකු ලෙස රථයක/ අට්ටාලයක පැළ වෙළෙඳාම් කිරීම
II. මල්/ විසිතුරු පැළ වගාවෙහි නිරතව සිටීම
III. දැවමය ශාක (වන) වගා කරුවකු වීම
IV. විනෝදාශයක් වශයෙන් සතුන් ඇති කිරීම
V. විනෝදාංශයක් වශයෙන් විසිතුරු මසුන් ඇති කිරීම

## 2.7 කාරක තත්ත්වය

කාරක තත්ත්වය ආකාර 4 කි.

- තමාගේම වැඩ කරන
- වෙනත් අය සමඟ හවුලේ
- පුද්ගලික අය වෙනුවෙන්
- ආයතනයක් වෙනුවෙන්

* එක් ගොවිකාරකයෙකුට මෙම කාරක තත්ත්ව කිහිපයක් යටතේ වෙනස් ගොවි කාණ්ඩ කිහිපයක් තිබිය හැකි ය.

* එනම් කාරක තත්ත්වය වෙනස් වූ විට එය වෙනම ගොවි කාණ්ඩයක් බවට පත් වේ.

- **තමාගේම වැඩ කරන**

වෙනත් කිසිම පුද්ගලයෙකුට හෝ ආයතනයකට වගකීමක් හෝ සම්බන්ධයක් නොමැතිව ගොවි කාණ්ඩයට අදාළ සියලුම තීරණ ගන්නා පුද්ගලයකු එකී ගොවි කාණ්ඩයට අදාළව "තමාගේම වැඩ කරන"කාරක තත්ත්වයක් ඇති ගොවිකාරකයා ලෙස හැඳින්වේ.

* ඔහු/ ඇය කම්කරුවන් හෝ සිය පවුලේ අය කෘෂිකර්ම වැඩ කටයුතු සඳහා යොදාගෙන තිබිය හැකි ය.

* අඳයට, බද්දට හෝ වී පොරොන්දුව පිට වී වගා කරන්නන් ද මේ යටතට ගැනේ.

- **වෙනත් අය සමඟ හවුලේ**

ගොවි කාණ්ඩයේ කටයුතු පිළිබඳ එදිනෙදා තීරණ ගැනීම හා වගකීම් දැරීම තවත් එක් අයකු හෝ කීපදෙනෙකු සමඟ සිදු කරයි නම් එම පුද්ගලයා එකී ගොවිකාණ්ඩයට අදාළව "වෙනත් අය සමග හවුලේ" කාරක තත්ත්වයක් ඇති ගොවිකාරකයා ලෙස හැඳින්වේ.

- **පුද්ගලික අය වෙනුවෙන්**

ගොවි කාණ්ඩයක කළමනාකරුවකු/ පාලකයකු/ භාරකරුවකු වශයෙන් පුද්ගලයෙකු හෝ කීපදෙනෙක් වෙනුවෙන්, වැටුපක්/ ප්‍රතිලාභයක් ලබා ගෙන, වගකීම හා පාලනය දරන්නේ නම් එම පුද්ගලයා එකී ගොවි කාණ්ඩයට අදාළව "පුද්ගලික අය වෙනුවෙන්" කාරක තත්ත්වයක් ඇති ගොවිකාරකයා ලෙස හැඳින්වේ.

- **ආයතනයක් වෙනුවෙන්**

රජයේ හෝ අර්ධ රජයේ හෝ රජයේ අනුග්‍රහය ලබන සංවිධානයක්, පුද්ගලික ආයතනයක් වෙනුවෙන් වැටුප්/ ප්‍රතිලාභ ලබමින් ගොවි කාණ්ඩයක් මෙහෙයවන්නේ නම් එම පුද්ගලයා එකී ගොවි කාණ්ඩයට අදාළව "ආයතනයක් වෙනුවෙන්" කාරක තත්ත්වයක් ඇති ගොවිකාරකයා ලෙස හැඳින්වේ.

## 2.8 ගොවි කාණ්ඩය

එක් ගොවිකාරක තත්ත්වයක් යටතේ කෘෂිකාර්මික නිෂ්පාදන සඳහා සම්පූර්ණව හෝ කොටස් වශයෙන් ප්‍රයෝජනයට ගනු ලබන සියලුම ගොඩ/ මඩ ඉඩම්/ සත්ත්ව පාලන කටයුතු/ ජලජීවී වගා කටයුතු සිදු කරන ඒකක"ගොවි කාණ්ඩය" ලෙස හැඳින්වේ.

මේඅනුව,

* ගොවි කාණ්ඩයක් බිම් කැබලි එකකින් හෝ කිහිපයකින් සමන්විත විය හැකි ය.
* එම බිම් කැබලි එකම පරිපාලන බල ප්‍රදේශයක් තුළ හෝ වෙනස් පරිපාලන බල ප්‍රදේශවල හෝ විසිරී තිබිය හැකි ය.
* ගොවිකාරකයාට එහි අයිතිය තිබිය හෝ නොතිබිය හැකි ය.
* ඒවා නිත්‍යානුකූලව හෝ අනවසරයෙන් වැඩ කරන කැබලි විය හැකි ය.
* ගොවි කාණ්ඩයේ බිම් ප්‍රමාණය (විශාලත්වය) කුමන හෝ ප්‍රමාණයක් විය හැකි ය.
* ගොවි කාණ්ඩයක් මඩ ඉඩම්වලින් පමණක් හෝ ගොඩ ඉඩම්වලින් පමණක් හෝ ගොඩ හා මඩ ඉඩම් යන දෙවර්ගයෙන් ම සමන්විත විය හැකි ය.
* ගොවි කාණ්ඩයක් බෝග වගාවලින් පමණක්, සත්ත්ව පාලනයකින් පමණක්, ජල ජීවී වගා කටයුතුවලින් පමණක් හෝ ඉන් කිහිපයක සංකලනයක් ලෙසින් හෝ සමන්විත විය හැකි ය.

## 2.9 භුක්තිය

කාරකයා ගොවිකාණ්ඩයේ කෘෂිකාර්මික කටයුතු සඳහා භූමිය යොදවා ගන්නා නීත්‍යානුකූල හෝ නීත්‍යානුකූල නොවන ස්වරූපය "භුක්තිය" ලෙස හැඳින් වේ.

කුඩා ගොවිකාණ්ඩ තොරතුරු රැස්කිරීම සඳහා භුක්තිය ආකාර හතකින් දැක්විය හැකි ය.

1) තනි අයිතිය
ගොවිකාරකයාට හෝ ගොවිකාරකයාගේ පවුලේ සාමාජිකයකුට අයිති ඉඩම් මේ යටතට ගැනේ. මේවා ප්‍රවේණි හා සින්නක්කර ඉඩම් වේ.

2) බල පත්‍රයක් යටතේ
බලපත්‍රයක් යටතේ භුක්ති විඳීම යනු එල්.ඩී.ඕ./සී.එල්.ඕ./ එල්.ආර්.සී. දීමනා, ගම් පුළුල් කිරීමේ ව්‍යාපාර, ජනපද ව්‍යාපාර යටතේ රජයෙන් බදු හෝ අවසර පත් ලැබීම මගින් භුක්ති විඳීම සැලකේ.ස්වර්ණ භූමි,ජය භූමි, වැනි වැඩ සටහන් මගින් බලපත්‍ර/ ලබා දී ඇති ඉඩම් ද මෙයට ඇතුළත් වේ.

3) අඳයට/ බද්දට

වගා අස්වැන්නෙන් පංගුවක් හෝ ඒ වෙනුවෙන් මුදල් දීමෙන් වගා කෙරෙන ඉඩම් අඳයට හෝ බද්දට ගත් භුක්ති විඳීමක් ලෙස සැලකේ.

4) හවුල් අයිතිය

හවුල් අයිතියක් ඇති වන්නේ එක් පුද්ගලයෙකුට වඩා වැඩි අයිතිකරුවන් ප්‍රමාණයන් සිටින අවස්ථාවකය. තට්ටු මාරු, කට්ටි මාරු ක්‍රමයට භුක්ති විඳිමින් වගා කරන බිම්ද මේ යටතට ගැනේ.

5) බෙත්ම ක්‍රමය

බෙත්ම ක්‍රමය යනු ගොවි කාණ්ඩ/ වගා බිමට ජලය සැපයීම මත පදනම් වූ ක්‍රමයකි. කිසියම් කුඹුරු යායක කන්නයකදී නිකුත් කරනු ලබන ජල ප්‍රමාණය සීමිත නිසා එම යායේ වගා කරනු ලබන බිම් ප්‍රමාණයට වඩා අඩු බිම් ප්‍රමාණයක් යායට අදාළ ගොවීන් අතර මුල් බිම් ප්‍රමාණයේ අනුපාතයට බෙදා දී බෝග වගා කරනු ලබන විට ඇතුළත් වන භුක්ති ක්‍රමය වේ. මෙහිදී තමාගේ කුඹුරෙන් කොටසක් වෙනුවට වෙනත් අයෙකුගේ කුඹුරකින් කොටසක් ලැබිය හැකි ය.

6) අනවසර

ගොවි කාරකයාට හෝ පවුලේ සාමාජිකයකුට කිසිම අයිතියක් නැතිව භුක්ති විඳින ඉඩම් අනවසර භුක්තිය යටතට ගැනේ. රජයේ බිම්/ රක්ෂිත බිම් ආදිය භුක්ති විඳීම ද මෙයට අයත් වේ.

7) වෙනත්

ඉහත විස්තර කළ කිසිදු කාණ්ඩයකට ඇතුලත් කළ නොහැකි බිම් කැබලි වෙනත් අයුරකින් භුක්ති විඳින යටතට දැක්විය හැකිය.ඒ අනුව මුදලින් හෝ අස්වැන්නෙන් ගෙවීම් නොකර කාරකත්වය දරණ පෞද්ගලික බිම් කැබලි මෙයට ඇතුලත් වේ.

## 2.10 බිම් කැබැල්ල

ගොවි කාණ්ඩයට අයත් බිම් කොටසක්,එම ගොවි කාණ්ඩයට අයත් නොවූ බිමකින්, ජල මාර්ගයකින්, පාරකින්, කැලෑවකින් හෝ වෙනත් භුක්තියක් සහිත ඉඩමකින් සම්පූර්ණයෙන්ම මායිම්ව ඇත්නම් එය“බිම් කැබැල්ල”ලෙස හැඳින්වේ.

* භුක්තිය වෙනස්නම් එකට යාව පිහිටන බිම් කොටස් වෙන වෙන ම ඉඩම් කැබලි ලෙස සැලකේ.
* එකම භුක්තිය යටතේ එකිනෙකට යාව පිහිටි බිම් කොටස් කිහිපයක් එකම කැබැල්ලක් ලෙස සැලකේ.

ඉඩමක ස්වභාවය අනුව හෝ එහි වගා කරනු ලබන බෝග වර්ග අනුව හෝ බිම් කැබැල්ලක් වෙන්කර දැක්විය නොහැකිය.

## 2.11 ගොවිකාණ්ඩයේ මුළු බිම් ප්‍රමාණය

සියලුම වගා කළ හා වගා නොකළ, භෞතික වශයෙන් නිශ්චය කරන ලද බිම් ප්‍රමාණයන්ගේ එකතුව"ගොවි කාණ්ඩයේ මුළු බිම් ප්‍රමාණය" ලෙස හැඳින්වේ.

* ගොවි කාණ්ඩයක් සියලුම ගොඩනැගිලි, ගල්තලා, ලඳු කැලෑ ආදියට යටවී ඇති බිම් ප්‍රමාණයන්ගෙන් ද, වගා කරන ලද හෝ වගා නොකරන ලද ගොඩ හා මඩ ඉඩම්වලින් ද සමන්විත වේ.

* මෙය ගොවි කාණ්ඩයේ "ශුද්ධ බිම් ප්‍රමාණය" ලෙස ද හැඳින් වේ.

මුළු බිම් ප්‍රමාණය සැළකීමේ දී ගොවිකාරකයා විසින් පාලනය හා වගකීම දරන,
- ඔහුටම අයත්,
- අන් අයගෙන් බද්දට ගෙන ඇති,
- වෙනස් භුක්ති ක්‍රමයන් යටතේ ඇති,
- එම ගොවි කාණ්ඩයේ පිහිටි සියලුම ගොඩනැගිලිවලට යටව ඇති,

සම්පූර්ණ බිම් ප්‍රමාණය ඇතුළත් විය යුතු ය.

## 2.12 ශුද්ධ බිම් ප්‍රමාණය, දළ බිම් ප්‍රමාණය

කිසියම් බිම් කැබැල්ලක හෝ ඉඩමක භෞතික වශයෙන් නිශ්චය කරන ලද බිම් ප්‍රමාණය "ශුද්ධ බිම් ප්‍රමාණය" ලෙස හැඳින්වේ.

ශුද්ධ බිම් ප්‍රමාණයක් තුළ බෝගයන් යටතේ වගා කොට ඇතැයි ඇස්තමේන්තු කරන ලද බිම් ප්‍රමාණය "දළ බිම් ප්‍රමාණය " ලෙස හැඳින්වේ.

එහිදී බිම් ප්‍රමාණය නිශ්චය කරනු ලබන්නේ,

- අක්කරයට නියමිත පදනමක් මත වගා කොට ඇති ගස්/ වැල්/ පඳුරු ගණන අනුව හෝ,
- අක්කරයක් සඳහා සාමාන්‍යයෙන් ඒ ඒ බෝග යටතේ වැපිරීම හෝ සිටුවීම සඳහා යොදාගත් බීජ ප්‍රමාණයට අනුරූපී අන්දමින් බිම් ප්‍රමාණය ගණනය කිරීමෙනි.

එහෙත් මෙහිදී,

- බිම් ප්‍රමාණය මිනුම් පටියෙන් මැන නිශ්චය කර නොමැති වීමට පිළිවන.

තවද,

එක් බිම් කැබැල්ලක්/ ඉඩමක් තුළ මිශ්‍ර අන්දමින් බෝග කිහිපයක් වගා කර ඇත්නම් දළ බිම් ප්‍රමාණය වශයෙන් එකී බෝග යටතට ඇස්තමේන්තු කරන ලද බිම් ප්‍රමාණයන්ගේ එකතුව ගත් විට ශුද්ධ බිම් ප්‍රමාණයට සමාන නොවී ඊට අඩු හෝ වැඩි හෝ විය හැකි ය.

## 2.13 ගෙවත්ත

I. පර්චස් 20කට සමාන හෝ ඊට අඩු ඉඩම් කැබැල්ලක ගොවි කාරකයා පදිංචි නිවසක් සහිතව නිවසේ පරිභෝජනය සඳහා හෝ වෙළෙඳපොළ සඳහා කෘෂිකාර්මික නිෂ්පාදනයක් (බෝග වගාව, සත්ත්ව පාලනය, ජල ජීවී වගාව ආශ්‍රිතව) සිදුවේ නම් එය ද,

II. පර්චස් 20 කට වැඩි ඉඩම් කැබැල්ලක ගොවිකාරකයා පදිංචි නිවසක් සහිතව වැඩි ප්‍රමාණයක් නිවසේ පරිභෝජනය සඳහා කෘෂිකාර්මික නිෂ්පාදනයක් (බෝග වගාව, සත්ත්ව පාලනය,ජල ජීවී වගාව ආශ්‍රිතව) සිදුවේ නම් එය ද, "ගෙවත්ත" ලෙස හැඳින්වේ.

පදිංචි නිවසක් සහිත බිම් කැබැල්ලක් ගෙවත්තක් වන සහ නොවන අවස්ථා කිහිපයක් පහත පරිදි පෙන්වා දිය හැකි ය.

| ගෙවත්තක් වීම | ගෙවත්තක් නොවීම |
|---|---|
| 1. ගොවිකාරකයා පදිංචි නිවස සහිත පර්චස් 19ක ඉඩමෙහි තේ වගා කර ඇති අතර දළු අස්වැන්න අලෙවි කරයි. | 1. ගොවිකාරකයා පදිංචි නිවස සහිත පර්චස් 35ක ඉඩමෙහි ලොකු ළූණු වගා කර ඇති අතර නිෂ්පාදනයෙන් වැඩි කොටස විකිණීම සඳහාය. |
| 2. ගොවිකාරකයා පදිංචි නිවස සහිත අක්කර 2ක ඉඩම ස්ථිර බෝග කිහිපයකින් සහ කාලීන බෝග වගාවකින් යුතු වුව ද කෘෂි නිෂ්පාදනයෙන් වැඩි කොටස නිවසේ පරිභෝජනය සඳහාය. | 2. ගොවිකාරකයා පදිංචි නිවස සහිත අක්. 2 ක ඉඩමෙහි ගම්මිරිස්, කෝපි සහ තවත් කාලීන බෝග කිහිපයක් වගා කර ඇති අතර වැඩි කොටස විකිණීම සඳහා වේ. |

(ගොවිකාරකයා පදිංචි නිවසක් නොතිබේ නම් එම බිම් ප්‍රමාණය කිසි විටෙකත් ගෙවත්තක් ලෙස හඳුනා නොගනී.)

## 2.14 කෘෂිකාර්මික වැඩකටයුතු

ගොවි කාණ්ඩයක බෝග වගා කිරීම, කෘෂිකාර්මික නිෂ්පාදන සඳහා සතුන් ඇති කිරීම, ජල ජීවී වගාව යන සෑම කටයුත්තක්ම සහ ඒ හා සම්බන්ධිත කටයුතු"කෘෂිකාර්මික වැඩ කටයුතු" ලෙස හැඳින්වේ.

ඔහුගේ ගොවි කාණ්ඩයට සම්බන්ධව,

- කය වෙහෙසා කරන වැඩ
- ගොවිපලේ සැලසුම් සම්පාදනය / ගිණුම් තැබීම ආදී කාර්යයන්
- ගොවිපලෙන් පිටතදී කෙරෙන රසායනික පොහොර, කෘමි නාශක ආදිය මිලදී ගැනීම හෝ ප්‍රාථමික නිෂ්පාදිත ද්‍රව්‍ය අලෙවි කිරීම ආදිය කෘෂිකාර්මික වැඩ කටයුතු වේ.

## 2.15 කුඩා ගොවි කාණ්ඩය

අක්කර 20ට අඩු බිම් කැබලි සහිත සියලුම කෘෂිකාර්මික ඒකක "කුඩා ගොවි කාණ්ඩය" ලෙස හැඳින්වේ.

## 2.16 යොමු කාලය

තොරතුරු එකතුකර ගැනීම සඳහා පාදක කරගන්නා කාලය ආර්ථික සංගණනයේ "යොමු කාලය ලෙස" හැඳින්වේ.

ආර්ථික සංගණයේ කෘෂිකාර්මික කටයුතු පිළිබඳ ගණන් ගැනීමට අදාල යොමු කාලය ලෙස සාමාන්‍යයෙන් මාස 12 ක කාලසීමාවක් සලකනු ලබයි.

## 2.17 "වත්ත"අර්ථ දැක්වීම

<u>එකම කාරක තත්ත්වයක්</u> යටතේ හා <u>එකම භුක්තියක්</u> යටතේ වන සේ භූමි ප්‍රමාණයකින් අවම වශයෙන් එක් <u>බිම් කැබැල්ල</u>ක්වත් අක්කර 20ක් හෝ ඊට වඩා වැඩි වන්නේ නම් එම <u>ගොවි කාණ්ඩය</u> වත්තක් ලෙස සලකනු ලැබේ. මෙහිදී වත්තේ සේවය කරනු ලබන කම්කරුවන්ගේ ප්‍රමාණය පිළිබඳව සැලකිල්ලට ගනු නොලැබේ.

### I. එකම කාරක තත්ත්වය

වත්ත යන්න නිර්වචනය කිරීමේදී කාරක තත්ත්වයට විශේෂ ස්ථානයක් හිමිවන අතර වතු ඇසුරින් ප්‍රධාන වශයෙන්ම කාරක තත්ත්වයන් 4 ක් හඳුනාගත හැකිය. එනම්,

- තමා විසින්ම වත්තේ වැඩකටයුතු මෙහෙයවන පුද්ගලයන්
- රජයේ ආයතනයක්, වෙළෙඳ සමාගමක් හෝ කළමනාකරණ නියෝජිත ආයතනයක් වෙනුවෙන් වැඩකටයුතු මෙහෙයවන අධිකාරී, කොන්දොස්තර වැනි වැටුප් ලබන සේවකයන්
- පුද්ගලික අයෙකු හෝ පිරිසක් වෙනුවෙන් වත්තේ වැඩකටයුතු මෙහෙයවන පුද්ගලයන්
- තවත් හවුල්කරුවන් සමඟ වත්තේ වැඩකටයුතු මෙහෙයවන පුද්ගලයන්

වත්තක් වීම සඳහා ඉහත සඳහන් කරන ලද කාරක තත්ත්වයන් ඇසුරින් එකම කාරක තත්ත්වයක එම වත්ත හෝ එහි කොටස් පැවතිය යුතුය.

### II. එකම භුක්තිය

යම් පුද්ගලයෙකුට හෝ ආයතනයකට භූමිය අයිතිව ඇති අවස්ථාවක එම පුද්ගලයා හෝ ආයතනය මෙන්ම වෙනත් පුද්ගලයෙකු හෝ ආයතනයක් එම භූමිය තුළ වගා කටයුතු, සත්ත්ව පාලන කටයුතු කරමින් එහි අස්වැන්න හෝ නිෂ්පාදනය ලබා ගනී නම් එය එම භූමිය භුක්ති විඳීම වන අතර එය භුක්තිය ලෙස හඳුන්වයි.

වත්තක් තුළදී මෙම භුක්තිය ප්‍රධාන වශයෙන් ස්වරූප 6 ක් යටතේ හඳුනාගත හැකිය. එනම්,

- ❖ රජයේ
- ❖ අර්ධ රජයේ
- ❖ වැවිලි සමාගම්
- ❖ පුද්ගලික සමාගම්
- ❖ තනි පුද්ගල
- ❖ පුද්ගලික හවුල්

භුක්තිය කවර ආකාර වුවද ආර්ථික සංගණනයේ වතු නිර්වචනයට අනුව වත්තක් වීම සඳහා වත්තක සියලුම කොටස් **එකම භුක්තියක්** යටතේ විය යුතුය.

**III. ගොවි කාණ්ඩය**

එකම කාරක තත්ත්වයක් යටතේ, කෘෂිකාර්මික නිෂ්පාදනය සඳහා සම්පූර්ණව හෝ කොටස් වශයෙන් ප්‍රයෝජනයට ගනු ලබන සියලුම ගොඩ, මඩ, සතුන්, ජලජීවී වගා කටයුතු සිදුකරන කෘෂිකාර්මික බිම්, **ගොවි කාණ්ඩයක්** වශයෙන් හැඳින්වේ.

**IV. බිම් කැබැල්ල**

ගොවි කාණ්ඩයට අයත් බිම් කොටසක්, එම ගොවිකාණ්ඩයට අයත් නොවූ බිමකින්, ජල මාර්ගයකින්, පාරකින්, කැලෑවකින් සම්පූර්ණයෙන්ම මායිම්වී ඇත්නම් එය **බිම් කැබැල්ලක්** ලෙස හැඳින්වේ.

**ගොවිකාණ්ඩය බිම් කැබලි කිහිපයකින් සමන්විත වන අවස්ථාවකදී වත්තක් ලෙස හඳුනාගන්නා ආකාරය පැහැදිලි කරගැනීම සඳහා උප කොටස යන්න හඳුනාගත යුතුය.**

## 2.18 "උප කොටස" අර්ථ දැක්වීම

විශාල ගොවි කාණ්ඩයක්, ගොවි කාණ්ඩයේ පරිපාලන පහසුව සඳහා කොටස් කිහිපයකට වෙන්කොට එම කොටස් වෙන වෙනම නම්කර ඇති අවස්ථාවකදී එලෙස නම් කරන ලද කොටස් "උප කොටස්" (Sub Division) ලෙස හැඳින්වේ. මෙම උප කොටස්වල එකතුව වත්තක් වන අතර වත්තක උප කොටස් එකිනෙකට යාබදව මෙන්ම එකිනෙකට ඈත්වද පිහිටිය හැකිය. උප කොටස් කෙලෙස පිහිටියද උප කොටස්වල විශේෂ ලක්ෂණය වනුයේ ඊට අදාල පරිපාලන කටයුතු නිශ්චිත එක් ස්ථානයකින් සිදු වීමයි.

ගොවි කාණ්ඩයක් බිම් කැබලි කිහිපයකින් සමන්විත වන අවස්ථාවකදී එම බිම් කැබලි එකිනෙකට යාබද නොවන අයුරින් පිහිටිය හැක. එවැනි අවස්ථාවක එම කැබලි අතර අක්කර 20ට වැඩි කැබලි මෙන්ම අක්කර 20ට අඩු කැබලිද තිබිය හැක. මෙම කැබලි උප කොටස් ලෙස වෙන්කොට ඇත්නම් පමණක් ඒ අතර ඇති අක්කර 20ට අඩු කැබලිද වතු ගණයට අයත් වන අතර උප කොටස් ලෙස නම්කර නොමැති නම් වතු ගණයට අයත් නොවේ.

# තෙවන පරිච්ඡේදය

## 3. කුඩා ගොවිකාණ්ඩ අංශය

කුඩා ගොවිකාණ්ඩ යනු පර්චස් 40 ට වැඩි හෝ කෘෂි නිෂ්පාදනයේ වැඩි කොටසක් අලෙවි කිරීමේ පරමාර්ථයෙන් වගා කරන ගොවි කාණ්ඩ වේ. ගාල්ල දිස්ත්‍රික්කයට අදාළව කුඩා ගොවි කාණ්ඩවල රැස්කරනලද තොරතුරු අනුව සකස් කරන ලද සංඛ්‍යාතීන් මෙම පරිච්ඡේදයේ විස්තර කරනු ලැබේ.

### 3.1 : ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ස්ත්‍රී/පුරුෂ භාවය අනුව ගොවිකාරකයින් සංඛ්‍යාව - 2014

2014 වර්ෂයේ ගාල්ල දිස්ත්‍රික්කයේ පර්චස් 40 ට වැඩි හෝ කෘෂි නිෂ්පාදනයේ වැඩි කොටසක් අලෙවි කරනු ලබන කුඩා ගොවි කාණ්ඩවල ප්‍රධාන ගොවිකාරයින් හා උප ගොවිකාරයින් සංඛ්‍යාව , ස්ත්‍රී/පුරුෂ භාවය හා ගොවිකාරකයින් පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස පදනම් කරගනිමින් විස්තර කරනු ලබයි.

**වගු අංක 3.1 : ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ස්ත්‍රී/පුරුෂ භාවය අනුව ප්‍රධාන ගොවිකාරකයින් සංඛ්‍යාව හා උප ගොවිකාරකයින් සංඛ්‍යාව - 2014**


| ප්‍රා.ලේ.කොට්ඨාසය | ප්‍රධාන ගොවිකාරකයින් සංඛ්‍යාව | | | උප ගොවිකාරකයින් සංඛ්‍යාව | | | මුළු ගණන | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | එකතුව | පුරුෂ | ස්ත්‍රී | එකතුව | පුරුෂ | ස්ත්‍රී | එකතුව | පුරුෂ | ස්ත්‍රී |
| බෙන්තොට | 5425 | 4160 | 1265 | 3 | 2 | 1 | 5428 | 4162 | 1266 |
| බලපිටිය | 5024 | 3600 | 1424 | 5 | 1 | 4 | 5029 | 3601 | 1428 |
| කරන්දෙනිය | 12683 | 9298 | 3385 | 39 | 17 | 22 | 12722 | 9315 | 3407 |
| ඇල්පිටිය | 12149 | 9423 | 2726 | 13 | 4 | 9 | 12162 | 9427 | 2735 |
| නියාගම | 7972 | 6489 | 1483 | 29 | 16 | 13 | 8001 | 6505 | 1496 |
| තවලම | 7890 | 6638 | 1252 | 76 | 45 | 31 | 7966 | 6683 | 1283 |
| නෙලුව | 6566 | 5670 | 896 | 108 | 75 | 33 | 6674 | 5745 | 929 |
| නාගොඩ | 11508 | 9364 | 2144 | 109 | 68 | 41 | 11617 | 9432 | 2185 |
| බද්දේගම | 10558 | 8645 | 1913 | 19 | 10 | 9 | 10577 | 8655 | 1922 |
| වැලිවිටිය- දිවිතුර | 5647 | 4401 | 1246 | 2 | 1 | 1 | 5649 | 4402 | 1247 |
| අම්බලන්ගොඩ | 5358 | 4235 | 1123 | 8 | 2 | 6 | 5366 | 4237 | 1129 |
| ගෝනපීනුවල | 2164 | 1755 | 409 | 13 | 8 | 5 | 2177 | 1763 | 414 |
| හික්කඩුව | 5435 | 4149 | 1286 | 20 | 9 | 11 | 5455 | 4158 | 1297 |
| කඩවත්සතර | 1492 | 1180 | 312 | 13 | 4 | 9 | 1505 | 1184 | 321 |
| බොපේ පෝද්දල | 2501 | 2063 | 438 | 10 | 9 | 1 | 2511 | 2072 | 439 |
| අක්මීමන | 6645 | 5226 | 1419 | 18 | 9 | 9 | 6663 | 5235 | 1428 |
| යක්කලමුල්ල | 9676 | 7876 | 1800 | 69 | 45 | 24 | 9745 | 7921 | 1824 |
| ඉමදූව | 5930 | 4683 | 1247 | 46 | 32 | 14 | 5976 | 4715 | 1261 |
| හබරාදූව | 3867 | 2931 | 936 | 11 | 9 | 2 | 3878 | 2940 | 938 |
| එකතුව | **128490** | **101786** | **26704** | **611** | **366** | **245** | **129101** | **102152** | **26949** |

ගාල්ල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 15 හි ප්‍රධාන ගොවිකාරයින් සංඛ්‍යාව 128,490 වන අතර, පුරුෂ ගොවිකාරකයින් සංඛ්‍යාව 101,786 (79.2%) ක් හා ස්ත්‍රී ගොවිකාරකයින් සංඛ්‍යාව 26,704 (20.8%) ක් වේ. ඒ අනුව පුරුෂ ගොවිකාරකයින් සංඛ්‍යාව ස්ත්‍රී ගොවිකාරකයින් සංඛ්‍යාවට වඩා වැඩි දායකත්වයක් ලබා දේ .


එමෙන්ම දිස්ත්‍රික්කයේ උප ගොවිකාරකයින් සංඛ්‍යාව 611 ක් වන අතර, පුරුෂ ගොවිකාරකයින් සංඛ්‍යාව 366 (60.0%) ක් හා ස්ත්‍රී ගොවිකාරකයින් සංඛ්‍යාව 245 (40.0%) ක් වේ.

ප්‍රධාන ගොවිකාරකයින් හා උප ගොවිකාරයින් සංඛ්‍යාවෙහි එකතුව සළකා බැලීමේදී වැඩිම ගොවිකාරකයින් සංඛ්‍යාව වාර්තා වනුයේ කරණ්දෙණිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් (12,722) හා ඇල්පිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් (12,162) වන අතර අඩුම ගොවිකාරකයින් සංඛ්‍යාව වාර්තා වනුයේ ගාල්ල කඩවත්සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් (1,505) වේ. මෙහි වැඩිම පුරුෂ ගොවිකාරකයින් සංඛ්‍යාව (9,427) ඇල්පිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙනු ත් වැඩිම ස්ත්‍රී ගොවිකාරකයින් සංඛ්‍යාවත් (3,407) කරණ්දෙණිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් වාර්තාවී ඇත .

**රූප සටහන 01 - ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අනුව ප්‍රධාන ගොවිකාරකයින්ගේ ව්‍යාප්තිය - 2014**




**රූප සටහන 02 - ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අනුව උප ගොවිකාරකයින්ගේ ව්‍යාප්තිය - 2014**



## 3.2 : ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් අධ්‍යාපන සුදුසුකම් හා ස්ත්‍රී/පුරුෂ භාවය අනුව ගොවිකාරකයින් සංඛ්‍යාව - 2014

ආර්ථික සංගණනයෙහි කෘෂිකාර්මික කටයුතු පිළිබඳ ගණන් ගැනීමේදී රැස් කළ දත්ත මගින් ගොවිකාරකයින්ගේ අධ්‍යාපන මට්ටම, ස්ත්‍රී පුරුෂ භාවය අනුව වර්ගීකරණයකට ලක් කරනු ලැබිණි. එම වර්ගීකරණය යටතේ ගාල්ල දිස්ත්‍රික්කයෙන් වාර්තාවී ඇති ගොවිකාරකයින්ගේ අධ්‍යාපන මට්ටම් කිසිදා පාසල් ගොස් නැති, 5 හෝ ඊට අඩු ශ්‍රේණියක් සමත්, 6 -10 දක්වා ශ්‍රේණියක් සමත්, අ.පො.ස. (සා.පෙ.) හෝ සමාන විභාගයක් සමත්, අ.පො.ස. (උ.පෙ.) හෝ සමාන විභාගයක් සමත් හා උපාධිය හෝ ඉහළ විභාගයක් සමත් ලෙස කාණ්ඩ ගත කොට දක්වන ලදි. එසේ ලබා ගත් තොරතුරු ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස මට්ටමින් සලකා බැලීම මෙහිදි සිදු කෙරේ.

**වගු අංක 3.2.1 : ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් අධ්‍යාපන සුදුසුකම් හා ස්ත්‍රී / පුරුෂ භාවය අනුව ගොවි කාරකයින් සංඛ්‍යාව - 2014**

| ප්‍රා.ලේ.කොට්ඨාසය | අධ්‍යාපන මට්ටම හා ස්ත්‍රී / පුරුෂ භාවය අනුව ගොවිකාරකයන් | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | පාසල් ගොස් නැත | | 5 ශ්‍රේණිය හෝ ඊට අඩු ශ්‍රේණියක් සමත් | | 6-10 දක්වා ශ්‍රේණියක් සමත් | | අ.පො.ස.(සා.පෙ.)හෝ සමාන විභාගයක් සමත් | | අ.පො.ස.(උ.පෙ.)හෝ සමාන විභාගයක් සමත් | | උපාධිය හෝ ඉහළ විභාගයක් සමත් | | මුළු ගණන | |
| | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී |
| බෙන්තොට | 58 | 44 | 641 | 273 | 1,444 | 427 | 1,173 | 287 | 698 | 191 | 148 | 44 | 4,162 | 1,266 |
| බලපිටිය | 56 | 53 | 740 | 349 | 1,352 | 516 | 737 | 259 | 539 | 198 | 177 | 53 | 3,601 | 1,428 |
| කරන්දෙනිය | 241 | 323 | 2,286 | 1,102 | 4,087 | 1,239 | 1,626 | 480 | 875 | 230 | 200 | 33 | 9,315 | 3,407 |
| ඇල්පිටිය | 155 | 118 | 2,118 | 807 | 4,439 | 1,147 | 1,665 | 396 | 840 | 219 | 210 | 48 | 9,427 | 2,735 |
| නියාගම | 107 | 88 | 1,437 | 437 | 2,958 | 590 | 1,334 | 227 | 567 | 133 | 102 | 21 | 6,505 | 1,496 |
| තවලම | 152 | 75 | 1,676 | 414 | 3,040 | 501 | 1,158 | 167 | 532 | 100 | 125 | 26 | 6,683 | 1,283 |
| නෙලුව | 127 | 59 | 1,445 | 312 | 2,607 | 343 | 1,000 | 133 | 473 | 71 | 93 | 11 | 5,745 | 929 |
| නාගොඩ | 214 | 98 | 2,386 | 723 | 4,132 | 797 | 1,833 | 382 | 706 | 156 | 161 | 29 | 9,432 | 2,185 |
| බද්දේගම | 107 | 42 | 1,412 | 437 | 3,410 | 683 | 2,174 | 411 | 1,311 | 299 | 241 | 50 | 8,655 | 1,922 |
| වැලිවිටිය- දිවිතුර | 20 | 17 | 965 | 385 | 2,101 | 516 | 855 | 200 | 376 | 110 | 85 | 19 | 4,402 | 1,247 |
| අම්බලන්ගොඩ | 37 | 30 | 854 | 302 | 1,723 | 390 | 918 | 241 | 574 | 134 | 131 | 32 | 4,237 | 1,129 |
| ගෝනපීනුවල | 20 | 11 | 272 | 81 | 622 | 144 | 453 | 88 | 295 | 80 | 101 | 10 | 1,763 | 414 |
| හික්කඩුව | 13 | 15 | 473 | 172 | 1,511 | 487 | 1,240 | 328 | 740 | 245 | 181 | 50 | 4,158 | 1,297 |
| කඩවත්සතර | - | 2 | 28 | 26 | 148 | 37 | 290 | 84 | 474 | 117 | 244 | 55 | 1,184 | 321 |
| බොපේ පෝද්දල | 4 | 2 | 90 | 34 | 433 | 93 | 638 | 121 | 666 | 135 | 241 | 54 | 2,072 | 439 |
| අක්මීමන | 51 | 38 | 815 | 316 | 1707 | 436 | 1538 | 356 | 895 | 235 | 229 | 47 | 5235 | 1428 |
| යක්කලමුල්ල | 175 | 90 | 1747 | 587 | 3408 | 638 | 1753 | 321 | 689 | 165 | 149 | 23 | 7921 | 1824 |
| ඉමදූව | 48 | 39 | 839 | 289 | 1913 | 510 | 1187 | 242 | 613 | 152 | 115 | 29 | 4715 | 1261 |
| හබරාදූව | 7 | 12 | 368 | 176 | 995 | 282 | 841 | 253 | 578 | 177 | 151 | 38 | 2940 | 938 |
| **එකතුව** | **1592** | **1156** | **20592** | **7222** | **42030** | **9776** | **22413** | **4976** | **12441** | **3147** | **3084** | **672** | **102152** | **26949** |

ගාල්ල දිස්ත්‍රික්කයේ ගොවිකාරකයින්ගේ අධ්‍යාපන මට්ටම සැලකීමේදී වැඩිම ගොවිකාරකයින් සංඛ්‍යාවක් (51,806) වාර්තාවී ඇත්තේ 6-10 දක්වා ශ්‍රේණියක් සමත් අධ්‍යාපන මට්ටමටයි. පුරුෂ ගොවිකාරකයින් 42,030 ක් හා ස්ත්‍රී ගොවිකාරකයින් 9,776 ක් ඒ අතර වේ. ගාල්ල දිස්ත්‍රික්කයෙන් වාර්තාවී ඇති මුළු ගොවිකාරකයින්ගෙන් අඩුම සංඛ්‍යාව වන 2,748 වාර්තා වී ඇතේත් කිසිදා පාසල් නොගිය ගොවිකාරකයින්ගෙනි. ඒ අතර පුරුෂ ගොවිකාරකයින් 1,592 ක් හා ස්ත්‍රී ගොවිකාරකයින් 1,156 ක් වන බව වාර්තා වී ඇත.

මෙම දිස්ත්‍රික්කයේ ඇති ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයන්හි අධ්‍යාපන තත්ත්වය සලකා බැලීමේදී කිසිදා පාසල් ගොස් නැති වැඩිම පුරුෂ ගොවිකාරකයින් ප්‍රතිශතය (2.59%) හා වැඩිම ස්ත්‍රී ගොවිකාරකයින් ප්‍රතිශතය (9.48%) වාර්තාවී ඇත්තේ කරණ්දෙණිය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයෙනි. දිස්ත්‍රික්කයෙහි ඇති ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස සැලකීමේදී ගාල්ල කඩවත්සතර ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයෙහි පුරුෂ ගොවිකාරකයින්ගේ හා ස්ත්‍රී ගොවිකාරකයින්ගේ අධ්‍යාපන තත්ත්වය ඉහල මට්ටමකින් ඇති බවට වාර්තාවී ඇත. මෙහි උපාධිය හෝ ඉහළ විභාගයක් සමත් පුරුෂ ගොවිකාරකයිගේ ප්‍රතිශතය 20.61% හා ස්ත්‍රී ගොවිකාරකයින්ගේ ප්‍රතිශතය 17.13% වේ. එනම් මෙම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙහි පුරුෂ ගොවිකාරකයින් පස්දෙනෙකුගෙන් එක් අයෙක් උපාධිය හෝ ඉහළ විභාගයිකින් සමත් අයෙක් වේ.

**වගු අංක 3.2.2 : ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් අධ්‍යාපන සුදුසුකම් අනුව මුළු ගොවි කාරකයින් සංඛ්‍යාව - 2014**

| ප්‍රා.ලේ.කොට්ඨාසය | අධ්‍යාපන මට්ටම අනුව ගොවිකාරකයන් | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | පාසල් ගොස් නැත | | 5 ශ්‍රේණිය හෝ ඊට අඩු ශ්‍රේණියක් සමත් | | 6-10 දක්වා ශ්‍රේණියක් සමත් | | අ.පො.ස.(සා.පෙ.)හෝ සමාන විභාගයක් සමත් | | අ.පො.ස.(උ.පෙ.)හෝ සමාන විභාගයක් සමත් | | උපාධිය හෝ ඉහළ විභාගයක් සමත් | | මුළු ගණන | |
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| බෙන්තොට | 102 | 1.9 | 914 | 16.8 | 1,871 | 34.5 | 1,460 | 26.9 | 889 | 16.4 | 192 | 3.5 | 5,428 | 100.0 |
| බලපිටිය | 109 | 2.2 | 1,089 | 21.7 | 1,868 | 37.1 | 996 | 19.8 | 737 | 14.7 | 230 | 4.6 | 5,029 | 100.0 |
| කරණ්දෙනිය | 564 | 4.4 | 3,388 | 26.6 | 5,326 | 41.9 | 2,106 | 16.6 | 1,105 | 8.7 | 233 | 1.8 | 12,722 | 100.0 |
| ඇල්පිටිය | 273 | 2.2 | 2,925 | 24.1 | 5,586 | 45.9 | 2,061 | 16.9 | 1,059 | 8.7 | 258 | 2.1 | 12,162 | 100.0 |
| නියාගම | 195 | 2.4 | 1,874 | 23.4 | 3,548 | 44.3 | 1,561 | 19.5 | 700 | 8.7 | 123 | 1.5 | 8,001 | 100.0 |
| තවලම | 227 | 2.8 | 2,090 | 26.2 | 3,541 | 44.5 | 1,325 | 16.6 | 632 | 7.9 | 151 | 1.9 | 7,966 | 100.0 |
| නෙලුව | 186 | 2.8 | 1,757 | 26.3 | 2,950 | 44.2 | 1,133 | 17.0 | 544 | 8.2 | 104 | 1.6 | 6,674 | 100.0 |
| නාගොඩ | 312 | 2.7 | 3,109 | 26.8 | 4,929 | 42.4 | 2,215 | 19.1 | 862 | 7.4 | 190 | 1.6 | 11,617 | 100.0 |
| බද්දේගම | 149 | 1.4 | 1,849 | 17.5 | 4,093 | 38.7 | 2,585 | 24.4 | 1,610 | 15.2 | 291 | 2.8 | 10,577 | 100.0 |
| වැලිවිටිය- දිවිතුර | 37 | 0.7 | 1,350 | 23.9 | 2,617 | 46.3 | 1,055 | 18.7 | 486 | 8.6 | 104 | 1.8 | 5,649 | 100.0 |
| අම්බලන්ගොඩ | 67 | 1.2 | 1,156 | 21.5 | 2,113 | 39.4 | 1,159 | 21.6 | 708 | 13.2 | 163 | 3.0 | 5,366 | 100.0 |
| ගෝනපීනුවල | 31 | 1.4 | 353 | 16.2 | 766 | 35.2 | 541 | 24.9 | 375 | 17.2 | 111 | 5.1 | 2,177 | 100.0 |
| හික්කඩුව | 28 | 0.5 | 645 | 11.8 | 1,998 | 36.6 | 1,568 | 28.7 | 985 | 18.1 | 231 | 4.2 | 5,455 | 100.0 |
| කඩවත්සතර | 2 | 0.1 | 54 | 3.6 | 185 | 12.3 | 374 | 24.9 | 591 | 39.3 | 299 | 19.9 | 1,505 | 100.0 |
| බොපේ පෝද්දල | 6 | 0.2 | 124 | 4.9 | 526 | 20.9 | 759 | 30.2 | 801 | 31.9 | 295 | 11.7 | 2,511 | 100.0 |
| අක්මීමන | 89 | 1.3 | 1,131 | 17.0 | 2,143 | 32.2 | 1,894 | 28.4 | 1,130 | 17.0 | 276 | 4.1 | 6,663 | 100.0 |
| යක්කලමුල්ල | 265 | 2.72 | 2334 | 23.95 | 4046 | 41.52 | 2074 | 21.28 | 854 | 8.76 | 172 | 1.77 | 9745 | 100.0 |
| ඉමදූව | 87 | 1.46 | 1,128 | 18.88 | 2,423 | 40.55 | 1,429 | 23.91 | 765 | 12.80 | 144 | 2.41 | 5,976 | 100.0 |
| හබරාදූව | 19 | 0.49 | 544 | 14.03 | 1277 | 32.93 | 1094 | 28.21 | 755 | 19.47 | 189 | 4.87 | 3878 | 100.0 |
| **එකතුව** | **2,748** | **2.13** | **27,814** | **21.54** | **51,806** | **40.13** | **27,389** | **21.22** | **15,588** | **12.07** | **3,756** | **2.91** | **129,101** | **100.0** |

ගාල්ල දිස්ත්‍රික්කයේ ගොවිකාරකයින්ගේ අධ්‍යාපන මට්ටම සළකා බැලූ විට ඉහලම ප්‍රතිශතයක් (40.13%) 6-10 දක්වා වූ ශ්‍රේණියක් සමත් අධ්‍යාපන මට්ටම යටතෙහි වාර්තා වේ. දිස්ත්‍රික්කය තුළ මෙම අධ්‍යාපන මට්ටමේ සිටින ගොවිකාරකයින් ප්‍රතිශතය 40% ඉක්මවූ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 8 ක් වාර්තා වන අතර එම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස හා ගොවිකාරකියින් ප්‍රතිශතයන් පිළිවෙලින් වැලිවිටිය -දිවිතුර (46.33%), ඇල්පිටිය (45.93%), තවලම (44.45%), නියාගම (44.34%), නෙළුව (44.20%), නාගොඩ (42.43%), කරණ්දෙණිය (41.86%), යක්කලමුල්ල් (41.52%), ඉමදූව (40.55%) ලෙස වේ.

5 ශ්‍රේණිය හෝ ඊට අඩු ශ්‍රේණියක් සමත් අධ්‍යාපන මට්ටමේ සිටින ගොවිකාරකයින්ගේ ප්‍රතිශතය 21.54% ක් වේ. එම අධ්‍යාපන මට්ටමේ සිටින ගොවි කාරකයින් වැඩිම ප්‍රතිශතයක් දැකිය හැකි වන්නේ නාගොඩ (26.8%), කරණ්දෙණිය (26.7%), නෙලුව (26.3%), තවලම (26.2%) යන ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයන්හිය.


එසේම ගාල්ල දිස්ත්‍රික්කයේ ගොවි කාරකයින්ගෙන් 21.22% ක් අ.පො.ස.(සා.පෙ) හෝ සමාන විභාගයක් සමත්ව ඇති අතර එම අධ්‍යාපන මට්ටමේ ගොවි කාරකයින් වැඩිම පිරිසක් දැකිය හැකි වන්නේ බෝපේපෝද්දල (30.2%), හික්කඩුව (28.7%) සහ අක්මීමන (28.4%) යන ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස වල වේ.

එසේම අ.පො.ස.(උ.පෙ) හෝ සමාන විභාගයක් සමත් ගොවිකාරක ප්‍රතිශතය 12.07% ක් වේ. එම අධ්‍යාපන මට්ටමේ ඉහලම ප්‍රතිශතයන් දැකිය හැකි වන්නේ ගාල්ල කඩවත්සතර සහ බෝපේපෝද්දල යන ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසවල වන අතර ප්‍රතිශතයන් පිළිවෙලින් 39.27%, සහ 31.9% ලෙස වේ . එම අධ්‍යාපන මට්ටමේ සිටින ගොවිකාරකයින් අඩුම ප්‍රතිශතය (7.4%) වාර්තා වන්නේ නාගොඩ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයෙනි.

ගාල්ල දිස්ත්‍රික්කයෙහි ගොවිකාරකයින්ගේ අධ්‍යාපන මට්ටම සැලකීමේදී උපාධිය හෝ ඉහළ විභාගයක් සමත් ගොවිකාරකයින් ප්‍රතිශතය 2.9% ක් වේ. ගාල්ල කඩවත්සතර ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයෙහි ගොවිකාරකයින්ගේන් 19.9% ක් උපාධිය හෝ ඉහළ විභාගයක් සමත්ව ඇත. එම අධ්‍යාපන මට්ටමේ සිටින ගොවි කාරකයින් 11.7% ක් බෝපේපෝද්දල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයෙන් දැකිය හැකි අතර අනෙකුත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වල එම අධ්‍යාපන මට්ටමේ සිටින ගොවි කාරකයින් ප්‍රතිශතය 1% - 5% ත් අතර වේ.

එමෙන්ම එම දිස්ත්‍රික්කයේ ගොවිකාරකයින්ගේ අධ්‍යාපන මට්ටම සැලකීමේදී කිසිදා පාසල් ගොස් නැති අධ්‍යාපන මට්ටමේ ප්‍රතිශතය 2.1% කි. නමුත් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස අනුව අධ්‍යාපන මට්ටම සැලකීමේදී කිසිදා පාසල් ගොස් නැති අධ්‍යාපන මට්ටමේ ප්‍රතිශතය 5% ඉක්මවා ගොස් නැති අතර කරන්දෙණිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කිසිදා පාසල් නොගිය ගොවිකාරකයින්ගේ ප්‍රතිශතය 4.4% ක් වේ

**රූප සටහන 03 - අධ්‍යාපන මට්ටම හා ස්ත්‍රී/ පුරුෂ භාවය අනුව ගොවිකාරකයින් - 2014**



## 3.3 : ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් වයස් කාණ්ඩය හා ස්ත්‍රී/පුරුෂ භාවය අනුව ගොවිකාරකයින් සංඛ්‍යාව - 2014

මෙහිදී ගොවිකාරකයින් සංඛ්‍යාව වයස් කාණ්ඩ හා ස්ත්‍රී / පුරුෂ භාවය අනුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස පදනම් කර ගනිමින් විස්තර කරනු ලබයි.

**වගු අංක 3.3.1 : ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් වයස් කාණ්ඩය හා ස්ත්‍රී / පුරුෂ භාවය අනුව ගොවි කාරකයින් සංඛ්‍යාව - 2014**

| ප්‍රා.ලේ.කොට්ඨාසය | වයස් කාණ්ඩය හා ස්ත්‍රී/පුරුෂ භාවය අනුව ගොවිකාරයින් | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | වයස 10-19 අතර | | වයස 20-29 අතර | | වයස 30-39 අතර | | වයස 40-49 අතර | | වයස 50-59 අතර | | වයස 60 ට වැඩි | | මුළු ගණන | |
| | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී |
| බෙන්තොට | 2 | - | 80 | 15 | 497 | 97 | 929 | 184 | 1,081 | 296 | 1,573 | 674 | 4,162 | 1,266 |
| බලපිටිය | - | 2 | 85 | 27 | 448 | 133 | 862 | 207 | 952 | 355 | 1,254 | 704 | 3,601 | 1,428 |
| කරණ්දෙනිය | 5 | 2 | 266 | 87 | 1,549 | 373 | 2,497 | 577 | 2,489 | 836 | 2,509 | 1,532 | 9,315 | 3,407 |
| ඇල්පිටිය | 5 | 2 | 213 | 54 | 1,491 | 253 | 2,256 | 426 | 2,290 | 662 | 3,172 | 1,338 | 9,427 | 2,735 |
| නියාගම | 5 | - | 145 | 29 | 1,039 | 115 | 1,549 | 245 | 1,623 | 351 | 2,144 | 756 | 6,505 | 1,496 |
| තවලම | 2 | 2 | 373 | 21 | 1,293 | 140 | 1,642 | 249 | 1,667 | 338 | 1,706 | 533 | 6,683 | 1,283 |
| නෙලුව | 5 | - | 299 | 19 | 1,258 | 93 | 1,623 | 206 | 1,274 | 250 | 1,286 | 361 | 5,745 | 929 |
| නාගොඩ | 7 | - | 298 | 50 | 1,588 | 188 | 2,350 | 359 | 2,270 | 557 | 2,919 | 1,031 | 9,432 | 2,185 |
| බද්දේගම | 8 | 1 | 181 | 26 | 1,151 | 170 | 2,094 | 329 | 2,110 | 441 | 3,111 | 955 | 8,655 | 1,922 |
| වැලිවිටිය- දිවිතුර | 2 | - | 90 | 20 | 646 | 125 | 1,083 | 206 | 1,092 | 249 | 1,489 | 647 | 4,402 | 1,247 |
| අම්බලන්ගොඩ | 1 | - | 72 | 19 | 525 | 86 | 1,048 | 170 | 1,094 | 233 | 1,497 | 621 | 4,237 | 1,129 |
| ගෝනපීනුවල | 2 | - | 26 | 3 | 207 | 24 | 396 | 59 | 478 | 105 | 654 | 223 | 1,763 | 414 |
| හික්කඩුව | 2 | 1 | 69 | 27 | 450 | 105 | 998 | 204 | 1,130 | 321 | 1,509 | 639 | 4,158 | 1,297 |
| කඩවත්සතර | - | - | 16 | 7 | 102 | 30 | 277 | 56 | 337 | 80 | 452 | 148 | 1,184 | 321 |
| බොපේ පෝද්දල | - | - | 13 | 3 | 175 | 38 | 499 | 80 | 569 | 94 | 816 | 224 | 2,072 | 439 |
| අක්මීමන | 3 | 1 | 114 | 25 | 749 | 139 | 1,230 | 271 | 1,293 | 312 | 1,846 | 680 | 5,235 | 1,428 |
| යක්කලමුල්ල | 3 | 1 | 290 | 38 | 1377 | 150 | 1998 | 285 | 1949 | 460 | 2304 | 890 | 7921 | 1824 |
| ඉමදූව | 2 | - | 89 | 17 | 615 | 103 | 1,104 | 184 | 1,181 | 271 | 1,724 | 686 | 4,715 | 1,261 |
| හබරාදූව | 0 | 1 | 57 | 13 | 272 | 44 | 642 | 103 | 758 | 219 | 1211 | 558 | 2940 | 938 |
| **එකතුව** | **54** | **13** | **2,776** | **500** | **15,432** | **2,406** | **25,077** | **4,400** | **25,637** | **6,430** | **33,176** | **13,200** | **102,152** | **26,949** |

ගාල්ල දිස්ත්‍රික්කයේ වයස් කාණ්ඩය අනුව හා ස්ත්‍රී / පුරුෂ භාවය අනුව ගොවි කාරකයින්ගේ ප්‍රතිශතය සළකා බැලුවිට පෙනි යන්නේ වයස 10-19, වයස් කාණ්ඩයන්හි ස්ත්රී හා පුරුෂ ගොවිකාරක ප්‍රතිශතය (0.05%) සමාන වන බවය. එසේම වයස 20-29, 30-39, 40-49 හා 50-59 වයස් කාණ්ඩ සළකා බැලුවිට එම කාණ්ඩයන්හි පුරුෂ ගොවි කාරකයින්ගේ ප්‍රතිශතය ස්ත්‍රී ගොවිකාරකයින්ගේ ප්‍රතිශතයට වඩා ඉහළ වන අතර එම අගයන් පිළිවෙලින් 2.7%, 15.1%, 24.5%, සහ 25.1% ක් වේ.

එසේම මෙහි කැපි පෙනෙන ලක්ෂණය වන්නේ වයස අවුරුදු 60 ට වැඩි කාණ්ඩය තුළ ස්ත්‍රී ගොවි කාරක ප්‍රතිශතය පුරුෂ ගොවි කාරක ප්‍රතිශතයට වඩා ඉහළ බවය. එනම් එම වයස් කාණ්ඩය තුළ ස්ත්‍රී ගොවි කාරක ප්‍රතිශතය 49% ක් වන විට පුරුෂ ගොවිකාරක ප්‍රතිශතය 32% ක් වේ.

ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස අනුව වයස් කාණ්ඩ හා ස්ත්‍රී / පුරුෂ භාවය සැලකීමේදී වයස 50–59 වයස් කාණ්ඩය තුළ ස්ත්‍රී ගොවිකාරකයින්ගේ ප්‍රතිශත අගය, පුරුෂ ගොවිකාරකයින්ගේ ප්‍රතිශත අගය ඉක්මවූ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස හතරක් දැකිය හැකිවේ. ඒවා පිළිවෙලින් තවලම, නෙලුව, නාගොඩ සහ යක්කලමුල්ල යන ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස වන අතර ඒවාහි ස්ත්‍රී ගොවිකාරක ප්‍රතිශතයන් පිළිවෙලින් 26.3%, 26.9%, 25.5% හා 25.2% ක් වේ. තවද වයස අවුරුදු 60ට වැඩි කාණ්ඩය තුළ බෙන්තොට, නියාගම, අම්බලන්ගොඩ, ගෝනාපීනුවල, ඉමදූව සහ හබරාදූව

යන ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසවල ස්ත්‍රී ගොවිකාරක ප්‍රතිශතය 50% ඉක්මවා ඇති අතර එම ප්‍රතිශතයන් පිළිවෙලින් 50.3%, 55%, 53.8%,51%, 54.4% සහ 59.4% ක් වේ.


**වගු අංක 3.3.2 : ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් වයස් කාණ්ඩය අනුව මුළු ගොවි කාරකයින් සංඛ්‍යාව හා ප්‍රතිශතය - 2014**

| ප්‍රා.ලේ.කොට්ඨාසය | වයස් කාණ්ඩය අනුව ගොවිකාරකයන් | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | වයස 10-19 අතර | | වයස 20-29 අතර | | වයස 30-39 අතර | | වයස 40-49 අතර | | වයස 50-59 අතර | | වයස 60 ට වැඩි | | මුළු ගණන | |
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| බෙන්තොට | 2 | 0.0 | 95 | 1.8 | 594 | 10.9 | 1,113 | 21 | 1,377 | 25.4 | 2,247 | 41.4 | 5,428 | 100.0 |
| බලපිටිය | 2 | 0.0 | 112 | 2.2 | 581 | 11.6 | 1,069 | 21 | 1,307 | 26.0 | 1,958 | 38.9 | 5,029 | 100.0 |
| කරණ්දෙනිය | 7 | 0.1 | 353 | 2.8 | 1,922 | 15.1 | 3,074 | 24 | 3,325 | 26.1 | 4,041 | 31.8 | 12,722 | 100.0 |
| ඇල්පිටිය | 7 | 0.1 | 267 | 2.2 | 1,744 | 14.3 | 2,682 | 22.1 | 2,952 | 24 | 4,510 | 37.1 | 12,162 | 100.0 |
| නියාගම | 5 | 0.1 | 174 | 2.2 | 1,154 | 14.4 | 1,794 | 22.4 | 1,974 | 24.7 | 2,900 | 36 | 8,001 | 100.0 |
| තවලම | 4 | 0.1 | 394 | 4.9 | 1,433 | 18.0 | 1,891 | 23.7 | 2,005 | 25.2 | 2,239 | 28 | 7,966 | 100.0 |
| නෙලුව | 5 | 0.1 | 318 | 4.8 | 1,351 | 20.2 | 1,829 | 27.4 | 1,524 | 22.8 | 1,647 | 25 | 6,674 | 100.0 |
| නාගොඩ | 7 | 0.1 | 348 | 3.0 | 1,776 | 15.3 | 2,709 | 23.3 | 2,827 | 24.3 | 3,950 | 34 | 11,617 | 100.0 |
| බද්දේගම | 9 | 0.1 | 207 | 2.0 | 1,321 | 12.5 | 2,423 | 22.9 | 2,551 | 24.1 | 4,066 | 38 | 10,577 | 100.0 |
| වැලිවිටිය- දිවිතුර | 2 | 0.0 | 110 | 1.9 | 771 | 13.6 | 1,289 | 22.8 | 1,341 | 23.7 | 2,136 | 38 | 5,649 | 100.0 |
| අම්බලන්ගොඩ | 1 | 0.0 | 91 | 1.7 | 611 | 11.4 | 1,218 | 23 | 1,327 | 24.7 | 2,118 | 39.5 | 5,366 | 100.0 |
| ගෝනපීනුවල | 2 | 0.1 | 29 | 1.3 | 231 | 10.6 | 455 | 20.9 | 583 | 26.8 | 877 | 40 | 2,177 | 100.0 |
| හික්කඩුව | 3 | 0.1 | 96 | 1.8 | 555 | 10.2 | 1,202 | 22.0 | 1,451 | 27 | 2,148 | 39.4 | 5,455 | 100.0 |
| කඩවත්සතර | 0 | 0.0 | 23 | 1.5 | 132 | 8.8 | 333 | 22.1 | 417 | 27.7 | 600 | 40 | 1,505 | 100.0 |
| බොපේ පෝද්දල | 0 | 0.0 | 16 | 0.6 | 213 | 8.5 | 579 | 23.1 | 663 | 26.4 | 1,040 | 41 | 2,511 | 100.0 |
| අක්මීමන | 4 | 0.1 | 139 | 2.1 | 888 | 13.3 | 1501 | 22.5 | 1605 | 24.1 | 2526 | 37.9 | 6663 | 100 |
| යක්කලමුල්ල | 4 | 0.04 | 328 | 3.37 | 1527 | 15.67 | 2283 | 23.43 | 2409 | 24.72 | 3194 | 32.78 | 9745 | 100 |
| ඉමදූව | 2 | 0.0 | 106 | 1.8 | 718 | 12.0 | 1288 | 21.6 | 1452 | 24.3 | 2410 | 40.3 | 5976 | 100 |
| හබරාදූව | 1 | 0.03 | 70 | 1.81 | 316 | 8.15 | 745 | 19.21 | 977 | 25.19 | 1769 | 45.62 | 3878 | 100 |
| **එකතුව** | **67** | **0.1** | **3276** | **2.5** | **17838** | **13.8** | **29477** | **22.8** | **32067** | **24.8** | **46376** | **35.9** | **129101** | **100** |

ගාල්ල දිස්ත්‍රික්කයේ වැඩිම ගොවිකාරකයින් සංඛ්‍යාවක් (46376) වාර්තා වී ඇත්තේ වයස අවුරුදු 60ට වැඩි කාණ්ඩයටයි. ප්‍රතිශතයක් ලෙස එය 35.9% ක් වේ. මෙම දිස්ත්‍රික්කයෙහි ගොවිකාරකයින්ගේ වයස් කාණ්ඩ සැලකූ විට ගොවිකාරකයින් ප්‍රතිශතය වැඩි වයස් කාණ්ඩ පිළිවෙලින් වයස අවුරුදු 50-59 (24.8%) , වයස 40 – 49 (22.8%) හා වයස 30 – 39 (13.8%) වයස් කාණ්ඩවේ.

ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස අනුව වයස් කාණ්ඩ සැලකූ විට නෙලුව ප්‍රාදේශිය ලේකම් කොට්ටාසය හැර අනෙකුත් සෑම ප්‍රාදේශිය ලේකම් කොට්ටාසයකම වැඩිම ගොවිකාරකයින් පිරිසක් සිටිනුයේ වයස අවුරුදු 60ට වැඩි වයස් කාණ්ඩය තුළය. නෙලුව ප්‍රාදේශීය ලේකම් කොට්ටාසයේ සිටින ගොවිකාරකයින් වැඩිම පිරිසක් වයස අවුරුදු 40-49 වයස් කාණ්ඩයෙහි පසුවේ.

**රූප සටහන 04 - වයස් කාණ්ඩය හා ස්ත්‍රී / පුරුෂ භාවය අනුව ගොවි කාරකයින් සංඛ්‍යාව – 2014**



## 3.4 : ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් බිම් කැබලි ගණන සහ ස්ත්‍රී / පුරුෂ භාවය අනුව ගොවිකාරකයින් සංඛ්‍යාව - 2014

මෙහිදී ගොවිකාරකයින් සංඛ්‍යාව, ඔවුන් සතු බිම් කැබලි සංඛ්‍යාව අනුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස පදනම් කර ගනිමින් විස්තර කරනු ලබයි.

**වගු අංක 3.4 : ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් බිම් කැබලි ගණන හා ස්ත්‍රී / පුරුෂ භාවය අනුව ගොවිකාරකයින් සංඛ්‍යාව - 2014**

| ප්‍රා.ලේ.කොට්ඨාසය | බිම් කැබලි ගණන හා ස්ත්‍රී/ පුරුෂ භාවය අනුව ගොවිකාරකයන් සංඛ්‍යාව | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | බිම් කැබලි 1 | | බිම් කැබලි 2 | | බිම් කැබලි 3 | | බිම් කැබලි 4 | | බිම් කැබලි 5 | | බිම් කැබලි 6 | |
| | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී |
| බෙන්තොට | 2,198 | 787 | 1,194 | 304 | 471 | 103 | 157 | 40 | 61 | 16 | 33 | 9 |
| බලපිටිය | 2,352 | 1050 | 832 | 256 | 245 | 69 | 84 | 31 | 34 | 9 | 19 | 2 |
| කරණ්දෙනිය | 4,661 | 2069 | 2,869 | 869 | 1,123 | 332 | 396 | 80 | 161 | 26 | 44 | 14 |
| ඇල්පිටිය | 3,731 | 1334 | 2,998 | 760 | 1,442 | 379 | 668 | 144 | 275 | 65 | 135 | 20 |
| නියාගම | 2,456 | 704 | 1,942 | 414 | 1,150 | 213 | 524 | 86 | 182 | 36 | 118 | 12 |
| තවලම | 3,168 | 731 | 2,053 | 366 | 750 | 99 | 317 | 39 | 124 | 18 | 60 | 8 |
| නෙලුව | 2,517 | 562 | 1,914 | 233 | 749 | 75 | 320 | 32 | 101 | 14 | 52 | 4 |
| නාගොඩ | 4,752 | 1320 | 2,650 | 548 | 1,125 | 171 | 438 | 75 | 198 | 27 | 93 | 11 |
| බද්දේගම | 3,199 | 905 | 3,094 | 629 | 1,254 | 203 | 512 | 88 | 247 | 39 | 103 | 18 |
| වැලිවිටිය- දිවිතුර | 2,186 | 761 | 1,294 | 307 | 514 | 116 | 191 | 31 | 98 | 11 | 38 | 2 |
| අම්බලන්ගොඩ | 2,372 | 715 | 1,222 | 278 | 400 | 92 | 146 | 30 | 46 | 6 | 24 | 2 |
| ගෝනපීනුවල | 859 | 261 | 543 | 107 | 223 | 30 | 71 | 9 | 29 | 1 | 21 | 3 |
| හික්කඩුව | 2,291 | 834 | 1,227 | 308 | 376 | 98 | 124 | 26 | 50 | 12 | 26 | 4 |
| කඩවත්සතර | 711 | 235 | 320 | 62 | 91 | 17 | 29 | 6 | 9 | 0 | 8 | 0 |
| බොපේ පෝද්දල | 1,026 | 269 | 697 | 119 | 227 | 40 | 70 | 7 | 32 | 2 | 4 | 0 |
| අක්මීමන | 3023 | 940 | 1430 | 325 | 422 | 94 | 161 | 20 | 50 | 15 | 35 | 7 |
| යක්කලමුල්ල | 4143 | 1168 | 2359 | 427 | 877 | 134 | 301 | 45 | 112 | 22 | 60 | 9 |
| ඉමදූව | 2350 | 749 | 1362 | 299 | 497 | 111 | 216 | 41 | 94 | 16 | 58 | 12 |
| හබරාදූව | 1730 | 644 | 765 | 196 | 251 | 65 | 91 | 16 | 47 | 3 | 27 | 3 |
| **එකතුව** | **49725** | **16038** | **30765** | **6807** | **12187** | **2441** | **4816** | **846** | **1950** | **338** | **958** | **140** |

| ප්‍රා.ලේ.කොට්ඨාසය | බිම් කැබලි ගණන හා ස්ත්‍රී/ පුරුෂ භාවය අනුව ගොවිකාරකයන් සංඛ්‍යාව | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | බිම් කැබලි 7 | | බිම් කැබලි 8 | | බිම් කැබලි 9 | | බිම් කැබලි 10 හෝ ඊට වැඩි | | මුළු ගණන | | |
| | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී | එකතුව |
| බෙන්තොට | 22 | 2 | 17 | 4 | 1 | 1 | 8 | 0 | 4,162 | 1266 | 5,428 |
| බලපිටිය | 10 | 1 | 6 | 1 | 4 | 2 | 15 | 7 | 3,601 | 1428 | 5,029 |
| කරණ්දෙනිය | 24 | 8 | 21 | 5 | 10 | 1 | 6 | 3 | 9,315 | 3407 | 12,722 |
| ඇල්පිටිය | 62 | 10 | 52 | 13 | 33 | 4 | 31 | 6 | 9,427 | 2735 | 12,162 |
| නියාගම | 58 | 11 | 42 | 12 | 14 | 5 | 19 | 3 | 6,505 | 1496 | 8,001 |
| තවලම | 49 | 8 | 79 | 7 | 39 | 1 | 44 | 6 | 6,683 | 1283 | 7,966 |
| නෙලුව | 23 | 3 | 39 | 2 | 16 | 2 | 14 | 2 | 5,745 | 929 | 6,674 |
| නාගොඩ | 60 | 9 | 55 | 11 | 26 | 5 | 35 | 8 | 9,432 | 2185 | 11,617 |
| බද්දේගම | 70 | 11 | 67 | 8 | 56 | 8 | 53 | 13 | 8,655 | 1922 | 10,577 |
| වැලිවිටිය- දිවිතුර | 27 | 7 | 23 | 2 | 9 | 3 | 22 | 7 | 4,402 | 1247 | 5,649 |
| අම්බලන්ගොඩ | 17 | 3 | 6 | 1 | 3 | 0 | 1 | 2 | 4,237 | 1129 | 5,366 |
| ගෝනපීනුවල | 6 | 2 | 7 | 1 | 1 | 0 | 3 | 0 | 1,763 | 414 | 2,177 |
| හික්කඩුව | 18 | 3 | 23 | 6 | 10 | 2 | 13 | 4 | 4,158 | 1297 | 5,455 |
| කඩවත්සතර | 4 | 1 | 5 | 0 | 5 | 0 | 2 | 0 | 1,184 | 321 | 1,505 |
| බොපේ පෝද්දල | 7 | 1 | 3 | 0 | 1 | 1 | 5 | 0 | 2,072 | 439 | 2,511 |
| අක්මීමන | 27 | 5 | 51 | 15 | 7 | 2 | 29 | 5 | 5235 | 1428 | 6663 |
| යක්කලමුල්ල | 30 | 8 | 16 | 7 | 11 | 1 | 12 | 3 | 7921 | 1824 | 9745 |
| ඉමදූව | 46 | 9 | 28 | 4 | 13 | 4 | 51 | 16 | 4715 | 1261 | 5976 |
| හබරාදූව | 7 | 3 | 7 | 3 | 4 | 3 | 11 | 2 | 2940 | 938 | 3878 |
| **එකතුව** | **567** | **105** | **547** | **102** | **263** | **45** | **374** | **87** | **102152** | **26949** | **129101** |

ඒ අනුව ගාල්ල දිස්ත්‍රික්කයේ ගොවිකාරකයින් වැඩි පිරිසකට වගාබිම් කැබලි එකක් පමණක් සතුව ඇති බව වාර්තා වන අතර එය ප්‍රතිශතයක් ලෙස ගත් කල 51% ක් වේ. එමෙන්ම වගාබිම් කැබලි දෙකක් සතුව ඇති ප්‍රතිශතය 29% ක්ද වගාබිම් කැබලි තුනක් සතුව ඇති ප්‍රතිශතය 11% ක්ද වගාබිම්

කැබලි හතරක් සතුව පවතින ගොවිකාරක ප්‍රතිශතය 4% ක් ලෙස වාර්තා වේ. එසේම වගා බිම් කැබලි 5ට වැඩිය ඇති ගොවි කාරකයින් ප්‍රතිශතය 1.77% ක් වේ.


ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස අනුව බිම් කැබලි සැලකීමේදී දිස්ත්‍රික්කයේ ඇති සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම බහුතරය සිටිනුයේ වගාබිම් කැබලි එකක් සතු ගොවිකාරකයින් වේ. වගාබිම් කැබලි එකක් සතු ගොවිකාරකයින්ගේ ප්‍රතිශතය 60% ඉක්මවන ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස ගණන 3ක් වන අතර ඒවා නම් බලපිටිය 67%, ගාල්ල කඩවත්සතර (62%), හබරාදුව (61%) ලෙස වාර්තා වේ.

වගාබිම් කැබලි දෙකක් සතු ගොවිකාරකයින්ගේ වැඩිම ප්‍රතිශතය 35% වාර්තා වන්නේ බද්දේගම ප්‍රාදේශීය ලේකම් කොට්ටාසයෙනි.

වගා බිම් කැබලි තුනක් සහිත ගොවිකාරකියින් වැඩි ප්‍රතිශතයක් 17% ක් නියාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් වාර්තා වේ. එසේම වගා බිම් කැබලි හතරකට වැඩි ප්‍රමාණයකට හිමිකම් කියන ගොවිකාරකයින් වැඩිම ප්‍රතිශතයක් දැකිය හැකි වන්නේ ද නියාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙනි.

ඇල්පිටිය, නියාගම හා බද්දේගම යන ප්‍රාදේශිය ලේකම් කොට්ටාස හැරුණු විට අනිකුත් සියළුම ප්‍රාදේශිය ලේකම් කොට්ටාසයන්හි ස්ත්‍රී ගොවිකාරකයින්ගෙන් අඩකට වැඩි පිරිසකට වගාබිම් කැබලි එකක් සතුවන බව වාර්තා වේ.

**රූප සටහන 05 - බිම් කැබලි ගණන හා ස්ත්‍රී / පුරුෂ භාවය අනුව ගොවි කාරකයින් සංඛ්‍යාව - 2014**



## 3.5 : ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් වගකීම් දරන බිම් ප්‍රමාණය හා ස්ත්‍රී/පුරුෂ භාවය අනුව ගොවිකාරකයින් සංඛ්‍යාව - 2014

මෙහිදී ගොවිකාරකයින් සංඛ්‍යාව, ඔවුන් වගකීම දරණ බිම් ප්‍රමාණය හා ස්ත්‍රී / පුරුෂ භාවය අනුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස පදනම් කර ගනිමින් විස්තර කරනු ලබයි.

**වගු අංක 3.5 : ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් වගකීම් දරන බිම් ප්‍රමාණය හා ස්ත්‍රී / පුරුෂ භාවය අනුව ගොවිකාරකයින් සංඛ්‍යාව- 2014**

| ප්‍රා.ලේ.කොට්ඨාසය | බිම් කැබලි ගණන හා ස්ත්‍රී/ පුරුෂ භාවය අනුව ගොවිකාරකයන් සංඛ්‍යාව | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | අක්කර 1ට අඩු | | අක්කර 1-2 | | අක්කර 2-3 | | අක්කර 3-4 | | අක්කර 4-5 | | අක්කර 5-7 | |
| | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී |
| බෙන්තොට | 2,164 | 743 | 1,148 | 320 | 415 | 101 | 183 | 46 | 86 | 16 | 87 | 17 |
| බලපිටිය | 2,389 | 1030 | 692 | 249 | 214 | 67 | 104 | 35 | 62 | 17 | 65 | 16 |
| කරන්දෙනිය | 5,655 | 2206 | 2,296 | 829 | 775 | 226 | 282 | 79 | 137 | 24 | 102 | 23 |
| ඇල්පිටිය | 4,206 | 1392 | 2,877 | 807 | 1,248 | 317 | 526 | 98 | 233 | 49 | 185 | 41 |
| නියාගම | 2,187 | 629 | 2,165 | 499 | 1,072 | 198 | 498 | 77 | 238 | 41 | 209 | 28 |
| තවලම | 1,882 | 509 | 2,338 | 472 | 1,427 | 187 | 505 | 63 | 234 | 22 | 175 | 21 |
| නෙලුව | 1,251 | 310 | 2,154 | 369 | 1,261 | 140 | 539 | 48 | 234 | 23 | 171 | 22 |
| නාගොඩ | 4,787 | 1310 | 2,870 | 612 | 958 | 152 | 387 | 54 | 160 | 22 | 130 | 19 |
| බද්දේගම | 4,376 | 1147 | 2,291 | 453 | 965 | 160 | 431 | 72 | 203 | 32 | 191 | 30 |
| වැලිවිටිය- දිවිතුර | 2,510 | 825 | 1,111 | 293 | 422 | 76 | 154 | 27 | 80 | 10 | 74 | 10 |
| අම්බලන්ගොඩ | 2,975 | 810 | 701 | 206 | 235 | 53 | 115 | 28 | 61 | 11 | 63 | 12 |
| ගෝනපිනුවල | 1,083 | 279 | 376 | 84 | 125 | 29 | 61 | 6 | 23 | 5 | 38 | 3 |
| හික්කඩුව | 2,702 | 944 | 891 | 239 | 261 | 58 | 120 | 22 | 64 | 6 | 49 | 17 |
| කඩවත්සතර | 694 | 203 | 215 | 72 | 107 | 21 | 46 | 10 | 27 | 3 | 37 | 3 |
| බෝපේ පෝද්දල | 1,185 | 269 | 453 | 97 | 163 | 33 | 87 | 15 | 49 | 13 | 69 | 5 |
| අක්මීමන | 2791 | 870 | 1475 | 379 | 524 | 103 | 183 | 40 | 103 | 15 | 74 | 12 |
| යක්කලමුල්ල | 3614 | 966 | 2733 | 600 | 922 | 162 | 302 | 49 | 131 | 16 | 117 | 18 |
| ඉමදුව | 2404 | 719 | 1357 | 346 | 487 | 105 | 206 | 37 | 83 | 25 | 93 | 18 |
| හබරාදුව | 1749 | 619 | 668 | 195 | 247 | 48 | 106 | 31 | 60 | 20 | 60 | 8 |
| **එකතුව** | **50604** | **15780** | **28811** | **7121** | **11828** | **2236** | **4835** | **837** | **2268** | **370** | **1989** | **323** |

| ප්‍රා.ලේ.කොට්ඨාසය | බිම් කැබලි ගණන හා ස්ත්‍රී/ පුරුෂ භාවය අනුව ගොවිකාරකයන් සංඛ්‍යාව | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | අක්කර 7-9 | | අක්කර 9-10 | | අක්කර 10-15 | | බිම් කැබලි 15ට වැඩි | | මුළු ගණන | | |
| | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී | එකතුව |
| බෙන්තොට | 32 | 9 | 7 | 3 | 18 | 4 | 22 | 7 | 4,162 | 1266 | 5,428 |
| බලපිටිය | 26 | 9 | 10 | 1 | 18 | 3 | 21 | 1 | 3,601 | 1428 | 5,029 |
| කරන්දෙනිය | 35 | 8 | 5 | 4 | 21 | 7 | 7 | 1 | 9,315 | 3407 | 12,722 |
| ඇල්පිටිය | 68 | 17 | 13 | 4 | 58 | 7 | 13 | 3 | 9,427 | 2735 | 12,162 |
| නියාගම | 70 | 12 | 11 | 3 | 37 | 8 | 18 | 1 | 6,505 | 1496 | 8,001 |
| තවලම | 58 | 4 | 11 | 2 | 33 | 2 | 20 | 1 | 6,683 | 1283 | 7,966 |
| නෙලුව | 73 | 8 | 17 | 2 | 31 | 5 | 14 | 2 | 5,745 | 929 | 6,674 |
| නාගොඩ | 60 | 4 | 17 | 5 | 43 | 5 | 20 | 2 | 9,432 | 2185 | 11,617 |
| බද්දේගම | 86 | 12 | 21 | 6 | 67 | 6 | 24 | 4 | 8,655 | 1922 | 10,577 |
| වැලිවිටිය- දිවිතුර | 20 | 4 | 6 | 0 | 18 | 1 | 7 | 1 | 4,402 | 1247 | 5,649 |
| අම්බලන්ගොඩ | 30 | 2 | 9 | 2 | 27 | 3 | 21 | 2 | 4,237 | 1129 | 5,366 |
| ගෝනපිනුවල | 24 | 3 | 6 | 1 | 17 | 2 | 10 | 2 | 1,763 | 414 | 2,177 |
| හික්කඩුව | 23 | 3 | 10 | 0 | 21 | 6 | 17 | 2 | 4,158 | 1297 | 5,455 |
| කඩවත්සතර | 14 | 1 | 8 | 1 | 20 | 3 | 16 | 4 | 1,184 | 321 | 1,505 |
| බෝපේ පෝද්දල | 25 | 4 | 10 | 0 | 20 | 2 | 11 | 1 | 2,072 | 439 | 2,511 |
| අක්මීමන | 34 | 4 | 10 | 0 | 28 | 4 | 13 | 1 | 5235 | 1428 | 6663 |
| යක්කලමුල්ල | 50 | 5 | 11 | 2 | 23 | 4 | 18 | 2 | 7921 | 1824 | 9745 |
| ඉමදුව | 38 | 5 | 7 | 0 | 21 | 4 | 19 | 2 | 4715 | 1261 | 5976 |
| හබරාදුව | 19 | 8 | 5 | 2 | 15 | 4 | 11 | 3 | 2940 | 938 | 3878 |
| **එකතුව** | **785** | **122** | **194** | **38** | **536** | **80** | **302** | **42** | **102152** | **26949** | **129101** |

ගාල්ල දිස්ත්‍රික්කයෙහි ගොවිකාරකයින් වැඩි සංඛ්‍යාවකට (66384) අයත් බිම් ප්‍රමාණය අක්කර 1 ට අඩු බිම් ප්‍රමාණයකි. එනම් ආසන්න වශයෙන් ගොවිකාරකයින් දෙදෙනෙකු සැලකූ විට ඉන් එක් අයෙකුට අයත් බිම් ප්‍රමාණය අක්කර 1 ට අඩු බිම් ප්‍රමාණයකි. දිස්ත්‍රික්කයෙහි ගොවිකාරකයින්ට අයත් බිම් ප්‍රමාණ වල ප්‍රතිශත සැලකීමේදී පිළිවෙලින් අක්කර 1 ට අඩු (51.4% ), අක්කර 1-2


(27.8%), අක්කර 2-3 (10.8%) , අක්කර 3-4 (4.3%), අක්කර 5-7 (2%), අක්කර 7ට වැඩි (1.6%) ලෙසට දැක්විය හැකිවේ.

බිම් ප්‍රමාණය පිළිබඳ අවධානය යොමු කිරීමේදි අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙහි (70.5%), බලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙහි (67.9%) හා හික්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙහි (66.8%) ගොවිකාරකයින් වැඩි ප්‍රතිශතයකට අයත් බිම් ප්‍රමාණය අක්කර 1 ට අඩු බිම් ප්‍රමාණයක් වීම මෙහි දැකිය හැකි සුවිශේෂී ලක්ෂණයකි.

තවද, නෙලුව, තවලම, යක්කලමුල්ල,නියාගම, සහ ඇල්පිටිය යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වල අක්කර 1 – 2 ත් අතර ප්‍රමාණයකට හිමිකම් කියන ගොවිකාරකයින් ප්‍රතිශතය 30% ඉක්මවයි. එසේම අක්කර 7-9 අතර බිම් ප්‍රමාණයකට හෝ ඊට වැඩි ප්‍රමාණ සලකා බලනවිට එවනි බිම් ප්‍රමාණයකට හිමිකම් කියන ගොවිකාරකයින් ප්‍රතිශතය1% ඉක්මවා ඇත්තේ ගෝනපීනුවල,නෙලුව, බෝපේපෝද්දල, සහ නියාගම යන ප්‍රාදේශිය ලේකම් කොට්ටාසවල පමණි.

ගාල්ල දිස්ත්‍රික්කයෙහි වැඩිම ස්ත්‍රී ගොවිකාරකයින් (15780) හා පුරුෂ ගොවිකාරකයින් (50,604) සංඛ්‍යාවකට අයත් බිම් ප්‍රමාණය අක්කර 1 ට අඩු බිම් ප්‍රමාණයකි. එම බිම් ප්‍රමාණය යටතේ ස්ත්‍රී හා පුරුෂ ගොවිකාරකයින්ගේ ප්‍රතිශත පිළිවෙලින් 58.5% හා 49.5% වේ. බිම් ප්‍රමාණ හා ස්ත්‍රී / පුරුෂ භාවය පිළිබඳ අවධානය යොමු කිරීමේදි අක්කර 1-2 අතර ඉහත අගයන් පිළිවෙලින් 28.2% හා 26.4% වන අතර අක්කර 2-3 අතර 11.5% හා 8.2% ද අක්කර 3-4 අතර 4.7% හා 3.1% ද අක්කර 4-5 අතර 2.2% හා 1.3% ද අක්කර 5-7 අතර 1.9% හා 1.1% ද අක්කර 7 හා ඊට වැඩි අතර 1% ට වඩා අඩු වේ.

**රූප සටහන 06 - වගකීම් දරණ බිම් ප්‍රමාණය හා ස්ත්‍රී/පුරුෂ භාවය අනුව ගොවිකාරකයින් - 2014**



## 3.6 : ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ගොවිකාරකයින් සංඛ්‍යාව සහ වගකීම් දරන බිම් ප්‍රමාණය (අක්කර) - 2014

මේ යටතේදී ගොවිකාරකයා වගකීම් දරන බිම් ප්‍රමාණයේ විශාලත්වය අනුව ගොවිකාරකයින් සංඛ්‍යාව හා බිම් ප්‍රමාණයේ ව්‍යාප්තිය පිළිබඳ විස්තර කරනු ලබයි.

**වගු අංක 3.6 : ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ගොවිකාරකයින් සංඛ්‍යාව සහ වගකීම් දරන බිම් ප්‍රමාණය (අක්කර) - 2014**

| ප්‍රා.ලේ.කොට්ඨාසය | බිම් කැබලි ගණන හා ස්ත්‍රී/ පුරුෂ භාවය අනුව ගොවිකාරකයන් සංඛ්‍යාව | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | අක්කර 1ට අඩු | | අක්කර 1-2 | | අක්කර 2-3 | | අක්කර 3-4 | | අක්කර 4-5 | | අක්කර 5-7 | |
| | ගොවිකාරකයින් සංඛ්‍යාව | බිම් ප්‍රමාණය | ගොවිකාරකයින් සංඛ්‍යාව | බිම් ප්‍රමාණය | ගොවිකාරකයින් සංඛ්‍යාව | බිම් ප්‍රමාණය | ගොවිකාරකයින් සංඛ්‍යාව | බිම් ප්‍රමාණය | ගොවිකාරකයින් සංඛ්‍යාව | බිම් ප්‍රමාණය | ගොවිකාරකයින් සංඛ්‍යාව | බිම් ප්‍රමාණය |
| බෙන්තොට | 2907 | 1405 | 1468 | 1,889 | 516 | 1175 | 229 | 760 | 102 | 446 | 104 | 594 |
| බලපිටිය | 3,419 | 1456 | 941 | 1,186 | 281 | 642 | 139 | 459 | 79 | 345 | 81 | 456 |
| කරණ්දෙනිය | 7,861 | 3364 | 3125 | 4,011 | 1,001 | 2302 | 361 | 1,192 | 161 | 698 | 125 | 709 |
| ඇල්පිටිය | 5,598 | 2714 | 3684 | 4,840 | 1,565 | 3639 | 624 | 2,086 | 282 | 1221 | 226 | 1,277 |
| නියාගම | 2,816 | 1452 | 2664 | 3,475 | 1,270 | 2905 | 575 | 1,900 | 279 | 1201 | 237 | 1,351 |
| තවලම | 2,391 | 1285 | 2810 | 3,565 | 1,614 | 3731 | 568 | 1,877 | 256 | 1105 | 196 | 1,101 |
| නෙලුව | 1,561 | 873 | 2523 | 3,224 | 1,401 | 3167 | 587 | 1,917 | 257 | 1097 | 193 | 1,079 |
| නාගොඩ | 6,097 | 2956 | 3482 | 4,422 | 1,110 | 2562 | 441 | 1,470 | 182 | 787 | 149 | 851 |
| බද්දේගම | 5,523 | 2739 | 2744 | 3,608 | 1,125 | 2625 | 503 | 1,685 | 235 | 1019 | 221 | 1,257 |
| වැලිවිටිය- දිවිතුර | 3,335 | 1469 | 1404 | 1,818 | 498 | 1149 | 181 | 596 | 90 | 390 | 84 | 487 |
| අම්බලන්ගොඩ | 3,785 | 1502 | 907 | 1,184 | 288 | 660 | 143 | 478 | 72 | 313 | 75 | 427 |
| ගෝනපීනුවල | 1,362 | 610 | 460 | 607 | 154 | 360 | 67 | 223 | 28 | 124 | 41 | 230 |
| හික්කඩුව | 3,646 | 1660 | 1130 | 1,455 | 319 | 736 | 142 | 469 | 70 | 301 | 66 | 378 |
| කඩවත්සතර | 897 | 388 | 287 | 362 | 128 | 294 | 56 | 184 | 30 | 130 | 40 | 218 |
| බොපේ පෝද්දල | 1,454 | 708 | 550 | 723 | 196 | 453 | 102 | 343 | 62 | 270 | 74 | 413 |
| අක්මීමන | 3661 | 1727 | 1854 | 2333 | 627 | 1432 | 223 | 736 | 118 | 502 | 86 | 488 |
| යක්කලමුල්ල | 4580 | 2277 | 3333 | 4233 | 1084 | 2460 | 351 | 1161 | 147 | 636 | 135 | 750 |
| ඉමදූව | 3123 | 1575 | 1703 | 2195 | 592 | 1376 | 243 | 813 | 108 | 475 | 111 | 634 |
| හබරාදූව | 2368 | 1137 | 863 | 1092 | 295 | 675 | 137 | 448 | 80 | 350 | 68 | 387 |
| **එකතුව** | **66384** | **31295** | **35932** | **46220** | **14,064** | **32340** | **5672** | **18,798** | **2,638** | **11411** | **2,312** | **13087** |

| ප්‍රා.ලේ.කොට්ඨාසය | බිම් කැබලි ගණන හා ස්ත්‍රී/ පුරුෂ භාවය අනුව ගොවිකාරකයන් සංඛ්‍යාව | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | අක්කර 7-9 | | අක්කර 9-10 | | අක්කර 10-15 | | අක්කර 15- 20 | | අක්කර 20ට වැඩි | | මුළු ගණන | | |
| | ගොවිකාරකයින් සංඛ්‍යාව | බිම් ප්‍රමාණය | ගොවිකාරකයින් සංඛ්‍යාව | බිම් ප්‍රමාණය | ගොවිකාරකයින් සංඛ්‍යාව | බිම් ප්‍රමාණය | ගොවිකාරකයින් සංඛ්‍යාව | බිම් ප්‍රමාණය | ගොවිකාරකයින් සංඛ්‍යාව | බිම් ප්‍රමාණය | ගොවිකාරකයින් සංඛ්‍යාව | බිම් ප්‍රමාණය | ප්‍රතිශතය |
| බෙන්තොට | 41 | 311 | 10 | 92 | 22 | 263 | 16 | 268 | 13 | 395 | 5,428 | 7598 | 4.3 |
| බලපිටිය | 35 | 269 | 11 | 102 | 21 | 249 | 13 | 219 | 9 | 253 | 5,029 | 5637 | 3.2 |
| කරණ්දෙනිය | 43 | 338 | 9 | 83 | 28 | 324 | 5 | 83 | 3 | 119 | 12,722 | 13224 | 7.5 |
| ඇල්පිටිය | 85 | 657 | 17 | 161 | 65 | 782 | 9 | 154 | 7 | 168 | 12,162 | 17698 | 10.0 |
| නියාගම | 82 | 638 | 14 | 132 | 45 | 536 | 12 | 203 | 7 | 184 | 8,001 | 13978 | 7.9 |
| තවලම | 62 | 484 | 13 | 120 | 35 | 409 | 10 | 179 | 11 | 340 | 7,966 | 14195 | 8.0 |
| නෙලුව | 81 | 617 | 19 | 175 | 36 | 423 | 13 | 217 | 3 | 72 | 6,674 | 12860 | 7.3 |
| නාගොඩ | 64 | 496 | 22 | 206 | 48 | 553 | 15 | 259 | 7 | 283 | 11,617 | 14845 | 8.4 |
| බද්දේගම | 98 | 754 | 27 | 256 | 73 | 847 | 20 | 344 | 8 | 211 | 10,577 | 15346 | 8.7 |
| වැලිවිටිය- දිවිතුර | 24 | 187 | 6 | 56 | 19 | 226 | 6 | 102 | 2 | 53 | 5,649 | 6533 | 3.7 |
| අම්බලන්ගොඩ | 32 | 250 | 11 | 102 | 30 | 360 | 10 | 177 | 13 | 330 | 5,366 | 5783 | 3.3 |
| ගෝනපීනුවල | 27 | 206 | 7 | 66 | 19 | 229 | 7 | 121 | 5 | 154 | 2,177 | 2929 | 1.7 |
| හික්කඩුව | 26 | 198 | 10 | 94 | 27 | 310 | 12 | 206 | 7 | 193 | 5,455 | 6000 | 3.4 |
| කඩවත්සතර | 15 | 114 | 9 | 82 | 23 | 280 | 11 | 192 | 9 | 287 | 1,505 | 2530 | 1.4 |
| බොපේ පෝද්දල | 29 | 222 | 10 | 94 | 22 | 267 | 9 | 155 | 3 | 114 | 2,511 | 3761 | 2.1 |
| අක්මීමන | 38 | 294 | 10 | 93 | 32 | 375 | 8 | 140 | 6 | 141 | 6663 | 8260 | 4.7 |
| යක්කලමුල්ල | 55 | 423 | 13 | 120 | 27 | 322 | 14 | 228 | 6 | 185 | 9745 | 12796 | 7.2 |
| ඉමදූව | 43 | 335 | 7 | 65 | 25 | 294 | 10 | 170 | 11 | 291 | 5976 | 8224 | 4.6 |
| හබරාදූව | 27 | 212 | 7 | 68 | 19 | 232 | 9 | 152 | 5 | 148 | 3878 | 4899 | 2.8 |
| **එකතුව** | **907** | **7005** | **232** | **2166** | **616** | **7282** | **209** | **3571** | **135** | **3920** | **129,101** | **177095** | **100.0** |

ගාල්ල දිස්ත්‍රික්කයේ කෘෂිකාර්මික කටයුතු සඳහා තමා සතුව බිම් කැබැල්ලක් ඇති ගොවිකාරකයින් සංඛ්‍යාව 129101 ක් වන අතර මුළු බිම් ප්‍රමාණය අක්කර 177095 ක් වේ. එම දිස්ත්‍රික්කයේ මුළු බිම් ප්‍රමාණයෙහි ප්‍රතිශත සැලකූ විට අක්කර 1 ට අඩු බිම් ප්‍රමාණය 17.6%, අක්කර 1-2 අතර 26% ,අක්කර 2-3 අතර 10%, අක්කර 3-4 අතර 17.2%, අක්කර 4-5 අතර 8% , අක්කර 5-7 අතර 10.1% , අක්කර 7-9 අතර 5.1% , අක්කර 9-10 අතර 1.6%, අක්කර 10-15 අතර 4.7%, අක්කර 15-20 අතර 1.3% හා අක්කර 20 ට වැඩි 1.6% ලෙස වාර්තා වේ.

ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස මට්ටමින් බිම් ප්‍රමාණයෙහි ප්‍රතිශත සැලකූ විට අක්කර 01ට අඩු බිම් ප්‍රමාණය යටතේ වැඩිම බිම් ප්‍රතිශතය (27.6%) පවතිනුයේ හිකක්ඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙහි වන අතර අඩුම බිම් ප්‍රතිශතය (6.8%) පවතිනුයේ නෙලුව ප්‍රාදේශීය ලේකම්

කොට්ඨාසයෙහිය. අක්කර 1 - 2 අතර බිම් ප්‍රමාණය යටතේ වැඩිම බිම් ප්‍රතිශතය (33.0%) පවතිනුයේ යක්කලමුල්ල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයෙහි වන අතර අඩුම බිම් ප්‍රතිශතය (14.31%) පවතිනුයේ ගාල්ල කඩවත්සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙහි වේ.

අක්කර 2 - 3 අතර බිම් ප්‍රමාණය යටතේ වැඩිම  බිම් ප්‍රතිශතය (26.2%)  තවලම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසය හා අඩුම බිම් ප්‍රතිශතය (11.3%) බලපිටිය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසය, අක්කර 3 - 4 අතර බිම් ප්‍රමාණය යටතේ වැඩිම බිම් ප්‍රතිශතය (14.9%) නෙලුව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසය හා අඩුම ප්‍රතිශතය (7.2%) ගාල්ල කඩවත්සතර ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසය, අක්කර 4 - 5 අතර බිම් ප්‍රමාණය වැඩිම ප්‍රතිශතය (8.6%) නියාගම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයෙන් වන අතර අඩුම ප්‍රතිශතය (4.2%) ගෝනපීනුවල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයෙන් වාර්තාවේ.

ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස මට්ටමින් ප්‍රතිශතය සැලකූ විට අක්කර 5 - 7 අතර බිම් ප්‍රමාණය යටතේ වැඩිම බිම් ප්‍රමාණයක් බෝපේපෝද්දල ප්‍රාදේශිය ලේකම් කොට්ටාසයෙන් වාර්තා වන අතර ප්‍රතිශතයක් ලෙස 11% කි.

එමෙන්ම අක්කර 7 - 9 අතර බිම් ප්‍රමාණය වැඩිම ප්‍රතිශතය (7%) වාර්තා වන්නේ ගෝනපීනුවල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයෙන් වන අතර අඩුම ප්‍රතිශතය (2.5%) කරන්දෙණිය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයෙන්ද අක්කර 9 - 10 අතර බිම් ප්‍රමාණය වැඩිම ප්‍රතිශතය (2% ) ගාල්ල කඩවත්සතර ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයෙන් වන අතර කරන්දෙණිය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයෙන් අක්කර 9 - 10 අතර අවම බිම් ප්‍රමාණයක් වාර්තා වේ.

අක්කර 10 - 15 අතර බිම් ප්‍රමාණය සැලකිල්ලට ගතහොත් වැඩිම ප්‍රතිශතය (11%) වාර්තා වන්නේ ගාල්ල කඩවත්සතර ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයෙනි. අඩුම ප්‍රතිශතය (2.4%) කරන්දෙණිය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයෙන් වාර්තා වන අතර අක්කර 15 - 20 අතර බිම් ප්‍රමාණයෙහි වැඩිම ප්‍රතිශතය (7.6% ) ද අක්කර 20 හා ඊට වැඩි බිම් ප්‍රමාණයේ වැඩිම ප්‍රතිශතය වන 11.3% ද වාර්තා වන්නේ ගාල්ල කඩවත්සතර ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයෙනි.

## 3.7. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් කාරක තත්ත්වය අනුව ගොවිකාරකයින් සංඛ්‍යාව හා ගොවි කාණ්ඩ වල බිම් ප්‍රමාණය (අක්කර) - 2014

මේ යටතේදී ගාල්ල දිස්ත්‍රික්කයේ ගොවිකාරකයාගේ කාරක තත්ත්වය අනුව ගොවිකාරකයින් සංඛ්‍යාව හා ගොවි කාණ්ඩ වල බිම් ප්‍රමාණයේ ව්‍යාප්තිය පිළිබඳ විස්තර කරනු ලබයි.

**අංක 3.7 : ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් කාරක තත්ත්වය අනුව ගොවිකාරකයින් සංඛ්‍යාව හා ගොවි කාණ්ඩ වල බිම් ප්‍රමාණය - 2014**

| ප්‍රා.ලේ.කොට්ඨාසය | තමාගේම | | ආයතනයක් වෙනුවෙන් | | පුද්ගලික අය වෙනුවෙන් | | වෙනත් අය සමඟ හවුලේ | | මුළු ගණන | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | බිම් ප්‍රමාණය (අක්කර) | සංඛ්‍යාව | බිම් ප්‍රමාණය (අක්කර) | සංඛ්‍යාව | බිම් ප්‍රමාණය (අක්කර) | සංඛ්‍යාව | බිම් ප්‍රමාණය (අක්කර) | සංඛ්‍යාව | බිම් ප්‍රමාණය (අක්කර) |
| බෙන්තොට | 5,324 | 7324 | 37 | 63 | 35 | 160 | 29 | 50 | 5425 | 7,598 |
| බලපිටිය | 4,886 | 5376 | 33 | 93 | 58 | 106 | 47 | 62 | 5024 | 5,637 |
| කරන්දෙණිය | 12,473 | 12997 | 153 | 107 | 54 | 114 | 3 | 5 | 12683 | 13,224 |
| ඇල්පිටිය | 11,990 | 17390 | 66 | 102 | 74 | 153 | 19 | 53 | 12149 | 17,698 |
| නියාගම | 7,797 | 13579 | 36 | 60 | 95 | 215 | 44 | 124 | 7972 | 13,978 |
| තවලම | 7,773 | 13952 | 54 | 102 | 46 | 110 | 17 | 31 | 7890 | 14,195 |
| නෙලුව | 6,494 | 12668 | 36 | 95 | 23 | 39 | 13 | 57 | 6566 | 12,860 |
| නාගොඩ | 11,382 | 14549 | 44 | 89 | 59 | 156 | 23 | 51 | 11508 | 14,845 |
| බද්දේගම | 10,223 | 14585 | 79 | 188 | 165 | 434 | 91 | 139 | 10558 | 15,346 |
| වැලිවිටිය- දිවිතුර | 5,591 | 6437 | 23 | 25 | 32 | 70 | 1 | 0 | 5647 | 6,533 |
| අම්බලන්ගොඩ | 5,266 | 5612 | 27 | 47 | 28 | 77 | 37 | 48 | 5358 | 5,783 |
| ගෝනපීනුවල | 2,130 | 2787 | 7 | 17 | 25 | 125 | 2 | 1 | 2164 | 2,929 |
| හික්කඩුව | 5,259 | 5580 | 52 | 111 | 96 | 276 | 28 | 32 | 5435 | 6,000 |
| කඩවත්සතර | 1,359 | 2192 | 22 | 15 | 100 | 309 | 11 | 14 | 1492 | 2,530 |
| බොපේ පෝද්දල | 2,407 | 3480 | 18 | 26 | 46 | 215 | 30 | 40 | 2501 | 3,761 |
| අක්මීමන | 6308 | 7734 | 166 | 219 | 128 | 216 | 43 | 92 | 6645 | 8260 |
| යක්කලමුල්ල | 9573 | 12512 | 27 | 67 | 43 | 114 | 33 | 103 | 9676 | 12796 |
| ඉමදූව | 5855 | 7986 | 22 | 99 | 21 | 104 | 32 | 35 | 5930 | 8224 |
| හබරාදූව | 3719 | 4586 | 45 | 72 | 92 | 229 | 11 | 13 | 3867 | 4899 |
| **එකතුව** | **125,809** | **171325** | **947** | **1597** | **1,220** | **3223** | **514** | **951** | **128490** | **177,095** |

සටහන : දිස්ත්‍රික්කය තුළ වාර්තාවී ඇති උප ගොවිකාරකයින් සංඛ්‍යාව මීට ඇතුළත් වී නොමැත.

ගාල්ල දිස්ත්‍රික්කයේ වගකීම දරන කාරක තත්ත්වය අනුව 128,490 ක ගොවිකාරකයින් සංඛ්‍යාවක් වාර්තා වන අතර ගොවි කාණ්ඩ වල ඇති මුළු බිම් ප්‍රමාණය අක්කර 177,095 කි. මෙම දිස්ත්‍රික්කයේ තමාගේම වැඩ කරන මුළු ගොවිකාරකයින් සංඛ්‍යාව 125,809 ක් වන අතර එම කාරක තත්ත්වය යටතේ ඇති ගොවි කාණ්ඩ වල මුළු බිම් ප්‍රමාණය අක්කර 171,325 ක් වේ. එම දිස්ත්‍රික්කයේ ආයතන වෙනුවෙන් වැඩ කරන ගොවිකාරකයින් සංඛ්‍යාව 947 ක් ලෙස වාර්තා වන අතර එම කාරක තත්ත්වය යටතේ ඇති ගොවි කාණ්ඩ වල මුළු බිම් ප්‍රමාණය අක්කර 1,597 කි. පුද්ගලික අය වෙනුවෙන් වැඩ කරන ගොවිකාරකයින් සංඛ්‍යාව 1220 ක් හා එම කාරක තත්ත්වය යටතේ ඇති ගොවි කාණ්ඩ වල මුළු බිම් ප්‍රමාණය අක්කර 3223 ක් ලෙස වාර්තා වේ. හවුලේ වැඩ කරන ගොවිකාරකයින් සංඛ්‍යාව 514 ක් හා එම කාරක තත්ත්වය යටතේ ඇති ගොවි කාණ්ඩ වල මුළු බිම් ප්‍රමාණය අක්කර 951 ලෙස වාර්තා වේ.

දිස්ත්‍රික්කය තුළ තමාගේම වැඩ කරන වැඩිම ගොවිකාරකයින් සංඛ්‍යාව (12,473) වාර්තා වන්නේ කරන්දෙණිය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයෙන් වන අතර එම කාරක තත්ත්වය යටතේ ඇති ගොවි කාණ්ඩ වල බිම් ප්‍රමාණයෙහි වැඩිම අගය අක්කර 17,390 වාර්තා වන්නේ ඇල්පිටිය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයෙනි. එය තමාගේම වැඩ කරන කාරක තත්ත්වය යටතේ ඇති මුළු බිම් ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස 10.1% ක් වේ. දිස්ත්‍රික්කය තුළ තමාගේම වැඩ කරන අඩුම ගොවිකාරකයින් සංඛ්‍යාවක් (1359) ක් හා අඩුම බිම් ප්‍රමාණයක් (අක්කර 2,192) ක් වාර්තා වන්නේද ගාල්ල

කඩවත්සතර ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයෙනි. එය තමාගේම වැඩ කරන කාරක තත්ත්වය යටතේ ඇති මුළු බිම් ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස 1.2% කි.


දිස්ත්‍රික්කය තුළ ආයතන වෙනුවෙන් වැඩ කරන වැඩිම ගොවිකාරකයින් සංඛ්‍යාව (166) ක් අක්මීමන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් වාර්තා වන අතර වැඩිම බිම් ප්‍රමාණය (අක්කර 219) වාර්තා වන්නේද එම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයෙනි. එය ආයතන වෙනුවෙන් වැඩ කරන මුළු බිම් ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස 13.7% ක් වේ. දිස්ත්‍රික්කය තුළ ආයතන වෙනුවෙන් වැඩ කරන අඩුම ගොවිකාරකයින් සංඛ්‍යාව (7) හා අඩුම බිම් ප්‍රමාණය (අක්කර 17) වාර්තා වන්නේ ගෝනපීනුවල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයෙනි. එය මුළු බිම් ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස 1.0% ක් වේ.

දිස්ත්‍රික්කය තුළ පුද්ගලික අය වෙනුවෙන් වැඩ කරන වැඩිම ගොවිකාරකයින් සංඛ්‍යාවක් (165) සහා වැඩිම බිම් ප්‍රමාණයක් (අක්කර 434) වාර්තා වන්නේ බද්දේගම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයෙනි. එය පුද්ගලික අය වෙනුවෙන් වැඩ කරන මුළු බිම් ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස 13.4% ක් වේ. දිස්ත්‍රික්කය තුළ පුද්ගලික අය වෙනුවෙන් වැඩ කරන අඩුම ගොවිකාරකයින් සංඛ්‍යාව (21) ඉමදුව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයෙන් වාර්තාවන අතර අඩුම බිම් ප්‍රමාණය (අක්කර 39) වාර්තා වන්නේ නෙලුව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයෙනි. එය පුද්ගලික අය වෙනුවෙන් වැඩ කරන මුළු බිම් ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස 1.2% ක් වේ.

දිස්ත්‍රික්කය තුළ වෙනත් අය සමඟ හවුලේ වැඩ කරන වැඩිම ගොවිකාරකයින් සංඛ්‍යාවක් (91) බද්දේගම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයෙන් වාර්තා වී ඇති අතර වැඩිම බිම් ප්‍රමාණයක් (අක්කර 139) වාර්තා වන්නේ ද එම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයෙනි. එය වෙනත් අය සමඟ හවුලේ වැඩ කරන මුළු බිම් ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස 14.6% ක් වේ.

සමස්තයක් ලෙස ගත් විට ගාල්ල දිස්ත්‍රික්කයේ ගොවි කාණ්ඩයට අදාළ ගොවි කාරකයාගේ කාරක තත්ත්වය අනුව වැඩිම ගොවිකාරකයින් සංඛ්‍යාවක් හා වැඩිම බිම් ප්‍රමාණයක් වාර්තා වන්නේ තමාගේම වැඩ කරන අංශයෙනි. මෙම දිස්ත්‍රික්කයේ ගොවි කාණ්ඩයට අදාළ ගොවි කාරකයාගේ කාරක තත්ත්වය අනුව අඩුම ගොවිකාරකයින් සංඛ්‍යාවක් හා අඩුම බිම් ප්‍රමාණයක් වාර්තා වන්නේ වෙනත් අය සමඟ හවුලේ වැඩ කරන අංශයෙනි.

**රූප සටහන 07 - කාරක තත්ත්වය අනුව ගොවිකාරකයින් - 2014**




* මෙම රූප සටහනෙහි වෙනත් යටතේ ආයතනයක් වෙනුවෙන්, පුද්ගලික අය වෙනුවෙන්, වෙනත් අය සමඟ හවුලේ යන තුනෙහිම එකතුව දැක්වේ.

## 3.8 : ගොවි කාණ්ඩයේ විශාලත්වය සහ කාරක තත්ත්වය අනුව ගොවිකාරකයින් සංඛ්‍යාව හා ගොවි කාණ්ඩ වල බිම් ප්‍රමාණය (අක්කර) - 2014

ගාල්ල දිස්ත්‍රික්කය තුළ වාර්තා වි ඇති ගොවිකාරකයින් සංඛ්‍යාව හා ගොවි කාණ්ඩ වල බිම් ප්‍රමාණය ගොවිකාරකයාගේ කාරක තත්ත්වය හා ගොවි කාණ්ඩයේ විශාලත්වය අනුව විස්තර කරනු ලබයි. මෙහිදී කාරක තත්ත්වය තමාගේම, ආයතනයක් වෙනුවෙන්, පුද්ගලික අය වෙනුවෙන් හා වෙනත් අය සමග හවුලේ වැඩ කරන වශයෙන් කොටස් හතරකට බෙදා ඇත.

**වගු අංක 3.8 : ගොවි කාණ්ඩයේ විශාලත්වය සහ කාරක තත්ත්වය අනුව ගොවිකාරකයින් සංඛ්‍යාව හා ගොවි කාණ්ඩ වල බිම් ප්‍රමාණය (අක්කර) - 2014**

| බිම් කැබැල්ලේ විශාලත්වය | තමාගේම | | ආයතනයක් වෙනුවෙන් | | පුද්ගලික අය වෙනුවෙන් | | වෙනත් අය සමඟ හවුලේ | | මුළු ගණන | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | බිම් ප්‍රමාණය (අක්කර) | සංඛ්‍යාව | බිම් ප්‍රමාණය (අක්කර) | සංඛ්‍යාව | බිම් ප්‍රමාණය (අක්කර) | සංඛ්‍යාව | බිම් ප්‍රමාණය (අක්කර) | සංඛ්‍යාව | බිම් ප්‍රමාණය අක්කර |
| අක්කර 1/4 ට අඩු | 6,672 | 1,063 | 58 | 9 | 17 | 2 | 14 | 2 | 6,761 | 1,076 |
| අක්කර 1/4-1/2 | 22,969 | 7,401 | 184 | 58 | 116 | 39 | 71 | 24 | 23,340 | 7,522 |
| අක්කර 1/2-1 | 35,181 | 22,123 | 270 | 167 | 241 | 150 | 150 | 95 | 35,842 | 22,534 |
| අක්කර 1-2 | 35,013 | 45,085 | 242 | 298 | 326 | 419 | 138 | 181 | 35,719 | 45,984 |
| අක්කර 2-3 | 13,684 | 31,506 | 71 | 159 | 207 | 457 | 65 | 149 | 14,027 | 32,271 |
| අක්කර 3-4 | 5,547 | 18,402 | 35 | 114 | 91 | 297 | 25 | 82 | 5,698 | 18,894 |
| අක්කර 4-5 | 2,556 | 11,063 | 16 | 68 | 57 | 243 | 21 | 90 | 2,650 | 11,464 |
| අක්කර 5-7 | 1,474 | 7,848 | 13 | 67 | 48 | 247 | 6 | 31 | 1,541 | 8,193 |
| අක්කර 7-10 | 1,845 | 13,557 | 28 | 205 | 65 | 479 | 12 | 90 | 1,950 | 14,331 |
| අක්කර 10-20 | 746 | 9,786 | 26 | 357 | 43 | 565 | 11 | 160 | 826 | 10,867 |
| අක්කර 20 | 122 | 3,490 | 4 | 95 | 9 | 326 | 1 | 47 | 136 | 3,958 |
| එකතුව | **125,809** | **171,325** | **947** | **1,597** | **1,220** | **3,223** | **514** | **951** | **128,490** | **177,095** |

සටහන : දිස්ත්‍රික්කය තුළ වාර්තාවී ඇති උප ගොවිකාරකයින් සංඛ්‍යාව මීට ඇතුළත් වී නොමැත.

ගාල්ල දිස්ත්‍රික්කය තුළ තමාගේම කාරක තත්ත්වය යටතේ වැඩිම ගොවිකාරකයින් සංඛ්‍යාව (35,181) වාර්තා වන්නේ ගොවි කාණ්ඩයේ විශාලත්වය අක්කර 1/2-1 යටතේ වන අතර වැඩිම බිම් ප්‍රමාණය (අක්කර 45,085) වාර්තා වි ඇත්තේ ගොවි කාණ්ඩයේ විශාලත්වය අක්කර 1-2 යටතේය.

ආයතනයක් වෙනුවෙන් කාරක තත්ත්වය දරන වැඩිම ගොවිකාරකයින් සංඛ්‍යාව (270) ක් වාර්තා වන්නේ ගොවි කාණ්ඩයේ විශාලත්වය අක්කර 1/2-1 හා වැඩිම බිම් ප්‍රමාණය (අක්කර 298) වාර්තා වන්නේ ගොවි කාණ්ඩයේ විශාලත්වය අක්කර 1-2 යටතේය.

පුද්ගලික අය වෙනුවෙන් කාරක තත්ත්වය දරන වැඩිම ගොවිකාරකයින් සංඛ්‍යාව (326) වාර්තා වන්නේ ගොවි කාණ්ඩයේ විශාලත්වය අක්කර 1/2-1 යටතේ වන අතර වැඩිම බිම් ප්‍රමාණය (අක්කර 565) ගොවි කාණ්ඩයේ විශාලත්වය අක්කර 10-20 යටතේ වාර්තාවී ඇත.

වෙනත් අය සමග හවුලේ කාරක තත්ත්වය දරන වැඩිම ගොවිකාරකයින් සංඛ්‍යාව (150) වාර්තා වන්නේ ගොවි කාණ්ඩයේ විශාලත්වය අක්කර 1/2-1 යටතේ වන අතර වැඩිම බිම් ප්‍රමාණය (අක්කර 181) ගොවි කාණ්ඩයේ විශාලත්වය අක්කර 1- 2 යටතේ වාර්තාවී ඇත.

## 3.9 : ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ස්ත්‍රී/පුරුෂ භාවය අනුව කෘෂිකාර්මික කටයුතුවල නිරත ගොවිකාරකයින් සංඛ්‍යාව - 2014

මේ යටතේ ගාල්ල දිස්ත්‍රික්කයේ පර්චස් 40 ට වැඩි හෝ කෘෂි නිෂ්පාදනයෙන් වැඩි කොටසක් අලෙවිය සඳහා යොදා ගන්නා ගොවිකාරකයින් ඔවුන් නිරත කෘෂිකාර්මික කටයුත්ත හා ඔවුන්ගේ ස්ත්‍රී / පුරුෂ භාවය අනුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස පදනම් කර ගනිමින් විස්තර කරනු ලබයි.

**වගු අංක 3.9 : ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ස්ත්‍රී/පුරුෂ භාවය අනුව කෘෂිකාර්මික කටයුතුවල නිරත ගොවිකාරකයින් සංඛ්‍යාව - 2014**

| කෘෂිකාර්මික කටයුතුවල නිරත වූ ගොවිකාරකයන් සංඛ්‍යාව | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| වී වගාව | | | තේ වගාව | | | රබර් වගාව | | | පොල් වගාව | | | වෙනත් ස්ථිර බෝග වගාව | | | වෙනත් කාලීන බෝග වගාව | | |
| ගොවිකාරකයන් සංඛ්‍යාව | පුරුෂ | ස්ත්‍රී | ගොවිකාරකයන් සංඛ්‍යාව | පුරුෂ | ස්ත්‍රී | ගොවිකාරකයන් සංඛ්‍යාව | පුරුෂ | ස්ත්‍රී | ගොවිකාරකයන් සංඛ්‍යාව | පුරුෂ | ස්ත්‍රී | ගොවිකාරකයන් සංඛ්‍යාව | පුරුෂ | ස්ත්‍රී | ගොවිකාරකයන් සංඛ්‍යාව | පුරුෂ | ස්ත්‍රී |
| 907 | 765 | 142 | 1042 | 846 | 196 | 305 | 252 | 53 | 4,682 | 3,606 | 1076 | 4,754 | 3636 | 1,118 | 1180 | 921 | 259 |
| 374 | 318 | 56 | 30 | 27 | 3 | 29 | 23 | 6 | 4,686 | 3,340 | 1346 | 4,601 | 3300 | 1,301 | 1649 | 1198 | 451 |
| 2,502 | 1977 | 525 | 2004 | 1,571 | 433 | 63 | 47 | 16 | 11,638 | 8,534 | 3104 | 12,019 | 8796 | 3,223 | 1915 | 1431 | 484 |
| 3,909 | 3157 | 752 | 9707 | 7,568 | 2139 | 586 | 459 | 127 | 10,828 | 8,405 | 2423 | 10,345 | 8070 | 2,275 | 4842 | 3780 | 1,062 |
| 2,890 | 2399 | 491 | 7587 | 6,177 | 1410 | 603 | 517 | 86 | 5,307 | 4,316 | 991 | 4,910 | 4011 | 899 | 1547 | 1284 | 263 |
| 1,166 | 1032 | 134 | 7743 | 6,515 | 1228 | 216 | 198 | 18 | 6,794 | 5,740 | 1054 | 6,152 | 5197 | 955 | 1955 | 1666 | 289 |
| 1,030 | 923 | 107 | 6464 | 5,585 | 879 | 130 | 118 | 12 | 5,821 | 5,027 | 794 | 5,358 | 4641 | 717 | 2556 | 2206 | 350 |
| 1,957 | 1686 | 271 | 11085 | 9,010 | 2075 | 294 | 265 | 29 | 10,157 | 8,292 | 1865 | 9,477 | 7774 | 1,703 | 4960 | 4135 | 825 |
| 2,950 | 2547 | 403 | 8327 | 6,817 | 1510 | 123 | 111 | 12 | 8,849 | 7,236 | 1613 | 8,821 | 7210 | 1,611 | 3410 | 2827 | 583 |
| 1,320 | 1090 | 230 | 4105 | 3,201 | 904 | 65 | 59 | 6 | 4,742 | 3,686 | 1056 | 4,695 | 3661 | 1,034 | 892 | 704 | 188 |
| 667 | 558 | 109 | 273 | 219 | 54 | 12 | 11 | 1 | 4,563 | 3,598 | 965 | 5,124 | 4041 | 1,083 | 1940 | 1543 | 397 |
| 505 | 448 | 57 | 75 | 63 | 12 | 17 | 11 | 6 | 2,005 | 1,627 | 378 | 2,061 | 1662 | 399 | 611 | 510 | 101 |
| 942 | 778 | 164 | 83 | 69 | 14 | 8 | 6 | 2 | 5,096 | 3,886 | 1210 | 4,688 | 3583 | 1,105 | 1371 | 1082 | 289 |
| 93 | 84 | 9 | 224 | 187 | 37 | 12 | 12 | 0 | 1,178 | 929 | 249 | 1,082 | 845 | 237 | 259 | 206 | 53 |
| 583 | 509 | 74 | 1103 | 912 | 191 | 17 | 15 | 2 | 2,152 | 1,767 | 385 | 2,055 | 1691 | 364 | 644 | 529 | 115 |
| 836 | 708 | 128 | 4511 | 3557 | 954 | 19 | 17 | 2 | 4996 | 3878 | 1118 | 4758 | 3725 | 1033 | 1358 | 1047 | 311 |
| 1229 | 1055 | 174 | 9104 | 7396 | 1708 | 122 | 105 | 17 | 8371 | 6801 | 1570 | 7782 | 6328 | 1454 | 3089 | 2578 | 511 |
| 1624 | 1354 | 270 | 4005 | 3167 | 838 | 28 | 22 | 6 | 4939 | 3908 | 1031 | 5024 | 3982 | 1042 | 2013 | 1592 | 421 |
| 789 | 649 | 140 | 425 | 342 | 83 | 13 | 10 | 3 | 3633 | 2755 | 878 | 3526 | 2676 | 850 | 1071 | 830 | 241 |
| **26,273** | **22037** | **4,236** | **77897** | **63,229** | **14668** | **2662** | **2,258** | **404** | **110,437** | **87,331** | **23106** | **107,232** | **84829** | **22,403** | **37262** | **30069** | **7,193** |

| කෘෂිකාර්මික කටයුතුවල නිරත වූ ගොවිකාරකයන් සංඛ්‍යාව | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ගව පාලනය | | | එළු පාලනය | | | ඌරු පාලනය | | | කුකුළු පාලනය | | | වෙනත් සත්ත්ව පාලනයන් | | | ජලජීවී වගාව | | |
| ගොවිකාරකයන් සංඛ්‍යාව | පුරුෂ | ස්ත්‍රී | ගොවිකාරකයන් සංඛ්‍යාව | පුරුෂ | ස්ත්‍රී | ගොවිකාරකයන් සංඛ්‍යාව | පුරුෂ | ස්ත්‍රී | ගොවිකාරකයන් සංඛ්‍යාව | පුරුෂ | ස්ත්‍රී | ගොවිකාරකයන් සංඛ්‍යාව | පුරුෂ | ස්ත්‍රී | ගොවිකාරකයන් සංඛ්‍යාව | පුරුෂ | ස්ත්‍රී |
| 129 | 120 | 9 | 10 | 10 | 0 | 0 | 0 | 0 | 148 | 120 | 28 | 4 | 4 | 0 | 5 | 5 | 0 |
| 64 | 54 | 10 | 9 | 5 | 4 | 3 | 1 | 2 | 97 | 72 | 25 | 3 | 2 | 1 | 42 | 36 | 6 |
| 91 | 84 | 7 | 14 | 14 | 0 | 3 | 3 | 0 | 277 | 237 | 40 | 6 | 5 | 1 | 14 | 14 | 0 |
| 222 | 198 | 24 | 16 | 14 | 2 | 3 | 2 | 1 | 278 | 238 | 40 | 8 | 7 | 1 | 12 | 11 | 1 |
| 111 | 100 | 11 | 7 | 7 | 0 | 3 | 3 | 0 | 127 | 115 | 12 | 4 | 4 | 0 | 10 | 9 | 1 |
| 111 | 103 | 8 | 12 | 11 | 1 | 1 | 1 | 0 | 178 | 164 | 14 | 2 | 1 | 1 | 4 | 3 | 1 |
| 128 | 119 | 9 | 17 | 17 | 0 | 0 | 0 | 0 | 165 | 154 | 11 | 3 | 3 | 0 | 4 | 4 | 0 |
| 231 | 218 | 13 | 44 | 39 | 5 | 2 | 2 | 0 | 332 | 298 | 34 | 2 | 2 | 0 | 19 | 17 | 2 |
| 361 | 344 | 17 | 42 | 37 | 5 | 0 | 0 | 0 | 292 | 252 | 40 | 7 | 7 | 0 | 9 | 8 | 1 |
| 124 | 118 | 6 | 19 | 18 | 1 | 1 | 1 | 0 | 150 | 134 | 16 | 2 | 2 | 0 | 1 | 1 | 0 |
| 106 | 98 | 8 | 5 | 4 | 1 | 1 | 1 | 0 | 139 | 121 | 18 | 1 | 1 | 0 | 13 | 13 | 0 |
| 80 | 72 | 8 | 8 | 7 | 1 | 0 | 0 | 0 | 85 | 73 | 12 | 5 | 5 | 0 | 1 | 1 | 0 |
| 293 | 255 | 38 | 10 | 9 | 1 | 8 | 8 | 0 | 167 | 134 | 33 | 13 | 13 | 0 | 15 | 13 | 2 |
| 43 | 38 | 5 | 22 | 15 | 7 | 0 | 0 | 0 | 49 | 34 | 15 | 7 | 6 | 1 | 0 | 0 | 0 |
| 110 | 101 | 9 | 17 | 15 | 2 | 1 | 1 | 0 | 68 | 60 | 8 | 3 | 2 | 1 | 2 | 2 | 0 |
| 141 | 129 | 12 | 38 | 34 | 4 | 3 | 3 | 0 | 153 | 122 | 31 | 7 | 5 | 2 | 2 | 2 | 0 |
| 218 | 200 | 18 | 33 | 33 | 0 | 2 | 1 | 1 | 207 | 180 | 27 | 3 | 3 | 0 | 8 | 8 | 0 |
| 187 | 164 | 23 | 25 | 23 | 2 | 1 | 1 | 0 | 97 | 85 | 12 | 1 | 1 | 0 | 2 | 2 | 0 |
| 135 | 118 | 17 | 9 | 8 | 1 | 1 | 1 | 0 | 110 | 94 | 16 | 4 | 4 | 0 | 3 | 3 | 0 |
| **2885** | **2,633** | **252** | **357** | **320** | **37** | **33** | **29** | **4** | **3,119** | **2687** | **432** | **85** | **77** | **8** | **166** | **152** | **14** |

ඒ අනුව ගාල්ල දිස්ත්‍රික්කය තුළ වී වගාවේ නිරත වූ බවට වාර්තාවී ඇති මුළු ගොවිකාරකයින් සංඛ්‍යාව 26273 ක් වන අතර එහි වී වගාවේ නිරත වූ පුරුෂයින් සංඛ්‍යාව 22,037ක් ද ස්ත්‍රීන් සංඛ්‍යාව 4,236 ක් ද වේ.

දිස්ත්‍රික්කය තුල ගොවිකාරකයින් පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සැලකිල්ලට ගතහොත් වී වගාවේ නිරතවී ඇති වැඩිම ගොවිකාරකයින් සංඛ්‍යාව (3,909) ඇල්පිටිය ප්‍රාදේශීය ලේකම්

කොට්ඨාසයෙන් වාර්තා වන අතර එය ප්‍රතිශතයක් ලෙස 14.8% කි. එහි වී වගාවේ නිරත පුරුෂ ගොවිකාරකයින් සංඛ්‍යාව 3,157 ක් වන අතර ස්ත්‍රී ගොවිකාරකයින් සංඛ්‍යාව 752 ක් වේ. දෙවනුවට වැඩිම ගොවිකාරකයින් සංඛ්‍යාව වී වගාවේ නිරත වූ බවට වාර්තාවී ඇත්තේ බද්දේගම (2,950) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් වන අතර එය 13.1%ක ප්‍රතිශතයකි. එහි පුරුෂ ගොවිකාරකයින් 2,547 ක් ද ස්ත්‍රී ගොවිකාරකයින් 403 ක් ද වාර්තාවී ඇත. එමෙන්ම අඩුම ගොවිකාරකයින් සංඛ්‍යාවක් වාර්තාවී ඇති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ගාල්ල කඩවත්සතර (93) වේ. එය ප්‍රතිශතයක් වශයෙන් 0.3% ක අගයකි. මෙහි වී වගාවේ නිරත වූ පුරුෂ ගොවිකාරකයින් 84 ක් සිටින අතර ස්ත්‍රී ගොවිකාරකයින් සංඛ්‍යාව 9 කි.

මෙම දිස්ත්‍රික්කය තුළ තේ වගාවේ නිරත වූ බවට වාර්තාවී ඇති ගොවිකාරකයින් සංඛ්‍යාව 77,897ක් වන අතර තේ වගාවේ නිරත වූ පුරුෂයින් සංඛ්‍යාව 63,229ක් ද ස්ත්‍රීන් සංඛ්‍යාව 14,668ක් ද වේ. තේ වගාවේ නිරත ගොවි කාරකයින්ගෙන් වැඩිම ප්‍රමාණයක් (11,085) සිටිනුයේ නාගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වන අතර ප්‍රතිශතයක් ලෙස 14% කි. එහි තේ වගාවේ නිරත පුරුෂ ගොවිකාරකයින් ගණන 9,010 ක් ද ස්ත්‍රී ගොවිකාරකයින් ගණන 2,075 ක්ද වේ. තේ වගාවේ නිරත අඩුම ගොවිකාරකයින් ගණන (30) බලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ටාසයෙන් වාර්තා වේ.

රබර් වගාවේ නිරත වූ බවට වාර්තාවී ඇති ගොවිකාරකයින් සංඛ්‍යාව 2,662 ක් වන අතර රබර් වගාවේ නිරත පුරුෂ ගොවිකාරකයින් සංඛ්‍යාව 2,258 ක්ද ස්ත්‍රී ගොවිකාරකයින් ගණන 404 ක් ද වේ. රබර් වගාව සිදු කරනු ලබන ගොවිකාරකයින් වැඩිපුරම (603) සිටින ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය නියාගම වේ. රබර් වගාවේ නිරත අඩුම ගොවිකාරකයින් සංඛ්‍යාව (8) හික්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසෙයන් වාර්තා වේ.

දිස්ත්‍රික්කය තුළ පොල් වගාවේ නිරත වූ බවට වාර්තාවී ඇති මුළු ගොවිකාරකයින් සංඛ්‍යාව 110,437 ක් වන අතර එහි පොල් වගාවේ නිරත වූ පුරුෂයින් සංඛ්‍යාව 87,331 ක් ද ස්ත්‍රීන් සංඛ්‍යාව 23,106ක් ද වේ.

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් සැලකිල්ලට ගතහොත් වැඩිම ගොවිකාරකයින් සංඛ්‍යාවක් පොල් වගාවේ නිරතවී ඇත්තේ කරන්දෙණිය (11,638) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් වන අතර එය ප්‍රතිශතයක් ලෙස 10.5% කි. දෙවනුවට වැඩිම ගොවිකාරකයින් සංඛ්‍යාවක් (10,828) පොල් වගාවේ නිරත වූ බවට වාර්තාවී ඇත්තේ ඇල්පිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් වන අතර එය 11% ක ප්‍රතිශතයකි. අඩුම ගොවිකාරකයින් සංඛ්‍යාවක් වාර්තාවී ඇති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය කඩවත්සතර (1178) වේ. එය ප්‍රතිශතයක් වශයෙන් 1.06% ක අගයකි.

දිස්ත්‍රික්කය තුළ වෙනත් ස්ථිර බෝග වගාවේ නිරත වූ බවට වාර්තාවී ඇති මුළු ගොවිකාරකයින් සංඛ්‍යාව 107,232 ක් වන අතර පුරුෂයින් සංඛ්‍යාව 84,829 ක් ද ස්ත්‍රීන් සංඛ්‍යාව 22,403 ක් ද වේ.

දිස්ත්‍රික්කය තුල ගොවිකාරකයින් පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සැලකිල්ලට ගතහොත් වෙනත් ස්ථිර බෝග වගාවේ නිරතවී ඇති වැඩිම ගොවිකාරකයින් සංඛ්‍යාව කරන්දෙණිය (12,109) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් වාර්තා වන අතර එය ප්‍රතිශතයක් ලෙස 11.2% කි. දෙවනුවට වැඩිම ගොවිකාරකයින් සංඛ්‍යාව (10,345) වෙනත් ස්ථිර බෝග වගාවේ නිරත වූ බවට වාර්තාවී ඇත්තේ ඇල්පිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් වන අතර එය 10.8% ක ප්‍රතිශතයකි. අඩුම ගොවිකාරකයින් සංඛ්‍යාවක් (1,082) වාර්තාවී ඇති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ගාල්ල කඩවත්සතර වේ. එය ප්‍රතිශතයක් වශයෙන් 1.0% ක අගයකි.

දිස්ත්‍රික්කය තුළ වෙනත් කාලීන බෝග වගාවේ නිරත වූ බවට වාර්තාවී ඇති මුළු ගොවිකාරකයින් සංඛ්‍යාව 37,262 ක් වන අතර එම වගාවේ නිරත වූ පුරුෂයින් සංඛ්‍යාව 30,069 ක් ද ස්ත්‍රීන් සංඛ්‍යාව 7,193 ක් ද වේ.

දිස්ත්‍රික්කය තුල ගොවිකාරකයින් පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සැලකිල්ලට ගතහොත් වෙනත් කාලීන බෝග වගාවේ නිරතවී ඇති වැඩිම ගොවිකාරකයින් සංඛ්‍යාව (4,960) නාගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් වාර්තා වන අතර එය ප්‍රතිශතයක් ලෙස 13.3% කි. දෙවනුවට වැඩිම ගොවිකාරකයින් සංඛ්‍යාව (4,842) වාර්තාවී ඇත්තේ ඇල්පිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් වන අතර එය 15ග0%ක ප්‍රතිශතයකි. අඩුම ගොවිකාරකයින් සංඛ්‍යාව (259) වාර්තාවී ඇති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ගාල්ල කඩවත්සතර වේ.

දිස්ත්‍රික්කය තුළ ගව පාලනයේ නිරත වූ බවට වාර්තාවී ඇති මුළු ගොවිකාරකයින් සංඛ්‍යාව 2,885 ක් වන අතර එහි ගව පාලනයේ නිරත වූ පුරුෂයින් සංඛ්‍යාව 2,633 ක් ද ස්ත්‍රීන් සංඛ්‍යාව 252 ක් ද වේ.

දිස්ත්‍රික්කය තුල ගොවිකාරකයින් පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සැලකිල්ලට ගතහොත් ගව පාලනයේ නිරතවී ඇති වැඩිම ගොවිකාරකයින් සංඛ්‍යාව බද්දේගම (361) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් වාර්තා වන අතර එය ප්‍රතිශතයක් ලෙස 12.5% කි. දෙවනුවට වැඩිම ගොවිකාරකයින් සංඛ්‍යාව වාර්තාවී ඇත්තේ හික්කඩුව (293) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් වන අතර එය 11.6% කි. අඩුම ගොවිකාරකයින් සංඛ්‍යාව (43) වාර්තාවී ඇති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ගාල්ල කඩවත්සතර වේ. එය ප්‍රතිශතයක් වශයෙන් 1.5% ක අගයකි.

දිස්ත්‍රික්කය තුළ එළු පාලනයේ නිරත වූ බවට වාර්තාවී ඇති මුළු ගොවිකාරකයින් සංඛ්‍යාව 357 ක් වන අතර එහි එළු පාලනයේ නිරත වූ පුරුෂයින් සංඛ්‍යාව 320ක් ද ස්ත්‍රීන් සංඛ්‍යාව 37ක් ද වේ.

දිස්ත්‍රික්කය තුල ගොවිකාරකයින් පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සැලකිල්ලට ගතහොත් එළු පාලනයේ නිරතවී ඇති වැඩිම ගොවිකාරකයින් සංඛ්‍යාව නාගොඩ (44) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් වාර්තා වන අතර එය ප්‍රතිශතයක් ලෙස 12.3% කි. දෙවනුවට වැඩිම ගොවිකාරකයින් සංඛ්‍යාව (42) එළු පාලනයේ නිරත වූ බවට වාර්තාවී ඇත්තේ බද්දේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් වන අතර එය 13.4% ක ප්‍රතිශතයකි. අඩුම ගොවිකාරකයින් සංඛ්‍යාව (5) වාර්තා වී ඇති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අම්බලන්ගොඩ වේ. එය ප්‍රතිශතයක් වශයෙන් 1.4% ක අගයකි.

දිස්ත්‍රික්කය තුළ ඌරන් පාලනය ද ඉතාමත් සුළු වශයෙන් සිදු කෙරෙන බවට වාර්තාවී ඇති අතර ඌරන් පාලනයේ නිරත වූ බවට වාර්තාවී ඇති මුළු ගොවිකාරකයින් සංඛ්‍යාව 33ක් වන අතර පුරුෂ ගොවිකාරකයින් සංඛ්‍යාව 29 ක් සහ ස්ත්‍රී ගොවිකාරකයින් සංඛ්‍යාව 4 ක් වාර්තා වී ඇත. දිස්ත්‍රික්කය තුළ කුකුළු පාලනයේ නිරත වූ බවට වාර්තාවී ඇති මුළු ගොවිකාරකයින් සංඛ්‍යාව 3,119 ක් වන අතර එහි කුකුළු පාලනයේ නිරත වූ පුරුෂයින් සංඛ්‍යාව 2,687 ක් ද ස්ත්‍රීන් සංඛ්‍යාව 432 ක් ද වේ.

දිස්ත්‍රික්කය තුල ගොවිකාරකයින් පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සැලකිල්ලට ගතහොත් කුකුළු පාලනයේ නිරතවී ඇති වැඩිම ගොවිකාරකයින් සංඛ්‍යාව (332) නාගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් වාර්තා වන අතර එය ප්‍රතිශතයක් ලෙස 10.6% කි. අඩුම ගොවිකාරකයින් සංඛ්‍යාව (49) වාර්තාවී ඇති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ගාල්ල කඩවත්සතර වේ. එය ප්‍රතිශතයක් වශයෙන් 1.5% ක අගයකි.


දිස්ත්‍රික්කය තුළ වෙනත් සත්ත්ව පාලනයේ නිරත වූ බවට වාර්තාවී ඇති මුළු ගොවිකාරකයින් සංඛ්‍යාව 85 ක් වන අතර එහි වෙනත් සත්ත්ව පාලනයේ නිරත වූ පුරුෂයින් සංඛ්‍යාව 77 ක් ද ස්ත්‍රීන් සංඛ්‍යාව 8 ක් ද වේ.

දිස්ත්‍රික්කය තුල ගොවිකාරකයින් පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සැලකිල්ලට ගතහොත් වෙනත් සත්ත්ව පාලනයේ නිරතවී ඇති වැඩිම ගොවිකාරකයින් සංඛ්‍යාව (13) හික්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් වාර්තා වන අතර එය ප්‍රතිශතයක් ලෙස 15.3% කි. දෙවනුවට වෙනත් සත්ත්ව

පාලනයේ නිරත වූ බවට වාර්තාවී ඇති වැඩිම ගොවිකාරකයින් සංඛ්‍යාවක් (8) ඇල්පිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් වාර්තා වන අතර එය 11.1% ක ප්‍රතිශතයකි.

දිස්ත්‍රික්කය තුළ ජල ජීවි වගාව සිදු කෙරෙන බවට වාර්තාවී ඇති අතර එහි නිරත වූ බවට වාර්තාවී ඇති මුළු ගොවිකාරකයින් සංඛ්‍යාව 166 ක් වන අතර පුරුෂ ගොවිකාරකයින් 152 ක් සහ ස්ත්‍රී ගොවිකාරකයින් 14 ක් ලෙස වේ. බලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් වැඩිම ගොවිකාරකයින් සංඛ්‍යාව වන 42 වාරතා වේ.

**රූප සටහන 08 - ස්ත්‍රී / පුරුෂ භාවය අනුව කෘෂිකාර්මික කටයුතුවල නිරත ගොවිකාරකයින් - 2014**



## 3.10 : ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ස්ත්‍රී/පුරුෂ භාවය අනුව කෘෂිකාර්මික කටයුතුවල නිරතව සිටි ගොවිකාරකයින් සංඛ්‍යාවෙහි ප්‍රතිශතය - 2014

එක් එක් ගොවි කාණ්ඩවල ගොවිකාරකයින් නිරතව සිටි ආර්ථික කටයුතු පිළිබඳව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් විස්තර කරනු ලබයි.

**වගු අංක 3.10 : ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ස්ත්‍රී/පුරුෂ භාවය අනුව කෘෂිකාර්මික කටයුතුවල නිරතව සිටි ගොවිකාරකයින් සංඛ්‍යාවෙහි ප්‍රතිශතය - 2014**

| ප්‍රා.ලේ.කොට්ඨාසය | කෘෂිකාර්මික කටයුතුවල නිරත වූ ගොවිකාරකයන් සංඛ්‍යාව | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | වී වගාව | | | තේ වගාව | | | රබර් වගාව | | | පොල් වගාව | | | වෙනත් ස්ථිර බෝග වගාව | | | වෙනත් කාලීන බෝග වගාව | | |
| | එකතුව | පුරුෂ | ස්ත්‍රී | එකතුව | පුරුෂ | ස්ත්‍රී | එකතුව | පුරුෂ | ස්ත්‍රී | එකතුව | පුරුෂ | ස්ත්‍රී | එකතුව | පුරුෂ | ස්ත්‍රී | එකතුව | පුරුෂ | ස්ත්‍රී |
| බෙන්තොට | 16.71 | 18.38 | 11.22 | 19.20 | 20.33 | 15.48 | 5.62 | 6.05 | 4.19 | 86.26 | 86.64 | 84.99 | 87.58 | 87.36 | 88.31 | 21.74 | 22.13 | 20.46 |
| බලපිටිය | 7.44 | 8.83 | 3.92 | 0.60 | 0.75 | 0.21 | 0.58 | 0.64 | 0.42 | 93.18 | 92.75 | 94.26 | 91.49 | 91.64 | 91.11 | 32.79 | 33.27 | 31.58 |
| කරණ්දෙනිය | 19.67 | 21.22 | 15.41 | 15.75 | 16.87 | 12.71 | 0.50 | 0.50 | 0.47 | 91.48 | 91.62 | 91.11 | 94.47 | 94.43 | 94.60 | 15.05 | 15.36 | 14.21 |
| ඇල්පිටිය | 32.14 | 33.49 | 27.50 | 79.81 | 80.28 | 78.21 | 4.82 | 4.87 | 4.64 | 89.03 | 89.16 | 88.59 | 85.06 | 85.61 | 83.18 | 39.81 | 40.10 | 38.83 |
| නියාගම | 36.12 | 36.88 | 32.82 | 94.83 | 94.96 | 94.25 | 7.54 | 7.95 | 5.75 | 66.33 | 66.35 | 66.24 | 61.37 | 61.66 | 60.09 | 19.34 | 19.74 | 17.58 |
| තවලම | 14.64 | 15.44 | 10.44 | 97.20 | 97.49 | 95.71 | 2.71 | 2.96 | 1.40 | 85.29 | 85.89 | 82.15 | 77.23 | 77.76 | 74.43 | 24.54 | 24.93 | 22.53 |
| නෙලුව | 15.43 | 16.07 | 11.52 | 96.85 | 97.21 | 94.62 | 1.95 | 2.05 | 1.29 | 87.22 | 87.50 | 85.47 | 80.28 | 80.78 | 77.18 | 38.30 | 38.40 | 37.67 |
| නාගොඩ | 16.85 | 17.88 | 12.40 | 95.42 | 95.53 | 94.97 | 2.53 | 2.81 | 1.33 | 87.43 | 87.91 | 85.35 | 81.58 | 82.42 | 77.94 | 42.70 | 43.84 | 37.76 |
| බද්දේගම | 27.89 | 29.43 | 20.97 | 78.73 | 78.76 | 78.56 | 1.16 | 1.28 | 0.62 | 83.66 | 83.60 | 83.92 | 83.40 | 83.30 | 83.82 | 32.24 | 32.66 | 30.33 |
| වැලිවිටිය- දිවිතුර | 23.37 | 24.76 | 18.44 | 72.67 | 72.72 | 72.49 | 1.15 | 1.34 | 0.48 | 83.94 | 83.73 | 84.68 | 83.11 | 83.17 | 82.92 | 15.79 | 15.99 | 15.08 |
| අම්බලන්ගොඩ | 12.43 | 13.17 | 9.65 | 5.09 | 5.17 | 4.78 | 0.22 | 0.26 | 0.09 | 85.04 | 84.92 | 85.47 | 95.49 | 95.37 | 95.93 | 36.15 | 36.42 | 35.16 |
| ගෝනපීනුවල | 23.20 | 25.41 | 13.77 | 3.45 | 3.57 | 2.90 | 0.78 | 0.62 | 1.45 | 92.10 | 92.29 | 91.30 | 94.67 | 94.27 | 96.38 | 28.07 | 28.93 | 24.40 |
| හික්කඩුව | 17.27 | 18.71 | 12.64 | 1.52 | 1.66 | 1.08 | 0.15 | 0.14 | 0.15 | 93.42 | 93.46 | 93.29 | 85.94 | 86.17 | 85.20 | 25.13 | 26.02 | 22.28 |
| කඩවත්සතර | 6.18 | 7.09 | 2.80 | 14.88 | 15.79 | 11.53 | 0.80 | 1.01 | 0.00 | 78.27 | 78.46 | 77.57 | 71.89 | 71.37 | 73.83 | 17.21 | 17.40 | 16.51 |
| බොපේ පෝද්දල | 23.22 | 24.57 | 16.86 | 43.93 | 44.02 | 43.51 | 0.68 | 0.72 | 0.46 | 85.70 | 85.28 | 87.70 | 81.84 | 81.61 | 82.92 | 25.65 | 25.53 | 26.20 |
| අක්මීමන | 12.55 | 13.52 | 8.96 | 67.70 | 67.95 | 66.81 | 0.29 | 0.32 | 0.14 | 74.98 | 74.08 | 78.29 | 71.41 | 71.16 | 72.34 | 20.38 | 20.00 | 21.78 |
| යක්කලමුල්ල | 12.61 | 13.32 | 9.54 | 93.42 | 93.37 | 93.64 | 1.25 | 1.33 | 0.93 | 85.90 | 85.86 | 86.07 | 79.86 | 79.89 | 79.71 | 31.70 | 32.55 | 28.02 |
| ඉමදූව | 27.18 | 28.72 | 21.41 | 67.02 | 67.17 | 66.46 | 0.47 | 0.47 | 0.48 | 82.65 | 82.88 | 81.76 | 84.07 | 84.45 | 82.63 | 33.68 | 33.76 | 33.39 |
| හබරාදූව | 20.35 | 22.07 | 14.93 | 10.96 | 11.63 | 8.85 | 0.34 | 0.34 | 0.32 | 93.68 | 93.71 | 93.60 | 90.92 | 91.02 | 90.62 | 27.62 | 28.23 | 25.69 |
| **එකතුව** | **20.35** | **21.57** | **15.72** | **60.34** | **61.90** | **54.43** | **2.06** | **2.21** | **1.50** | **85.54** | **85.49** | **85.74** | **83.06** | **83.04** | **83.13** | **28.86** | **29.44** | **26.69** |

| ප්‍රා.ලේ.කොට්ඨාසය | කෘෂිකාර්මික කටයුතුවල නිරත වූ ගොවිකාරකයන් සංඛ්‍යාව | | | | | | | | | | | | | | | | | | ගොවිකාරකයකු නිරත වන සාමාන්‍ය කෘෂිකාර්මික කටයුතු සංඛ්‍යාව | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ගව පාලනය | | | එළු පාලනය | | | ඌරු පාලනය | | | කුකුළු පාලනය | | | වෙනත් සත්ත්ව පාලනයන් | | | ජලජීවී වගාව | | | | | |
| | එකතුව | පුරුෂ | ස්ත්‍රී | එකතුව | පුරුෂ | ස්ත්‍රී | එකතුව | පුරුෂ | ස්ත්‍රී | එකතුව | පුරුෂ | ස්ත්‍රී | එකතුව | පුරුෂ | ස්ත්‍රී | එකතුව | පුරුෂ | ස්ත්‍රී | එකතුව | පුරුෂ | ස්ත්‍රී |
| බෙන්තොට | 2.38 | 2.88 | 0.71 | 0.18 | 0.24 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 2.73 | 2.88 | 2.21 | 0.07 | 0.10 | 0.00 | 0.09 | 0.12 | 0.00 | 2 | 2 | 2 |
| බලපිටිය | 1.27 | 1.50 | 0.70 | 0.18 | 0.14 | 0.28 | 0.06 | 0.03 | 0.14 | 1.93 | 2.00 | 1.75 | 0.06 | 0.06 | 0.07 | 0.84 | 1.00 | 0.42 | 2 | 2 | 2 |
| කරණ්දෙනිය | 0.72 | 0.90 | 0.21 | 0.11 | 0.15 | 0.00 | 0.02 | 0.03 | 0.00 | 2.18 | 2.54 | 1.17 | 0.05 | 0.05 | 0.03 | 0.11 | 0.15 | 0.00 | 2 | 2 | 2 |
| ඇල්පිටිය | 1.83 | 2.10 | 0.88 | 0.13 | 0.15 | 0.07 | 0.02 | 0.02 | 0.04 | 2.29 | 2.52 | 1.46 | 0.07 | 0.07 | 0.04 | 0.10 | 0.12 | 0.04 | 3 | 3 | 3 |
| නියාගම | 1.39 | 1.54 | 0.74 | 0.09 | 0.11 | 0.00 | 0.04 | 0.05 | 0.00 | 1.59 | 1.77 | 0.80 | 0.05 | 0.06 | 0.00 | 0.12 | 0.14 | 0.07 | 3 | 3 | 3 |
| තවලම | 1.39 | 1.54 | 0.62 | 0.15 | 0.16 | 0.08 | 0.01 | 0.01 | 0.00 | 2.23 | 2.45 | 1.09 | 0.03 | 0.01 | 0.08 | 0.05 | 0.04 | 0.08 | 3 | 3 | 3 |
| නෙලුව | 1.92 | 2.07 | 0.97 | 0.25 | 0.30 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 2.47 | 2.68 | 1.18 | 0.04 | 0.05 | 0.00 | 0.06 | 0.07 | 0.00 | 3 | 3 | 3 |
| නාගොඩ | 1.99 | 2.31 | 0.59 | 0.38 | 0.41 | 0.23 | 0.02 | 0.02 | 0.00 | 2.86 | 3.16 | 1.56 | 0.02 | 0.02 | 0.00 | 0.16 | 0.18 | 0.09 | 3 | 3 | 3 |
| බද්දේගම | 3.41 | 3.97 | 0.88 | 0.40 | 0.43 | 0.26 | 0.00 | 0.00 | 0.00 | 2.76 | 2.91 | 2.08 | 0.07 | 0.08 | 0.00 | 0.09 | 0.09 | 0.05 | 3 | 3 | 3 |
| වැලිවිටිය- දිවිතුර | 2.20 | 2.68 | 0.48 | 0.34 | 0.41 | 0.08 | 0.02 | 0.02 | 0.00 | 2.66 | 3.04 | 1.28 | 0.04 | 0.05 | 0.00 | 0.02 | 0.02 | 0.00 | 3 | 3 | 3 |
| අම්බලන්ගොඩ | 1.98 | 2.31 | 0.71 | 0.09 | 0.09 | 0.09 | 0.02 | 0.02 | 0.00 | 2.59 | 2.86 | 1.59 | 0.02 | 0.02 | 0.00 | 0.24 | 0.31 | 0.00 | 2 | 2 | 2 |
| ගෝනපීනුවල | 3.67 | 4.08 | 1.93 | 0.37 | 0.40 | 0.24 | 0.00 | 0.00 | 0.00 | 3.90 | 4.14 | 2.90 | 0.23 | 0.28 | 0.00 | 0.05 | 0.06 | 0.00 | 3 | 3 | 2 |
| හික්කඩුව | 5.37 | 6.13 | 2.93 | 0.18 | 0.22 | 0.08 | 0.15 | 0.19 | 0.00 | 3.06 | 3.22 | 2.54 | 0.24 | 0.31 | 0.00 | 0.27 | 0.31 | 0.15 | 2 | 2 | 2 |
| කඩවත්සතර | 2.86 | 3.21 | 1.56 | 1.46 | 1.27 | 2.18 | 0.00 | 0.00 | 0.00 | 3.26 | 2.87 | 4.67 | 0.47 | 0.51 | 0.31 | 0.00 | 0.00 | 0.00 | 2 | 2 | 2 |
| බොපේ පෝද්දල | 4.38 | 4.87 | 2.05 | 0.68 | 0.72 | 0.46 | 0.04 | 0.05 | 0.00 | 2.71 | 2.90 | 1.82 | 0.12 | 0.10 | 0.23 | 0.08 | 0.10 | 0.00 | 3 | 3 | 3 |
| අක්මීමන | 2.12 | 2.46 | 0.84 | 0.57 | 0.65 | 0.28 | 0.05 | 0.06 | 0.00 | 2.30 | 2.33 | 2.17 | 0.11 | 0.10 | 0.14 | 0.03 | 0.04 | 0.00 | 3 | 3 | 3 |
| යක්කලමුල්ල | 2.24 | 2.52 | 0.99 | 0.34 | 0.42 | 0.00 | 0.02 | 0.01 | 0.05 | 2.12 | 2.27 | 1.48 | 0.03 | 0.04 | 0.00 | 0.08 | 0.10 | 0.00 | 3 | 3 | 3 |
| ඉමදූව | 3.13 | 3.48 | 1.82 | 0.42 | 0.49 | 0.16 | 0.02 | 0.02 | 0.00 | 1.62 | 1.80 | 0.95 | 0.02 | 0.02 | 0.00 | 0.03 | 0.04 | 0.00 | 3 | 3 | 3 |
| හබරාදූව | 3.48 | 4.01 | 1.81 | 0.23 | 0.27 | 0.11 | 0.03 | 0.03 | 0.00 | 2.84 | 3.20 | 1.71 | 0.10 | 0.14 | 0.00 | 0.08 | 0.10 | 0.00 | 3 | 3 | 2 |
| **එකතුව** | **2.23** | **2.58** | **0.94** | **0.28** | **0.31** | **0.14** | **0.03** | **0.03** | **0.01** | **2.42** | **2.63** | **1.60** | **0.07** | **0.08** | **0.03** | **0.13** | **0.15** | **0.05** | **3** | **3** | **3** |

ඒ අනුව ගාල්ල දිස්ත්‍රික්කයේ ගොවි කාණ්ඩවල ගොවිකාරකයින් ආර්ථික කටයුත්තක් ලෙස වී වගාවේ යෙදුණු සංඛ්‍යාවෙහි ප්‍රතිශතය 20.35% කි. මෙම දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අතුරින් වී වගාවේ නිරතවූ වැඩිම ගොවිකාරකයින් සංඛ්‍යාවෙහි ප්‍රතිශතය වන 36.12% ක් නියාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් වාර්තා වන අතර අඩුම ගොවිකාරකයින් සංඛ්‍යාවෙහි ප්‍රතිශතය වන 6.18% ක් වාර්තා වන්නේ ගාල්ල කඩවත්සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙනි.

ගාල්ල දිස්ත්‍රික්කයේ තේ වගාවේ නිරත වු ගොවිකාරක ප්‍රතිශතය 60.34% ක් වන අතර වැඩිම ප්‍රතිශතයක් (97.2%) වාර්තා වන්නේ තවලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් වන අතර මෙහි දැකිය හැකි විශේෂ ලක්ෂණය වන්නේ නියාගම, තවලම, නෙලුව, නාගොඩ, යක්කලමුල්ල යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ගොවිකාරකයින් 10 දෙනෙකුගෙන් 9ක්ම තේ වගාකරනු ලැබීමය. අඩුම ප්‍රතිශතයක් තේ වගා කරනු ලබන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වනුයේ බලපිටිය වේ. එසේම රබර් වගාව සිදුකරනු ලබන ගොවිකාරකයින් සංඛ්‍යාව ඉතාමත් කුඩා අගයන් වන අතර ප්‍රතිශතයක් ලෙස 2.0% ක් වේ. නියාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගොවිකාරකයින්ගෙන් 7.5% ක් රබර් වගාවේ නිරත වේ.

දිස්ත්‍රික්කයේ පොල් වගාව සිදුකරනු ලබන ගොවිකාරකයින්ගේ ප්‍රතිශතය 85.5% ක් වන අතර එයින් වැඩිම ප්‍රතිශතය වන 93.6% හබරාදුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන්ද, අඩුම ප්‍රතිශතය වන 61.3% නියාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන්ද වාර්තාවේ.

දිස්ත්‍රික්කයේ ගොවි කාණ්ඩ අතුරින් වෙනත් ස්ථිර බෝග වගාකරනු ලබන ගොවිකාරකයින්ගේ ප්‍රතිශතය 83% කි. එයින් වැඩිම ප්‍රතිශතය 95.5% අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන්ද, අඩුම ප්‍රතිශතය වන 61.3% නියාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන්ද වාර්තාවේ.

දිස්ත්‍රික්කයේ ගොවි කාණ්ඩවල වෙනත් කාලීන බෝග වගාව සිදුකරන ලද ගොවිකාරකයින්ගේ ප්‍රතිශතය 28.8% වන අතර එහි වැඩිම ගොවිකාරකයින් ප්‍රතිශතය වන 42.7% ක් නාගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් ද අඩුම ප්‍රතිශතය වන 15.0% කරණ්දෙනිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන්ද වාර්තාවේ.

දිස්ත්‍රික්කයේ ගව පාලනය සිදුකරන ගොවිකාරකයින්ගේ ප්‍රතිශතය 2.2% කි. වැඩි වශයෙන් ගව පාලනය සිදුකරනු ලබන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය වන්නේ හික්කඩුව වේ. එම අගය 5.3% කි. කරණ්දෙනිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් එහි අඩුම ප්‍රතිශතය වන 0.7% වාර්තාවේ. දිස්ත්‍රික්කයේ එළු පාලනය ඉතා මද වශෙයන් සිදුකරන අතර ඒහි නිරත ගොවිකාරකයින්ගේ ප්‍රතිශතය 0.28% ක් ෙවි.

ගාල්ල දිස්ත්‍රික්කයේ ඌරු පාලනය, ජලජීවි වගාව හා වෙනත් සත්ත්ව පාලන කටයුතු සිදුකරන ගොවිකාරකයින් සංඛ්‍යාව ඉතා කුඩා ප්‍රතිශත වලින් වාර්තා වී අැත. දිස්ත්‍රික්කයේ කුකුළු පාලනය සිදුකරන ගොවිකාරකයින්ගේ ප්‍රතිශතය 2.4% කි. වැඩි වශයෙන් කුකුළු පාලනය සිදුකරන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය වන්නේ ගෝනපීනුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය (3.9%) වන අතර අඩුවෙන්ම කුකුළු පාලනය සිදුකරන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය වන්නේ නියාගම (1.6%) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයයි.

මෙහිදී සාමාන්‍යයෙන් ගාල්ල දිස්ත්‍රික්කයේ ගොවිකාරකයකු කෘෂිකාර්මික කටයුතු 3 ක පමණ යෙදී සිටින බව පෙන්නුම් කරයි. බෙන්තොට, බලපිටිය, කරණ්දෙනිය, අම්බලන්ගොඩ සහ හික්කඩුව යන ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයන්හි ගොවිකාරකයකු සාමාන්‍යයෙන් කෘෂිකාර්මික කටයුතු 2ක් සිදුකරනු ලබන බව වාර්තා වන අතර අනිකුත් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයන්හි ගොවිකාරකයකු නිරත වන සාමාන්‍ය කෘෂිකාර්මික කටයුතු ගණන තුනකි.

### 3.11 : ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් කෘෂිකර්මාන්තය හැර වෙනත් ආර්ථික කටයුත්තක නිරත ගොවිකාරකයින් සංඛ්‍යාව - 2014

ගොවිකාරකයා කෘෂිකාර්මාන්තයට අමතරව වෙනත් ආර්ථික කටයුත්තක නිරතවේද? නැද්ද? යන්න පිළිබඳවද තොරතුරු රැස්කරන ලදි.

**වගු අංක 3.11 : ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් වෙනත් ආර්ථික කටයුත්තක නිරත ගොවිකාරකයින් සංඛ්‍යාව - 2014**

| ප්‍රා.ලේ.කොට්ඨාසය | ගොවිකාරකයන් | | | | | |
|---|---|---|---|---|---|---|
| | වෙනත් ආර්ථික කටයුත්තක නිරත | | වෙනත් ආර්ථික කටයුත්තක නිරත නොවන | | මුළු ගණන | |
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| බෙන්තොට | 3425 | 5.05 | 2003 | 3.27 | 5428.00 | 4.20 |
| බලපිටිය | 3372 | 4.97 | 1657 | 2.70 | 5029.00 | 3.90 |
| කරන්දෙනිය | 7412 | 10.92 | 5310 | 8.66 | 12722.00 | 9.85 |
| ඇල්පිටිය | 6766 | 9.97 | 5396 | 8.81 | 12162.00 | 9.42 |
| නියාගම | 2721 | 4.01 | 5280 | 8.61 | 8001.00 | 6.19 |
| තවලම | 1883 | 2.78 | 6083 | 9.93 | 7966.00 | 6.17 |
| නෙලුව | 1356 | 2.00 | 5318 | 8.68 | 6674.00 | 5.17 |
| නාගොඩ | 4627 | 6.82 | 6990 | 11.40 | 11617.00 | 9.00 |
| බද්දේගම | 6047 | 8.93 | 4530 | 7.39 | 10577.00 | 8.20 |
| වැලිවිටිය- දිවිතුර | 3417 | 5.04 | 2232 | 3.65 | 5649.00 | 4.38 |
| අම්බලන්ගොඩ | 4223 | 6.23 | 1143 | 1.87 | 5366.00 | 4.16 |
| ගෝනපීනුවල | 1538 | 2.27 | 639 | 1.04 | 2177.00 | 1.69 |
| හික්කඩුව | 4039 | 5.96 | 1416 | 2.31 | 5455.00 | 4.23 |
| කඩවත්සතර | 1249 | 1.85 | 256 | 0.42 | 1505.00 | 1.17 |
| බොපේ පෝද්දල | 2022 | 2.98 | 489 | 0.80 | 2511.00 | 1.94 |
| අක්මීමන | 3626 | 5.35 | 3037 | 4.96 | 6663.00 | 5.16 |
| යක්කලමුල්ල | 3975 | 5.86 | 5770 | 9.41 | 9745.00 | 7.55 |
| ඉමදූව | 3291 | 4.85 | 2685 | 4.38 | 5976.00 | 4.63 |
| හබරාදූව | 2832 | 4.17 | 1046 | 1.71 | 3878.00 | 3.00 |
| **එකතුව** | **67821** | **100** | **61280** | **100** | **129101** | **100** |


ඒ අනුව ගාල්ල දිස්ත්‍රික්කයේ සිටින මුළු ගොවිකාරකයින් සංඛ්‍යාව අතරෙන් කෘෂිකර්මාන්තයට අමතරව වෙනත් ආර්ථික කටයුත්තක නිරත වන ගොවි කාරකයින් සංඛ්‍යාව 67,821ක් වන අතර වෙනත් ආර්ථික කටයුත්තක නිරත නොවන ගොවි කාරකයින් සංඛ්‍යාව 61,280 කි.

කෘෂිකර්මාන්තයට අමතරව වෙනත් ආර්ථික කටයුත්තක නිරත වන වැඩිම ගොවි කාරකයින් සංඛ්‍යාව (7,412) කරන්දෙනිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් වාර්තා වන අතර එහි ප්‍රතිශතය 11% කි. අඩුම ගොවි කාරකයින් සංඛ්‍යාව (1,249) ගාල්ල කඩවත්සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් වාර්තා වන අතර එහි ප්‍රතිශතය 1.8% කි .

එම දිස්ත්‍රික්කයේ පදිංචි මුළු ගොවිකාරකයින්ගෙන් කෘෂිකාර්මාන්තයට අමතරව වෙනත් ආර්ථික කටයුත්තක නිරත නොවන ගොවිකාරකයින්ගේ වැඩිම සංඛ්‍යාව (6,990) නාගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් වාර්තා වන අතර ප්‍රතිශතයක් ලෙස ගත් කල 11.4% කි. වෙනත් ආර්ථික කටයුත්තක

නිරත නොවන ගොවිකාරකයින්ගේ අඩුම සංඛ්‍යාව (256) ගාල්ල කඩවත්සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් වාර්තා වන අතර එම අගය ප්‍රතිශතයක් ලෙස 0.4% කි .

**රූප සටහන 09 - ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් වෙනත් ආර්ථික කටයුත්තක නිරත ගොවිකාරකයින් - 2014**



## 3.12 : ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් වෙනත් රැකියාවන් සහ ආදායම් මාර්ග හා ස්ත්‍රී/පුරුෂ භාවය අනුව ගොවිකාරකයින් සංඛ්‍යාව - 2014

2014 වර්ෂයේ දී සිදුකළ ආර්ථික සංගණනය යටතේ, කෘෂිකාර්මික කටයුතු පිළිබඳ ගණන් ගැනීමේ දී ගොවිකාරකයන්ගේ, කෘෂිකර්මාන්තය හැර වෙනත් ආර්ථික කටයුතුවල නිරත වීම හෙවත් ඔවුන්ගේ ප්‍රධාන රැකියාව පිළිබඳ තොරතුරු ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස මට්ටමින් එක් රැස් කරන ලදී. මෙහි දී ගොවිකාරකයින් වැටුප් ලබන රැකියාවක නිරත වන්නේ ද, තමන්ගේ ආර්ථික කටයුත්තක නිරත වන්නේ ද, සේවා යෝජකයෙක් වශයෙන් නිරත වන්නේ ද සහ වෙනත් ආදායම් මාර්ග වල නිරත වන්නේ ද යන තොරතුරු ලබා ගන්නා ලදී. ඊට අමතරව වැටුප් ලබන රැකියාවක නිරත වන ගොවි කාරකයින් නියුක්ත වන අංශය රජයේ, අර්ධ රජයේ සහ පුද්ගලික අංශයේ වශයෙන් හා තමාගේම ආර්ථික කටයුත්තක නිරත වන ගොවි කාරකයින් නිරත වන ආර්ථික කටයුත්ත කෘෂිකාර්මික සහ කෘෂිකාර්මික නොවන යනුවෙන්ද තොරතුරු ලබා ගන්නා ලදී.

**වගු අංක 3.12 : ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් වෙනත් රැකියාවන් සහ ආදායම් මාර්ග හා ස්ත්‍රී/පුරුෂ භාවය අනුව ගොවිකාරකයින් සංඛ්‍යාව - 2014**

| ප්‍රා.ලේ.කොට්ඨාසය | වැටුප් ලබන රැකියාවක නිරත ගොවිකාරකයන් සංඛ්‍යාව | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | රාජ්‍ය අංශය | | | අර්ධ රාජ්‍ය අංශය | | | පුද්ගලික අංශය | | | මුළු සංඛ්‍යාව | | |
| | පුරුෂ | ස්ත්‍රී | මුළු ගණන | පුරුෂ | ස්ත්‍රී | මුළු ගණන | පුරුෂ | ස්ත්‍රී | මුළු ගණන | පුරුෂ | ස්ත්‍රී | මුළු ගණන |
| බෙන්තොට | 469 | 69 | 538 | 44 | 1 | 45 | 948 | 157 | 1105 | 1461 | 227 | 1688 |
| බලපිටිය | 403 | 104 | 507 | 63 | 8 | 71 | 1388 | 277 | 1665 | 1854 | 389 | 2243 |
| කරන්දෙණිය | 510 | 85 | 595 | 72 | 16 | 88 | 4273 | 610 | 4883 | 4855 | 711 | 5566 |
| ඇල්පිටිය | 728 | 98 | 826 | 131 | 12 | 143 | 2591 | 433 | 3024 | 3450 | 543 | 3993 |
| නියාගම | 501 | 53 | 554 | 63 | 5 | 68 | 749 | 99 | 848 | 1313 | 157 | 1470 |
| තවලම | 431 | 54 | 485 | 46 | 2 | 48 | 324 | 41 | 365 | 801 | 97 | 898 |
| නෙලුව | 255 | 23 | 278 | 26 | 3 | 29 | 220 | 15 | 235 | 501 | 41 | 542 |
| නාගොඩ | 698 | 77 | 775 | 123 | 12 | 135 | 1126 | 117 | 1243 | 1947 | 206 | 2153 |
| බද්දේගම | 1089 | 126 | 1215 | 198 | 25 | 223 | 1420 | 138 | 1558 | 2707 | 289 | 2996 |
| වැලිවිටිය- දිවිතුර | 303 | 53 | 356 | 76 | 10 | 86 | 754 | 111 | 865 | 1133 | 174 | 1307 |
| අම්බලන්ගොඩ | 344 | 56 | 400 | 60 | 2 | 62 | 2305 | 377 | 2682 | 2709 | 435 | 3144 |
| ගෝනපීනුවල | 192 | 22 | 214 | 26 | 1 | 27 | 728 | 106 | 834 | 946 | 129 | 1075 |
| හික්කඩුව | 646 | 108 | 754 | 81 | 8 | 89 | 996 | 180 | 1176 | 1723 | 296 | 2019 |
| කඩවත්සතර | 273 | 61 | 334 | 37 | 2 | 39 | 289 | 54 | 343 | 599 | 117 | 716 |
| බොපේ පෝද්දල | 446 | 84 | 530 | 62 | 6 | 68 | 536 | 54 | 590 | 1044 | 144 | 1188 |
| අක්මීමන | 596 | 97 | 693 | 84 | 6 | 90 | 1006 | 145 | 1151 | 1686 | 248 | 1934 |
| යක්කලමුල්ල | 425 | 44 | 469 | 74 | 8 | 82 | 1547 | 243 | 1790 | 2046 | 295 | 2341 |
| ඉමදූව | 427 | 68 | 495 | 50 | 1 | 51 | 941 | 127 | 1068 | 1418 | 196 | 1614 |
| හබරාදූව | 401 | 80 | 481 | 66 | 4 | 70 | 765 | 142 | 907 | 1232 | 226 | 1458 |
| **එකතුව** | **9137** | **1362** | **10499** | **1382** | **132** | **1514** | **22906** | **3426** | **26332** | **33425** | **4920** | **38345** |

| ප්‍රා.ලේ.කොට්ඨාසය | තමන්ගේ ආර්ථීන කටයුත්තක නිරත ගොවිකාරකයන් සංඛ්‍යාව | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | තමාගේම කෘෂිකාර්මික කටයුත්තක නිරත | | | තමාගේම කෘෂිකාර්මික නොවන කටයුත්තක නිරත | | | මුළු සංඛ්‍යාව | | |
| | පුරුෂ | ස්ත්‍රී | මුළු ගණන | පුරුෂ | ස්ත්‍රී | මුළු ගණන | පුරුෂ | ස්ත්‍රී | මුළු ගණන |
| බෙන්තොට | 243 | 70 | 313 | 428 | 112 | 540 | 671 | 182 | 853 |
| බලපිටිය | 124 | 30 | 154 | 244 | 45 | 289 | 368 | 75 | 443 |
| කරන්දෙනිය | 232 | 73 | 305 | 624 | 85 | 709 | 856 | 158 | 1014 |
| ඇල්පිටිය | 448 | 119 | 567 | 929 | 143 | 1072 | 1377 | 262 | 1639 |
| නියාගම | 154 | 29 | 183 | 383 | 34 | 417 | 537 | 63 | 600 |
| තවලම | 247 | 54 | 301 | 219 | 20 | 239 | 466 | 74 | 540 |
| නෙලුව | 33 | 2 | 35 | 100 | 4 | 104 | 133 | 6 | 139 |
| නාගොඩ | 355 | 62 | 417 | 461 | 58 | 519 | 816 | 120 | 936 |
| බද්දේගම | 592 | 137 | 729 | 730 | 96 | 826 | 1322 | 233 | 1555 |
| වැලිවිටිය- දිවිතුර | 316 | 90 | 406 | 487 | 57 | 544 | 803 | 147 | 950 |
| අම්බලන්ගොඩ | 127 | 25 | 152 | 254 | 24 | 278 | 381 | 49 | 430 |
| ගෝනපීනුවල | 70 | 12 | 82 | 86 | 16 | 102 | 156 | 28 | 184 |
| හික්කඩුව | 152 | 48 | 200 | 467 | 118 | 585 | 619 | 166 | 785 |
| කඩවත්සතර | 80 | 25 | 105 | 77 | 14 | 91 | 157 | 39 | 196 |
| බොපේ පෝද්දල | 118 | 42 | 160 | 149 | 12 | 161 | 267 | 54 | 321 |
| අක්මීමන | 219 | 76 | 295 | 362 | 46 | 408 | 581 | 122 | 703 |
| යක්කලමුල්ල | 457 | 118 | 575 | 272 | 41 | 313 | 729 | 159 | 888 |
| ඉමදුව | 207 | 48 | 255 | 615 | 111 | 726 | 822 | 159 | 981 |
| හබරාදුව | 144 | 42 | 186 | 218 | 47 | 265 | 362 | 89 | 451 |
| **එකතුව** | **4,318** | **1102** | **5,420** | **7105** | **1,083** | **8188** | **11423** | **2,185** | **13608** |

| ප්‍රා.ලේ.කොට්ඨාසය | සේවායෝජක හා වෙනත් ආදායම් මාර්ග වල නිරත ගොවිකාරකයන් සංඛ්‍යාව | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | සේවා යෝජක | | | වෙනත් | | | මුළු සංඛ්‍යාව | | |
| | පුරුෂ | ස්ත්‍රී | මුළු ගණන | පුරුෂ | ස්ත්‍රී | මුළු ගණන | පුරුෂ | ස්ත්‍රී | මුළු ගණන |
| බෙන්තොට | 36 | 10 | 46 | 618 | 220 | 838 | 654 | 230 | 884 |
| බලපිටිය | 35 | 6 | 41 | 455 | 190 | 645 | 490 | 196 | 686 |
| කරන්දෙනිය | 92 | 16 | 108 | 437 | 287 | 724 | 529 | 303 | 832 |
| ඇල්පිටිය | 63 | 14 | 77 | 780 | 277 | 1057 | 843 | 291 | 1134 |
| නියාගම | 167 | 21 | 188 | 388 | 75 | 463 | 555 | 96 | 651 |
| තවලම | 28 | 4 | 32 | 356 | 57 | 413 | 384 | 61 | 445 |
| නෙලුව | 19 | 1 | 20 | 572 | 83 | 655 | 591 | 84 | 675 |
| නාගොඩ | 29 | 2 | 31 | 1264 | 243 | 1507 | 1293 | 245 | 1538 |
| බද්දේගම | 77 | 14 | 91 | 1175 | 230 | 1405 | 1252 | 244 | 1496 |
| වැලිවිටිය- දිවිතුර | 66 | 12 | 78 | 867 | 215 | 1082 | 933 | 227 | 1160 |
| අම්බලන්ගොඩ | 28 | 3 | 31 | 383 | 235 | 618 | 411 | 238 | 649 |
| ගෝනපීනුවල | 13 | 3 | 16 | 206 | 57 | 263 | 219 | 60 | 279 |
| හික්කඩුව | 76 | 14 | 90 | 823 | 322 | 1145 | 899 | 336 | 1235 |
| කඩවත්සතර | 23 | 4 | 27 | 229 | 81 | 310 | 252 | 85 | 337 |
| බොපේ පෝද්දල | 17 | 2 | 19 | 376 | 118 | 494 | 393 | 120 | 513 |
| අක්මීමන | 65 | 8 | 73 | 704 | 212 | 916 | 769 | 220 | 989 |
| යක්කලමුල්ල | 72 | 11 | 83 | 551 | 112 | 663 | 623 | 123 | 746 |
| ඉමදුව | 82 | 12 | 94 | 492 | 110 | 602 | 574 | 122 | 696 |
| හබරාදුව | 29 | 6 | 35 | 641 | 247 | 888 | 670 | 253 | 923 |
| **එකතුව** | **1,017** | **163** | **1,180** | **11317** | **3,371** | **14688** | **12334** | **3,534** | **15868** |

ගාල්ල දිස්ත්‍රික්කයෙහි ගොවිකාරකයින්ගෙන් වැටුප් සහිත රැකියාවන්වල නිරතවන සංඛ්‍යාවෙන් වැඩිම සංඛ්‍යාවක් (26,332) වාර්තා වී ඇත්තේ පෞද්ගලික අංශයෙනි. අඩුම සංඛ්‍යාව (1,514) ක් සේවයෙහි නිරත බවට වාර්තා වන්නේ අර්ධ රාජ්‍ය අංශයෙහි රැකියාවන්වල වේ. රාජ්‍ය අංශයෙහි සේවයේ නිරත සංඛ්‍යාව (10,499) කි.

පෞද්ගලික අංශයෙහි රැකියාවල නිරත සංඛ්‍යාවෙන් වැඩිම අගය කරණ්දෙනිය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයෙන් (4,883) වාර්තා වී ඇති අතර අඩුම සංඛ්‍යාව නෙලුව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයෙන් (235) වාර්තා වේ. අර්ධ රාජ්‍ය අංශයෙහි රැකියා කරන ගොවිකාරකයින්ගෙන් ඉහළම අගය බද්දේගම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසය තුළ බවට තොරතුරු ලැබී ඇත. එය 223ක් වේ.

රාජ්‍ය අංශයේ රැකියාවල නිරත ගොවිකාරකයින්ගේ ස්ත්‍රී / පුරුෂ භාවය සැළකීමේ දී එයින් වැඩිම ගොවිකාරකයින් සංඛ්‍යාව වාර්තා වන්නේ පුරුෂ පක්ෂයෙන් වන අතර එම පිරිස සංඛ්‍යාත්මකව (9,137) ක් බවට වාර්තා වේ. එම අගය රාජ්‍ය අංශයේ රැකියා වල නිරත වන්නන්ගේ මුළු ගණනින් 87% ක ප්‍රතිශතයකි. කාන්තාවන් සම්බන්ධව එම අගය 1,362 වන අතර ප්‍රතිශතය 13%ක් වේ.

රාජ්‍ය අංශයේ ආදායම් ලබන පිරිමි රැකියා නියුක්තියෙන් ඉහළ ම අගයක් (1,089) බද්දේගම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයෙන් වාර්තා වේ. මෙහි අඩුම ගොවිකාරකයින් (192) ගණන රාජ්‍ය අංශයේ සේවය කරන පිරිමි ගොවිකාරකයින්ගෙන් 2.0% ප්‍රතිශතයක් ලෙස ගෝනපීනුවල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසය තුළ වාර්තා වේ. රාජ්‍ය සේවයෙහි කාන්තාවන් වැඩිම සංඛ්‍යාව (126) වාර්තා වන්නේද බද්දේගම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයෙනි. එය රාජ්‍ය අංශයෙහි සේවය කරන කාන්තා ගොවිකාරකයින් සංඛ්‍යාවෙන් 9.2% ක් වේ. ගෝනපීනුවල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයෙන් රාජ්‍ය සේවයෙහි නිරත කාන්තාවන්ගේ අඩුම අගය (22) වාර්තා වේ.

අර්ධ රාජ්‍ය අංශයෙහි වැඩිම සංඛ්‍යාව පිරිමි ගොවිකාරකයින් වන බව වාර්තා වේ. එය අර්ධ රාජ්‍ය අංශයෙහි සංඛ්‍යාවෙන් ප්‍රතිශතයක් වශයෙන් 91% ක් වන අතර සංඛ්‍යාත්මකව 1382 ක් වේ. එම අංශයෙහි වැඩිම සංඛ්‍යාව (198) වාර්තා වන්නේ බද්දේගම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයෙහි වන අතර අඩුම අගය ගෝනපීනුවල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයෙන් වාර්තා වේ. මෙම අඩුම අගය අර්ධ රාජ්‍ය අංශයෙහි වැටුප් ලබන රැකියාවල නියුතු පිරිමි ගොවිකාරකයින් ගණනින් 1.8 % ක ප්‍රතිශතයක් දරයි. බද්දේගම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයෙන් අර්ධ රාජ්‍ය අංශයෙහි ස්ත්‍රී සේවා දායකත්වයේ වැඩිම අගය (25) වාර්තා වන අතර එය අර්ධ රාජ්‍ය අංශයෙහි ස්ත්‍රී ගොවිකාරකයින් ගණනින් 19% ක් වේ.

කෘෂිකාර්මික කටයුතු හැර වෙනත් ආර්ථික ක්‍රියාකාරකම්වල නිරත ගොවිකාරකයින්ගෙන් පෞද්ගලික අංශයෙහි සේවයේ නියැලී සිටින්නන් සළකා බැලීමේ දී එම සංඛ්‍යාවෙන් 87% ප්‍රතිශතයක් පිරිමි වන අතර එය 22,906 අගයක් ගනී. පෞද්ගලික අංශයෙහි රැකියා කරන පිරිමි වැඩිම අගයක් (4,273) වාර්තා වන්නේ කරණ්දෙනිය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ වන අතර 18.6% ප්‍රතිශතයක් වේ. අඩුම අගය වන (220) නෙලුව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයෙන් වාර්තා වේ. කරණ්දෙනිය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයෙන් පෞද්ගලික අංශයේ වැඩිම කාන්තා සේවා දායකත්වයක් (610) වාර්තා වන අතර එය එම අංශයේ මුළු ස්ත්‍රී ගොවිකාරකයින් ගණනින් 17.8% ක ප්‍රතිශතයක් පෙන්වයි.

වර්ෂ 2014 කෘෂිකාර්මික තොරතුරු අනුව ගොවිකාරකයින් තමාගේම ආර්ථික කටයුතුවල නිරත වීම පිළිබඳ තොරතුරු සලකා බැලීමේ දී ගොවිකාරකයින් තමාගේම කෘෂිකාර්මික කටයුත්තක නිරත වන්නේ ද නොඑසේ නම් තමාගේම කෘෂිකාර්මික නොවන කටයුත්තක නිරත වන්නේද යන තොරතුරු සොයා බලන ලදී.

ගාල්ල දිස්ත්‍රික්කයේ තමාගේම ආර්ථික කටයුත්තක නිරත වන සංඛ්‍යාව වන 13,608 න් වැඩිම ප්‍රතිශතයක් වන 40% තමාගේම කෘෂිකාර්මික ආර්ථික කටයුත්තක නිරත වන අතර එය සංඛ්‍යාත්මකව 5,420 කි. තමාගේම කෘෂිකාර්මික නොවන කටයුත්තක නිරත වන ගොවිකාරකයන් ගණන 8,188 ක් වේ.

තමාගේම කෘෂිකාර්මික කටයුත්තක නිරත ගොවිකාරකයින් සලකා බැලීමේ දී එහි වැඩිම සංඛ්‍යාව (4,318) පිරිමි ගොවිකාරකයින් නියෝජනය කරන අතර එය 80.0% ක ප්‍රතිශතයකි. ස්ත්‍රීන් ගණන 1102 ක් වේ. පිරිමි ගොවිකාරකයින්ගේ ද වැඩිම සංඛ්‍යාව (592) බද්දේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් වාර්තා වේ. එය 13.7% ප්‍රතිශතයක් වේ. නෙලුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් එහි අඩුම අගය වාර්තා කරයි. 0.7% ක ප්‍රතිශතයක් ගන්නා එය සංඛ්‍යාත්මකව 33 කි. තමාගේම කෘෂිකාර්මික කටයුත්තක නිරත කාන්තා ගොවිකාරකයින් වැඩිම සංඛ්‍යාව (137) බද්දේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් වාර්තා වේ.

තමාගේම කෘෂිකාර්මික නොවන කටයුත්තක නිරත ගොවිකාරකයින් පිළිබඳ වාර්තා අනුව ද පුරුෂ ගොවිකාරකයින් වැඩි අගයක් ගන්නා බව පෙන්වා දිය හැකිය. ඒ අනුව පුරුෂ ගොවිකාරකයින් 7,105 ක් හා ස්ත්‍රී ගොවිකාරකයින් 1,083 ක් වේ. පුරුෂ ගොවිකාරකයින් සළකා බැලීමේ දී ඇල්පිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වැඩිම සංඛ්‍යාවක් (929) වාර්තා වන අතර එය කෘෂිකාර්මික නොවන කටයුත්තක නිරත පුරුෂ ගොවිකාරකයින් සංඛ්‍යාවෙන් 13% ප්‍රතිශතයක් පෙන්වයි. ගාල්ල කඩවත්සතර ප්‍රදේශීය ලේකම් කොට්ඨාසයෙන් එහි අඩුම අගය (77) වාර්තා වන අතර කෘෂිකාර්මික නොවන කටයුත්තක නිරත පුරුෂ ගොවිකාරකයින් සංඛ්‍යාවෙන් 1.0% ක ප්‍රතිශතයක් පෙන්වයි. ස්ත්‍රී ගොවිකාරකයින්ගේ ද වැඩිම අගය (143) ඇල්පිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් වාර්තා වන අතර එය කෘෂිකාර්මික නොවන කටයුත්තක නිරත ස්ත්‍රී ගොවිකාරකයින් සංඛ්‍යාවෙන් 13.2% ක ප්‍රතිශතයක් පෙන්වයි.

ගොවිකාරකයින්, සේවා යෝජකයන් ලෙස ඔවුන්ගේ ආදායම් මාර්ග ශක්තිමත් කර ගෙන තිබේද? එසේ නොමැති නම් වෙනත් ආදායම් මාර්ගයක් තම ආදායම් මාර්ගය ලෙස තෝරාගෙන තිබේද? යන කරුණ සම්බන්ධයෙන් ද 2014 ආර්ථික සංගණයේ දී තොරතුරු ලබා ගන්නා ලදී.

සේවා යෝජක හා වෙනත් ආදායම් මාර්ග සම්බන්ධයෙන් තොරතුරු සලකා බැලීමේ දී ගාල්ල දිස්ත්‍රික්කයේ එවැනි ආදායම් මාර්ග ඇති ගොවි කාරකයන් ගණන 15,868 ක් ලෙස වාර්තා වේ. එම සංඛ්‍යාවෙන් 77.7% ප්‍රතිශතයක් පුරුෂ ගොවිකාරකයින් වේ. සමස්ථයක් ලෙස සේවා යෝජක හා වෙනත් ආදායම් මාර්ග වල ස්වභාවය සැලකීමේදී වැඩිම පිරිමි ගොවිකාරකයින් නියෝජනය දක්නට ලැබෙන්නේ නාගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙනි. එය සංඛ්‍යාත්මකව 1,293 ක් වන අතර සේවා යෝජක හා වෙනත් ආදායම් මාර්ග වල නිරත පුරුෂ ගොවිකාරකයින් සංඛ්‍යාවෙන් 10.5% ක ප්‍රතිශතයකි. අඩුම පිරිමි සංඛ්‍යාව (219) වාර්තා වන්නේ ගෝනපීනුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් වන අතර සේවා යෝජක හා වෙනත් ආදායම් මාර්ග වල නිරත පුරුෂ ගොවිකාරකයින් සංඛ්‍යාවෙන් 1.8% ක ප්‍රතිශතයකි. කාන්තාවන් වැඩිම ගණනක් (336) හික්කඩුව ප්‍රදේශිය ලේකම් කොට්ඨාසයෙන් වාර්තා වන අතර සේවා යෝජක හා වෙනත් ආදායම් මාර්ග වල නිරත ස්ත්‍රී ගොවිකාරකයින් සංඛ්‍යාවෙන් 9.5% ක ප්‍රතිශතයක් වේ. අඩුම ස්ත්‍රී සංඛ්‍යාව (60) වාර්තා වන්නේ ගෝනපීනුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් වන අතර සේවා යෝජක හා වෙනත් ආදායම් මාර්ග වල නිරත ස්ත්‍රී ගොවිකාරකයින් සංඛ්‍යාවෙන් 1.7% ක ප්‍රතිශතයකි.

සේවා යෝජකයන් හා වෙනත් ආදායම් මාර්ග සහිත ගොවිකාරකයන් යන කාණ්ඩ දෙක සලකා බැලීමේදී වෙනත් ආදායම් මාර්ග සහිත ගොවිකාරකයන් ගණන වැඩි අගයක් (14,688) ගෙන ඇති බව පෙන්වා දිය හැකිය. එය 92.5% ක් වේ. සේවා යෝජකයන් සිටිනුයේ 1,180 දෙනෙකු පමණි.

සේවා යෝජකයන්ගෙන් ද පුරුෂ ගොවිකාරකයින් සංඛ්‍යාත්මකව ඉහළ අගයක් ගනී. එම අගය 1,017 ක් වන විට කාන්තා ගොවිකාරකයින් 163 ක් පමණක් වාර්තා වේ. පුරුෂ ගොවිකාරකයින් සංඛ්‍යාවෙන් 16.4% ක ප්‍රතිශත අගය වන 167 දෙනෙකු නියාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වාර්තා වන අතර අඩුම පුරුෂ ගොවිකාරකයන් සංඛ්‍යාව (13) ගෝනපීනුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් වාර්තා වේ. කාන්තා සේවායෝජකයන්ගෙන් ඉහළම අගය වන 21 ක් වාර්තා වනුයේ නියාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන්ය.

වෙනත් ආදායම් මාර්ග සහිත ගොවිකාරකයින් ද වැඩි සංඛ්‍යාව (11,317) පිරිමි ගොවිකාරකයින් වන විට කාන්තා ගොවිකාරකයින් සංඛ්‍යාව 3371 ක් ලෙස වාර්තා වේ. එම පිරිමි ගොවිකාරකයින් සංඛ්‍යාවෙන් 11.1% ක ප්‍රතිශතයක් වන 1,264 දෙනෙකු නාගොඩ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයෙන් වාර්තා වන අතර අවම අගය 206 ගෝනපීනුවල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයෙන් වාර්තා වේ. එය ප්‍රතිශතයක් ලෙස ගත් කළ 1.8% කි. හික්කඩුව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයෙහි වෙනත් ආදායම් මාර්ග සහිත කාන්තා ගොවිකාරකයින් වැඩිම සංඛ්‍යාව (322) ක් වාර්තා වන අතර එය, එම ආදායම් මාර්ග සහිත කාන්තා ගොවිකාරකයින් සංඛ්‍යාවෙන් 9.5% ක ප්‍රතිශතයකි. ගෝනපීනුවල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ වෙනත් ආදායම් මාර්ග සහිත අඩුම කාන්තා ගොවිකාරකයින් සංඛ්‍යාවක් (57) වාර්තා වන අතර එය එම ආදායම් මාර්ග සහිත කාන්තා ගොවිකාරකයින් සංඛ්‍යාවෙන් 1.7% ක් වේ.

## 3.13: ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් වෙනත් ආර්ථික කටයුත්තක/කටයුතුවල නිරත වන කාලය අනුව ගොවිකාරකයින් සංඛ්‍යාව - 2014

වෙනත් ආර්ථික කටයුතුවල යෙදෙන ගොවිකාරකයන්, කෘෂිකර්මාන්තයට වඩා වැඩි කාලයක් රැකියාව / වෙනත් ආර්ථික කටයුතු සඳහා වැය කළේද? යන්න පිළිබඳව තොරතුරු රැස් කරක ලදී.

**වගු අංක 3.13 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් වෙනත් ආර්ථික කටයුත්තක/ කටයුතුවල නිරත කාලය අනුව ගොවිකාරකයින් සංඛ්‍යාව - 2014**

| ප්‍රා.ලේ.කොට්ඨාසය | ගොවි කාරකයන් | | | |
|---|---|---|---|---|
| | වැඩි කාලයක් වෙනත් ආර්ථික කටයුතුවල නිරතවන | වැඩි කාලයක් කෘෂිකාර්මික කටයුතුවල නිරතවන | කාලය සඳහන් නොකරන ලද, එහෙත් වෙනත් ආර්ථික කටයුතුවල නිරත වන | මුළු ගණන |
| බෙන්තොට | 1949 | 558 | 918 | 3425 |
| බලපිටිය | 2362 | 297 | 713 | 3372 |
| කරණ්දෙනිය | 5996 | 616 | 800 | 7412 |
| ඇල්පිටිය | 4572 | 931 | 1263 | 6766 |
| නියාගම | 1405 | 699 | 617 | 2721 |
| තවලම | 779 | 959 | 145 | 1883 |
| නෙලුව | 420 | 863 | 73 | 1356 |
| නාගොඩ | 2353 | 750 | 1524 | 4627 |
| බද්දේගම | 2925 | 944 | 2178 | 6047 |
| වැලිවිටිය- දිවිතුර | 2030 | 364 | 1023 | 3417 |
| අම්බලන්ගොඩ | 3189 | 270 | 764 | 4223 |
| ගෝනපීනුවල | 1175 | 76 | 287 | 1538 |
| හික්කඩුව | 2345 | 358 | 1336 | 4039 |
| කඩවත්සතර | 660 | 170 | 419 | 1249 |
| බොපේ පෝද්දල | 1113 | 226 | 683 | 2022 |
| අක්මීමන | 1904 | 667 | 1055 | 3626 |
| යක්කලමුල්ල | 2323 | 884 | 768 | 3975 |
| ඉමදූව | 2125 | 435 | 731 | 3291 |
| හබරාදූව | 1548 | 241 | 1043 | 2832 |
| **එකතුව** | **41173** | **10308** | **16340** | **67821** |

ඒ අනුව ගොවිකාරකයා වෙනත් ආර්ථික කටයුතුවල නියැලෙන කාලය පිළිබඳව සලකා බැලීමේදී ගාල්ල දිස්ත්‍රික්කයේ වැඩි ගොවිකාරකයන් පිරිසක් කෘෂිකර්මාන්තයට වඩා වැඩි කාලයක් රැකියාව / වෙනත් ආර්ථික කටයුතු සඳහා වැය කළ අය වේ.එය සංඛ්‍යාත්මකව 41,173 කි. වඩා වැඩි කාලයක් කෘෂිකර්මාන්තයෙහි යෙදී සිටින ගොවිකාරකයන් සංඛ්‍යාව 10,308 වේ. වෙනත් ආර්ථික කටයුතුවල නිරත වුවද, එම කාලය සඳහන් නොකරන ලද ගොවිකාරකයන් සංඛ්‍යාව 16,340 කි.


වැඩි කාලයක් රැකියාව / වෙනත් ආර්ථික කටයුතු සඳහා වැය කරන ගොවිකාරකයන්ගෙන් වැඩිම සංඛ්‍යාව දක්නට ලැබෙන්නේ කරණ්දෙනිය (5,996) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙනි. එහි අඩුම සංඛ්‍යාව නෙලුව (420) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් වාර්තා වේ.

වඩා වැඩි කාලයක් කෘෂිකර්මාන්තයෙහි යෙදී සිටින වැඩිම ගොවිකාරකයන් සංඛ්‍යාව තවලම (959) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් වාර්තා වේ. ඒ යටතේ අඩුම ගොවිකාරකයන් සංඛ්‍යාව ගෝනපීනුවල (76) ප්‍රදේශීය ලේකම් කොට්ඨාසයෙන් වාර්තා වේ .

කාලය සඳහන් නොකරන ලද, වෙනත් ආර්ථික කටයුතුවල නිරත ගොවිකාරකයන්ගේ වැඩිම සංඛ්‍යාව දක්නට ලැබෙන්නේ බද්දේගම (2,178) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙනි. කාලය සඳහන් නොකරන ලද, වෙනත් ආර්ථික කටයුතුවල නිරත අවම ගොවිකාරකයින් සංඛ්‍යාව වන 73 නෙලුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන් වාර්තා වේ .

දිස්ත්‍රික් මට්ටමින් සලකා බලන විට වැඩි කාලයක් රැකියාව / වෙනත් ආර්ථික කටයුතු සඳහා වැය කරන ගොවිකාරකයන් සංඛ්‍යාව ප්‍රතිශතාත්මකව 60.7% කි. වඩා වැඩි කාලයක් කෘෂිකර්මාන්තයෙහි යෙදී සිටින ගොවි කාරකයන් සංඛ්‍යාව ප්‍රතිශතාත්මකව 15.2% කි. කාලය සඳහන් නොකරන ලද, එහෙත් වෙනත් ආර්ථික කටයුතුවල නිරත ගොවි කාරකයන්ගේ සංඛ්‍යාව ප්‍රතිශතාත්මකව 24.1% කි.

**රූප සටහන 10 - ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් වෙනත් ආර්ථික කටයුත්තක/කටයුතුවල නිරත කාලය අනුව ගොවිකාරකයින් සංඛ්‍යාව - 2014**



## 3.14 : ගාල්ල දිස්ත්‍රික්කයේ ගොවිකාරකයින් සතු වෙනත් දිස්ත්‍රික්කවල පිහිටි බිම් කැබලි සංඛ්‍යාව සහ බිම් ප්‍රමාණය - 2014

ගාල්ල දිස්ත්‍රික්කයෙහි පදිංචි ගොවිකාරකයින්ට අයත් ගාල්ල දිස්ත්‍රික්කයෙහි සහ අනෙකුත් දිස්ත්‍රික්ක වල පිහිටි බිම් කැබලි හා බිම් ප්‍රමාණයන්, බිම් කැබැල්ලේ විශාලත්වය අනුව මෙමගින් විස්තර කරනු ලබයි.

### වගු අංක 3.14 : ගාල්ල දිස්ත්‍රික්කයේ ගොවිකාරකයින් සතු වෙනත් දිස්ත්‍රික්කවල පිහිටි බිම් කැබලි සංඛ්‍යාව සහ බිම් ප්‍රමාණය - 2014

| දිස්ත්‍රික්කය | කැබැල්ලේ විශාලත්වය අනුව බිම් කැබලි සංඛ්‍යාව හා බිම් ප්‍රමාණය | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | අක්කර 1 ට අඩු | | අක්කර 1 -2 අතර | | අක්කර 2-3 අතර | | අක්කර 3-4 අතර | | අක්කර 4-5 අතර | |
| | බිම් කැබලි සංඛ්‍යාව | බිම් ප්‍රමාණය | බිම් කැබලි සංඛ්‍යාව | බිම් ප්‍රමාණය | බිම් කැබලි සංඛ්‍යාව | බිම් ප්‍රමාණය | බිම් කැබලි සංඛ්‍යාව | බිම් ප්‍රමාණය | බිම් කැබලි සංඛ්‍යාව | බිම් ප්‍රමාණය |
| කොළඹ | 21 | 3 | 2 | 2 | 0 | 0 | 0 | 0 | 1 | 4 |
| ගම්පහ | 10 | 2 | 4 | 4 | 1 | 2 | 0 | 0 | 0 | 0 |
| කළුතර | 98 | 37 | 87 | 101 | 50 | 105 | 18 | 56 | 7 | 29 |
| මහනුවර | 39 | 16 | 24 | 29 | 10 | 21 | 0 | 0 | 1 | 4 |
| මාතලේ | 4 | 2 | 1 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| ගාල්ල | 168758 | 63713 | 52507 | 59453 | 10967 | 23361 | 2438 | 7665 | 977 | 4069 |
| මාතර | 246 | 105 | 157 | 185 | 54 | 113 | 18 | 58 | 11 | 45 |
| හම්බන්තොට | 34 | 13 | 18 | 20 | 13 | 27 | 3 | 10 | 2 | 8 |
| යාපනය | 1 | 1 | 1 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| වවුනියාව | - | - | 1 | 1 | - | - | - | - | - | - |
| මඩකලපුව | 7 | 3 | 10 | 12 | 1 | 2 | 0 | 0 | 0 | 0 |
| අම්පාර | 1 | 0 | 1 | 2 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| කුරුණෑගල | 4 | 1 | 3 | 3 | 3 | 7 | 1 | 3 | 0 | 0 |
| පුත්තලම | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| අනුරාධපුරය | 7 | 3 | 7 | 8 | 2 | 5 | 1 | 3 | 0 | 0 |
| පොළොන්නරුව | 4 | 2 | 0 | 0 | 0 | 0 | 1 | 4 | 0 | 0 |
| බදුල්ල | 107 | 47 | 59 | 67 | 11 | 24 | 2 | 6 | 0 | 0 |
| මොණරාගල | 4 | 1 | 4 | 6 | 4 | 9 | 0 | 0 | 1 | 4 |
| රත්නපුර | 116 | 48 | 77 | 85 | 30 | 64 | 10 | 31 | 3 | 12 |
| කෑගල්ල | 8 | 4 | 7 | 8 | 1 | 2 | 0 | 0 | 0 | 0 |
| **එකතුව** | **169,470** | **63,998** | **52,970** | **59,986** | **11,147** | **23,742** | **2,492** | **7,834** | **1,003** | **4,175** |

| දිස්ත්‍රික්කය | කැබැල්ලේ විශාලත්වය අනුව බිම් කැබලි සංඛ්‍යාව හා බිම් ප්‍රමාණය | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | අක්කර 5-10 අතර | | අක්කර 10 -20 අතර | | අක්කර 20-50 අතර | | අක්කර 50 ට වැඩි | | මුළු සංඛ්‍යාව | | |
| | බිම් කැබලි සංඛ්‍යාව | බිම් ප්‍රමාණය | බිම් කැබලි සංඛ්‍යාව | බිම් ප්‍රමාණය | බිම් කැබලි සංඛ්‍යාව | බිම් ප්‍රමාණය | බිම් කැබලි සංඛ්‍යාව | බිම් ප්‍රමාණය | බිම් කැබලි සංඛ්‍යාව | බිම් ප්‍රමාණය | % |
| කොළඹ | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 24 | 9 | **0.0** |
| ගම්පහ | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 15 | 8 | **0.0** |
| කළුතර | 19 | 105 | 5 | 65 | 1 | 47 | 0 | 0 | 285 | 545 | **0.3** |
| මහනුවර | 1 | 5 | 3 | 48 | 0 | 0 | 0 | 0 | 78 | 122 | **0.1** |
| මාතලේ | 0 | 0 | 1 | 19 | 1 | 45 | 0 | 0 | 7 | 67 | **0.0** |
| ගාල්ල | 1629 | 10154 | 435 | 5464 | 31 | 869 | 0 | 0 | 237742 | 174,746 | **98.7** |
| මාතර | 19 | 121 | 10 | 122 | 3 | 80 | 0 | 0 | 518 | 828 | **0.5** |
| හම්බන්තොට | 4 | 21 | 2 | 24 | 0 | 0 | 0 | 0 | 76 | 122 | **0.1** |
| යාපනය | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 2 | 2 | **0.0** |
| වවුනියාව | - | - | - | - | - | - | - | - | 1 | 1 | **0.0** |
| මඩකලපුව | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 18 | 17 | **0.0** |
| අම්පාර | 1 | 5 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 3 | 7 | **0.0** |
| කුරුණෑගල | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 11 | 14 | **0.0** |
| පුත්තලම | 1 | 5 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 2 | 5 | **0.0** |
| අනුරාධපුරය | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 17 | 18 | **0.0** |
| පොළොන්නරුව | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 5 | 6 | **0.0** |
| බදුල්ල | 4 | 26 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 183 | 170 | **0.1** |
| මොණරාගල | 3 | 19 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 16 | 39 | **0.0** |
| රත්නපුර | 8 | 54 | 1 | 14 | 0 | 0 | 1 | 50 | 246 | 357 | **0.2** |
| කෑගල්ල | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 16 | 14 | **0.0** |
| **එකතුව** | **1,689** | **10,515** | **457** | **5,755** | **36** | **1,040** | **1** | **50** | **239,265** | **177,095** | **100.0** |

ගාල්ල දිස්ත්‍රික්කයෙහි පදිංචි ගොවිකාරකයින්ට අයත් ගාල්ල සහ අනෙකුත් දිස්ත්‍රික්ක වල පිහිටි මුළු බිම් කැබලි ගණන 265,239 ක් වන අතර එම බිම් ප්‍රමාණය අක්කර 177,095 කි. එම මුළු බිම් කැබලි ප්‍රමාණයෙන් වැඩිම බිම් කැබලි ගණන (237,742 ) හා එම මුළු බිම් ප්‍රමාණයෙන් වැඩිම බිම් ප්‍රමාණය (අක්කර 174,746 ) ගාල්ල දිස්ත්‍රික්කයෙහි පිහිටා ඇති බවට වාර්තා වේ. එහි ප්‍රතිශත සැලකූ විට පිළිවෙලින් එය 99.3% ක් හා 98.7 % කි.

ගාල්ල දිස්ත්‍රික්කයේ පදිංචි ගොවිකාරකයන් සතු වෙනත් දිස්ත්‍රික්කවල ඇති බිම් කැබලි ප්‍රමාණය 1,537 ක් වන අතර එහි බිම් ප්‍රමාණය අක්කර 2,349 ක් වේ. මාතර, කළුතර, රත්නපුර, බදුල්ල, මහනුවර සහ හම්බන්තොට යන දිස්ත්‍රික්කවල බිම් කැබලි පිළිවෙලින් 518, 285, 246, 183, 78 සහ 76 ලෙස වන අතර බිම් ප්‍රමාණය පිළිවෙලින් අක්කර 828, 545, 357, 170, 122 හා 122 ලෙස දැක්විය හැකිය.

ගාල්ල දිස්ත්‍රික්කයේ පදිංචි ගොවිකාරකයන් සතු වෙනත් දිස්ත්‍රික්කවල ඇති බිම් කැබලි සංඛ්‍යාව හා බිම් ප්‍රමාණ පිළිබඳ සැලකීමේදී අක්කර 1 ට අඩු බිම් ප්‍රමාණය යටතේ බිම් කැබලි 712 ක් හා බිම් ප්‍රමාණය අක්කර 285, අක්කර 1-2 අතර බිම් කැබලි 463 ක් හා බිම් ප්‍රමාණය අක්කර 533, අක්කර 2-3 අතර බිම් කැබලි 180 ක් හා බිම් ප්‍රමාණය අක්කර 381, අක්කර 3-4 අතර බිම් කැබලි 54 ක් හා බිම් ප්‍රමාණය අක්කර 169, අක්කර 4-5 අතර බිම් කැබලි 26 ක් හා බිම් ප්‍රමාණය අක්කර 106, අක්කර 5-10 අතර බිම් කැබලි 60 ක් හා බිම් ප්‍රමාණය අක්කර 361, අක්කර 10-20 අතර බිම් කැබලි 22 ක් හා බිම් ප්‍රමාණය අක්කර 291, අක්කර 20-50 අතර බිම් කැබලි 5 ක් හා බිම් ප්‍රමාණය අක්කර 171 සහ අක්කර 50 ට වැඩි යටතේ එක් බිම් කැබල්ලක් හා බිම් ප්‍රමාණය අක්කර 50 ලෙසට වාර්තාවී ඇත.

## 3.15 : ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් බිම් කැබලි ගණන අනුව ගොවිකාණ්ඩ සංඛ්‍යාව - 2014

ගාල්ල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් බිම් කැබලි ගණන අනුව ගොවි කාණ්ඩ සංඛ්‍යාව මෙමගින් පෙන්නුම් කරයි.

**වගු අංක 3.15: ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් බිම් කැබලි ගණන අනුව ගොවිකාණ්ඩ සංඛ්‍යාව - 2014**

| ප්‍රා.ලේ.කොට්ඨාසය | බිම් කැබලිවල හිමිකාරීත්වය අනුව ගොවිකාරකයන් සංඛ්‍යාව | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | කැබලි 1 | කැබලි 2 | කැබලි 3 | කැබලි 4 | කැබලි 5 | කැබලි 6 | කැබලි 7 | කැබලි 8 | කැබලි 9 | කැබලි 10 හෝ ඊට වැඩි | මුළු ගණන |
| බෙන්තොට | 2930 | 1541 | 587 | 205 | 81 | 44 | 21 | 12 | 1 | 3 | **5425** |
| බලපිටිය | 3320 | 1169 | 332 | 122 | 43 | 21 | 7 | 4 | 5 | 1 | **5024** |
| කරණ්දෙනිය | 6552 | 3854 | 1500 | 488 | 197 | 57 | 19 | 9 | 5 | 2 | **12683** |
| ඇල්පිටිය | 4913 | 3837 | 1886 | 845 | 365 | 152 | 67 | 40 | 21 | 23 | **12149** |
| නියාගම | 3051 | 2390 | 1413 | 645 | 236 | 127 | 62 | 30 | 9 | 9 | **7972** |
| තවලම | 3833 | 2441 | 903 | 376 | 157 | 68 | 43 | 27 | 20 | 22 | **7890** |
| නෙලුව | 2919 | 2176 | 873 | 366 | 140 | 53 | 18 | 11 | 5 | 5 | **6566** |
| නාගොඩ | 5794 | 3333 | 1364 | 542 | 244 | 112 | 53 | 29 | 20 | 17 | **11508** |
| බද්දේගම | 4294 | 3498 | 1531 | 636 | 325 | 118 | 62 | 39 | 16 | 39 | **10558** |
| වැලිවිටිය- දිවිතුර | 2893 | 1659 | 667 | 223 | 112 | 40 | 20 | 13 | 8 | 12 | **5647** |
| අම්බලන්ගොඩ | 3027 | 1543 | 506 | 177 | 53 | 28 | 14 | 5 | 3 | 2 | **5358** |
| ගෝනපීනුවල | 1081 | 662 | 263 | 87 | 31 | 25 | 7 | 6 | 1 | 1 | **2164** |
| හික්කඩුව | 3040 | 1605 | 504 | 160 | 67 | 30 | 16 | 6 | 1 | 6 | **5435** |
| කඩවත්සතර | 867 | 441 | 120 | 38 | 14 | 7 | 3 | 1 | 0 | 1 | **1492** |
| බොපේ පෝද්දල | 1170 | 905 | 290 | 86 | 39 | 4 | 5 | 0 | 1 | 1 | **2501** |
| අක්මීමන | 3836 | 1920 | 557 | 188 | 68 | 34 | 20 | 6 | 4 | 12 | **6645** |
| යක්කලමුල්ල | 4951 | 2980 | 1103 | 373 | 147 | 69 | 24 | 15 | 5 | 9 | **9676** |
| ඉමදූව | 2939 | 1764 | 649 | 274 | 118 | 75 | 48 | 23 | 11 | 29 | **5930** |
| හබරාදූව | 2283 | 1020 | 339 | 118 | 52 | 32 | 9 | 8 | 4 | 2 | **3867** |
| **එකතුව** | **63693** | **38738** | **15387** | **5949** | **2489** | **1096** | **518** | **284** | **140** | **196** | **128490** |

ගාල්ල දිස්ත්‍රික්කයේ බහුතරයක් ගොවිකාණ්ඩ හිමිකම් කියනු ලබන බිම් කැබලි ගණන එකකි. එම ගොවිකාණ්ඩ සංඛ්‍යාව 63,693 වේ. බිම් කැබලි ගණන 1ක් සහිත ගොවිකාණ්ඩ වැඩි සංඛ්‍යාවක් කරණ්දෙනිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් වාර්තා වන අතර එම සංඛ්‍යාව 6,552 වේ .

ඉඩම් කැබලි දෙකකට හිමිකම් කියනු ලබන ගොවිකාණ්ඩ සංඛ්‍යාව 38,738 කි. කැබලි දෙකක් යටතේ වැඩි ගොවිකාණ්ඩ සංඛ්‍යාවක් කරණ්දෙනිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් වාර්තා වේ. එම සංඛ්‍යාව 3,854 කි.

බිම් කැබලි ගණන 3 ට හිමිකම් ඇති ගොවිකාණ්ඩ සංඛ්‍යාව 15,387 ක් වන අතර එයින් වැඩිම සංඛ්‍යාව (1,886) ඇල්පිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් වාර්තා වී ඇත.

බිම් කැබලි ගණන 4, 5, 6 සහ 7හෝ ඊට වැඩි ගණනකට හිමිකම් ඇති ගොවිකාණ්ඩ සංඛ්‍යාව පිළිවෙලින් 5,949, 2,489, 1,096 සහ 1,138 වේ. බිම් කැබලි ගණන 4 , 5, සහ 6 ට හිමිකම් කියනු ලබන ගොවි කාණ්ඩ වැඩිම සංඛ්‍යාවක් ඇල්පිටිය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයෙන් වාර්තා වන අතර එම සංඛ්‍යා පිළිවෙලින් 845, 365, 152 හා 299 වේ. බිම් කැබලි ගණන 7හෝ ඊට වැඩි ගණනකට හිමිකම් කියනු ලබන ගොවිකාරකයින් වැඩිම ගණනක් (156) බද්දේගම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයෙන් වාර්තා වේ .

## 3.16 : ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ගොවි කාණ්ඩ වලට අයත් බිම් ප්‍රමාණයෙහි විශාලත්වය අනුව ගොවිකාණ්ඩ සංඛ්‍යාව හා බිම් ප්‍රමාණය (අක්කර) – 2014

ගාල්ල දිස්ත්‍රික්කයෙහි ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස මට්ටමින් ගොවි කාණ්ඩ වලට අයත් බිම් ප්‍රමාණයෙහි විශාලත්වය අනුව ගොවි කාණ්ඩ සංඛ්‍යාව හා බිම් ප්‍රමාණයන් පිළිබඳව මෙමගින් විස්තර කරනු ලබයි.

**වගු අංක 3.16 : ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ගොවි කාණ්ඩ වලට අයත් බිම් ප්‍රමාණයෙහි විශාලත්වය අනුව ගොවි කාණ්ඩ සංඛ්‍යාව හා බිම් ප්‍රමාණය (අක්කර) – 2014**

| ප්‍රා.ලේ.කොට්ඨාසය | බිම් කැබලි ගණන හා බිම් ප්‍රමාණය (අක්කර) | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | අක්කර 1ට අඩු | | අක්කර 1-2 අතර | | අක්කර 2-3 අතර | | අක්කර 3-4 අතර | | අක්කර 4-5 අතර | |
| | ගොවි කාණ්ඩ සංඛ්‍යාව | බිම් ප්‍රමාණය අක්කර | ගොවි කාණ්ඩ සංඛ්‍යාව | බිම් ප්‍රමාණය අක්කර | ගොවි කාණ්ඩ සංඛ්‍යාව | බිම් ප්‍රමාණය අක්කර | ගොවි කාණ්ඩ සංඛ්‍යාව | බිම් ප්‍රමාණය අක්කර | ගොවි කාණ්ඩ සංඛ්‍යාව | බිම් ප්‍රමාණය අක්කර |
| බෙන්තොට | 2,904 | 1,405 | 1,468 | 1,889 | 516 | 1,175 | 229 | 760 | 102 | 446 |
| බලපිටිය | 3,414 | 1,455 | 941 | 1,186 | 281 | 642 | 139 | 459 | 79 | 346 |
| කරණ්දෙනිය | 7,829 | 3,356 | 3,115 | 3,998 | 999 | 2,296 | 365 | 1,206 | 161 | 698 |
| ඇල්පිටිය | 5,587 | 2,710 | 3,679 | 4,833 | 1,567 | 3,644 | 625 | 2,090 | 281 | 1,217 |
| නියාගම | 2,800 | 1,446 | 2,650 | 3,458 | 1,263 | 2,891 | 579 | 1,914 | 282 | 1,215 |
| තවලම | 2,352 | 1,264 | 2,771 | 3,516 | 1,601 | 3,704 | 570 | 1,885 | 260 | 1,121 |
| නෙලුව | 1,521 | 854 | 2,444 | 3,134 | 1,389 | 3,143 | 593 | 1,938 | 259 | 1,104 |
| නාගොඩ | 6,001 | 2,915 | 3,460 | 4,402 | 1,110 | 2,563 | 438 | 1,461 | 189 | 819 |
| බද්දේගම | 5,505 | 2,733 | 2,741 | 3,604 | 1,125 | 2,626 | 505 | 1,692 | 235 | 1,019 |
| වැලිවිටිය- දිවිතුර | 3,332 | 1,467 | 1,405 | 1,819 | 498 | 1,149 | 181 | 596 | 90 | 390 |
| අම්බලන්ගොඩ | 3,779 | 1,501 | 905 | 1,181 | 288 | 660 | 142 | 476 | 73 | 317 |
| ගෝනපිනුවල | 1,353 | 607 | 456 | 603 | 154 | 361 | 65 | 216 | 29 | 129 |
| හික්කඩුව | 3,627 | 1,656 | 1,129 | 1,455 | 318 | 733 | 144 | 476 | 69 | 297 |
| කඩවත්සතර | 884 | 384 | 286 | 362 | 129 | 297 | 56 | 184 | 30 | 130 |
| බොපේ පෝද්දල | **1,445** | **706** | **550** | **722** | **196** | 453 | **101** | 339 | **60** | 261 |
| **අක්මීමන** | **3647** | **1724** | **1847** | **2324** | **627** | **1431** | **226** | **746** | **118** | **502** |
| යක්කලමුල්ල | 4,526 | 2,257 | 3,311 | 4,211 | 1,083 | 2,460 | 354 | 1,173 | 148 | 641 |
| ඉමදුව | 3,081 | 1,558 | 1,698 | 2,193 | 588 | 1,368 | 248 | 831 | 106 | 466 |
| හබරාදුව | **2,356** | **1,132** | **863** | **1,093** | **295** | 675 | **138** | 451 | **79** | 346 |
| **එකතුව** | **65,943** | **31,132** | **35,719** | **45,984** | **14,027** | **32,271** | **5,698** | **18,894** | **2,650** | **11,464** |

| ප්‍රා.ලේ.කොට්ඨාසය | බිම් කැබලි ගණන හා බිම් ප්‍රමාණය (අක්කර) | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | අක්කර 5-10 අතර | | අක්කර 10-20 අතර | | අක්කර 20-50 අතර | | අක්කර 50 ට වැඩි | | මුළු සංඛ්‍යාව | |
| | ගොවි කාණ්ඩ සංඛ්‍යාව | බිම් ප්‍රමාණය අක්කර | ගොවි කාණ්ඩ සංඛ්‍යාව | බිම් ප්‍රමාණය අක්කර | ගොවි කාණ්ඩ සංඛ්‍යාව | බිම් ප්‍රමාණය අක්කර | ගොවි කාණ්ඩ සංඛ්‍යාව | බිම් ප්‍රමාණය අක්කර | ගොවි කාණ්ඩ සංඛ්‍යාව | බිම් ප්‍රමාණය අක්කර |
| බෙන්තොට | 155 | 997 | 38 | 531 | 11 | 294 | 2 | 14 | 5,425 | 7,598 |
| බලපිටිය | 127 | 827 | 34 | 469 | 8 | 199 | 1 | 7 | 5,024 | 5,637 |
| කරණ්දෙනිය | 177 | 1,128 | 34 | 421 | 2 | 65 | 1 | 7 | 12,683 | 13,224 |
| ඇල්පිටිය | 329 | 2,100 | 74 | 936 | 7 | 168 | - | - | 12,149 | 17,698 |
| නියාගම | 334 | 2,129 | 57 | 741 | 7 | 184 | - | - | 7,972 | 13,978 |
| තවලම | 281 | 1,771 | 43 | 555 | 11 | 321 | 1 | 8 | 7,890 | 14,195 |
| නෙලුව | 307 | 1,957 | 50 | 658 | 3 | 72 | - | - | 6,566 | 12,860 |
| නාගොඩ | 240 | 1,590 | 63 | 812 | 6 | 207 | 1 | 11 | 11,508 | 14,845 |
| බද්දේගම | 345 | 2,258 | 94 | 1,202 | 8 | 211 | - | - | 10,558 | 15,346 |
| වැලිවිටිය- දිවිතුර | 114 | 729 | 25 | 329 | 2 | 53 | - | - | 5,647 | 6,533 |
| අම්බලන්ගොඩ | 118 | 779 | 40 | 539 | 13 | 330 | - | - | 5,358 | 5,783 |
| ගෝනපිනුවල | 76 | 510 | 26 | 350 | 5 | 154 | - | - | 2,164 | 2,929 |
| හික්කඩුව | 102 | 674 | 39 | 517 | 7 | 193 | - | - | 5,435 | 6,000 |
| කඩවත්සතර | 64 | 414 | 34 | 472 | 8 | 237 | 1 | 7 | 1,492 | 2,530 |
| බොපේ පෝද්දල | **115** | **743** | **31** | **422** | **3** | 114 | **-** | - | **2,501** | 3,761 |
| **අක්මීමන** | **134** | **876** | **40** | **514** | **6** | **141** | **0** | **0** | **6645** | **8260** |
| යක්කලමුල්ල | 207 | 1,319 | 41 | 550 | 6 | 185 | - | - | 9,676 | 12,796 |
| ඉමදුව | 163 | 1,052 | 35 | 465 | 11 | 291 | - | - | 5,930 | 8,224 |
| හබරාදුව | **103** | **671** | **28** | **384** | **5** | 148 | **-** | - | **3,867** | 4,899 |
| **එකතුව** | **3,491** | **22,524** | **826** | **10,867** | **129** | **3,566** | **7** | **54** | **128,490** | **177,095** |

ගාල්ල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස සලකා බැලූ විට අක්කරයට අඩු බිම් ප්‍රමාණයක් යටතේ ඇති ගොවි කාණ්ඩ සංඛ්‍යාව 65,943 ක් වන අතර ඊට අයත් බිම් ප්‍රමාණය අක්කර 31,132 කි. ඉන් වැඩිම ගොවි කාණ්ඩ සංඛ්‍යාව වාර්තා වන්නේ කරණ්දෙනිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙනි. එම ගොවි කාණ්ඩ සංඛ්‍යාව 7,829 ක් වන අතර ඊට අයත් බිම් ප්‍රමාණය අක්කර 3,356 කි. එය අක්කරයට අඩු බිම් ප්‍රමාණය යටතේ ඇති මුලු බිම් ප්‍රමාණයෙන් 10.7% ක ප්‍රතිශතයකි.

එසේම අක්කර 1-2 අතර බිම් ප්‍රමාණයක් යටතේ ඇති ගොවි කාණ්ඩ ප්‍රමාණය 35,719 ක් වන අතර එම බිම් ප්‍රමාණය අක්කර 45,984 කි. ඉන් වැඩිම ගොවි කාණ්ඩ සංඛ්‍යාව වාර්තා වන්නේ ඇල්පිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙනි. එම ගොවි කාණ්ඩ සංඛ්‍යාව 3,679 ක් වන අතර ඊට අයත් බිම් ප්‍රමාණය අක්කර 4,833 කි . එය අක්කර 1-2 අතර බිම් ප්‍රමාණය යටතේ ඇති මුලු බිම් ප්‍රමාණයෙන් 10.5% ක ප්‍රතිශතයකි.

අක්කර 2-3 අතර බිම් ප්‍රමාණයක් යටතේ ඇති ගොවි කාණ්ඩ ප්‍රමාණය 14,027 ක් වන අතර එම බිම් ප්‍රමාණය අක්කර 32,271 කි. ඉන් වැඩිම ගොවි කාණ්ඩ සංඛ්‍යාව වාර්තා වන්නේ තවලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙනි. එම ගොවි කාණ්ඩ සංඛ්‍යාව 1,601 ක් වන අතර ඊට අයත් බිම් ප්‍රමාණය අක්කර 3,704 කි . එය අක්කර 2-3 අතර බිම් ප්‍රමාණය යටතේ ඇති මුලු බිම් ප්‍රමාණයෙන් 11.4% ක ප්‍රතිශතයකි.

අක්කර 3-4 අතර බිම් ප්‍රමාණයක් යටතේ ඇති ගොවි කාණ්ඩ ප්‍රමාණය 5,698 ක් වන අතර එම බිම් ප්‍රමාණය අක්කර 18,894 කි. ඉන් වැඩිම ගොවි කාණ්ඩ සංඛ්‍යාව වාර්තා වන්නේ ඇල්පිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙනි. එම ගොවි කාණ්ඩ සංඛ්‍යාව 625 වන අතර ඊට අයත් බිම් ප්‍රමාණය අක්කර 2,090 කි . එය අක්කර 3-4 අතර බිම් ප්‍රමාණය යටතේ ඇති මුලු බිම් ප්‍රමාණයෙන් 11% ක ප්‍රතිශතයකි.

අක්කර 4-5 අතර බිම් ප්‍රමාණයක් යටතේ ඇති ගොවි කාණ්ඩ ප්‍රමාණය 2,650 ක් වන අතර එම බිම් ප්‍රමාණය අක්කර 11,464 කි. ඉන් වැඩිම ගොවි කාණ්ඩ සංඛ්‍යාව වාර්තා වන්නේ නියාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙනි. එම ගොවි කාණ්ඩ සංඛ්‍යාව 282 ක් වන අතර ඊට අයත් බිම් ප්‍රමාණය අක්කර 1,215 කි . එය අක්කර 4-5 අතර බිම් ප්‍රමාණය යටතේ ඇති මුලු බිම් ප්‍රමාණයෙන් 10.6% ක ප්‍රතිශතයකි.

අක්කර 5-10 අතර බිම් ප්‍රමාණයක් යටතේ ඇති ගොවි කාණ්ඩ ප්‍රමාණය 3,491ක් වන අතර එම බිම් ප්‍රමාණය අක්කර 22,524 කි. ඉන් වැඩිම ගොවි කාණ්ඩ සංඛ්‍යාව වාර්තා වන්නේ බද්දේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙනි. එම ගොවි කාණ්ඩ සංඛ්‍යාව 345 ක් වන අතර ඊට අයත් බිම් ප්‍රමාණය අක්කර 2,258 කි . එය අක්කර 5-10 අතර බිම් ප්‍රමාණය යටතේ ඇති මුලු බිම් ප්‍රමාණයෙන් 10% ක ප්‍රතිශතයකි.

අක්කර 10-20 අතර බිම් ප්‍රමාණයක් යටතේ ඇති ගොවි කාණ්ඩ ප්‍රමාණය 826ක් වන අතර එම බිම් ප්‍රමාණය අක්කර 10,867 කි. ඉන් වැඩිම ගොවි කාණ්ඩ සංඛ්‍යාව වාර්තා වන්නේ බද්දේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙනි. එම ගොවි කාණ්ඩ සංඛ්‍යාව 94ක් වන අතර ඊට අයත් බිම් ප්‍රමාණය අක්කර 1,202 කි. එය අක්කර 10-20 අතර බිම් ප්‍රමාණය යටතේ ඇති මුලු බිම් ප්‍රමාණයෙන් 11% ක ප්‍රතිශතයකි.

අක්කර 20 ට වැඩි බිම් ප්‍රමාණයක් යටතේ ඇති ගොවි කාණ්ඩ ප්‍රමාණය 136 ක් වන අතර එම බිම් ප්‍රමාණය අක්කර 3,620 කි. ඉන් වැඩිම ගොවි කාණ්ඩ සංඛ්‍යාව වාර්තා වන්නේ බෙන්තොට හා අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසන් වලිනි. එම ගොවි කාණ්ඩ සංඛ්‍යාව 13 ක් වන අතර ඊට අයත් බිම් ප්‍රමාණයන් පිළිවෙලින් අක්කර 308 හා අක්කර 330 කි . එය අක්කර 20 ට වැඩි බිම් ප්‍රමාණය යටතේ ඇති මුලු බිම් ප්‍රමාණයෙන් 17.6% ක ප්‍රතිශතයකි.